# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
# ஓய்வூதியத் திணைக்களம்
# Department of Pensions

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

## වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්
## வருடாந்த செயற்பாட்டு அறிக்கை மற்றும் கணக்குகள்
## ANNUAL PERFORMANCE REPORT & ACCOUNTS

# 2016

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| විවරණය | | 1 |
| 01. | දෙපාර්තමේන්තු මෙහෙයුම් ක්‍රියාවලිය ප්‍රතිනිර්මාණය | 3-6 |
| 02. | ලියාපදිංචි ක්‍රියාවලිය | 7-12 |
| 2.1 | විශ්‍රාම වැටුප් ලියාපදිංචි ක්‍රියාවලිය | 7 |
| 2.2. | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වීම | 9 |
| 2.2.1 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ලියාපදිංචිය | 11 |
| 2.3 | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ක්‍රමයේ ලියාපදිංචිය | 12 |
| 03. | ප්‍රථම ගෙවීම් ක්‍රියාවලිය | 13-20 |
| 3.1 | සත්කාර පියස | 13 |
| 3.2 | විශ්‍රාම වැටුප් ප්‍රථම ගෙවීම | 14 |
| 3.3 | වැන්දඹු හා අනත්දරු ප්‍රථම ගෙවීම් ක්‍රියාවලිය | 17 |
| 3.3.1 | වැන්දඹු හා වැන්දඹු පුරුෂ ප්‍රථම ගෙවීම | 18 |
| 3.3.2 | අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රථම ගෙවීම | 18 |
| 3.3.3 | ආබාධිත විශ්‍රාම වැටුප් ප්‍රථම ගෙවීම | 19 |
| 3.3.4 | කලත්‍රයාගේ නැවත විවාහ සඳහා ප්‍රථම ගෙවීම | 19 |
| 04. | එක්වරක් පමණක් ගෙවන ප්‍රතිලාභ නියාමනය | 21-27 |
| 4.1 | දායකත්ව ප්‍රතිලාභ ගෙවීම | 21 |
| 4.1.1 | වැන්දඹු හා අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම | 22 |
| 4.1.2 | රාජ්‍යසේවා අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම | 23 |
| 4.2 | එක් වරක් ගෙවන රාජ්‍ය ප්‍රදානයන් නියාමනය | 24 |
| 05. | විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම් නියාමනය | 28-29 |

| | | |
|---|---|---|
| 06. | සමුච්චිත ලැබීම් නියාමනය | 30-33 |
| 6.1 | වැන්දඹු හා අනත්දරු දායක මුදල් ලැබීම් නියාමනය | 30 |
| 6.2 | රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ලැබීම් නියාමනය | 31 |
| 6.3 | ගොඩනැගිලි කුලී ආදායම් | 31 |
| 6.4 | නිවාඩු නිකේතන ආදායම් | 32 |
| 07. | අභ්‍යන්තර විගණනය | 34 |
| 08. | ප්‍රතිපත්තිමය තීරණ යාවත් කාලීන කිරීම | 35-36 |
| 09. | විශ්‍රාමිකයන් වෙනුවෙන් ලබා දෙන වෙනත් ප්‍රතිලාභ | 37-46 |
| 9.1 | බාහිර ආයතන පුහුණු කිරීම | 37 |
| 9.2 | ණය පහසුකම් ලබා දීම | 38 |
| 9.3 | දුම්රිය බලපත්‍ර මාර්ගගත ක්‍රමයට ලබා දීමේ ක්‍රියාවලිය | 39 |
| 9.4 | අග්‍රහාර ප්‍රදානය | 40 |
| 9.5 | පෞද්ගලික ආයතන සම්බන්ධ කිරීම | 42 |
| 9.6 | කැළණිය සහ රම්බොඩ නිවාඩු නිකේතන නවීකරණය කිරීම | 43 |
| 9.7 | විශ්‍රාම වෙබ් සඟරාව | 44 |
| 9.8 | විශ්‍රාම රේඩියෝව | 45 |
| 10. | මානව සම්පත් කළමනාකරණය | 47-51 |
| 10.1 | අභ්‍යන්තර පුහුණු | 47 |
| 10.2 | විදෙස් පුහුණු අවස්ථා කළමනාකරණය | 49 |
| 10.3 | බක්මහ උළෙල | 50 |
| 11. | ජාතික විශ්‍රාමික දිනය | 52-53 |
| 12. | ඵලදායිතා සංකල්ප ක්‍රියාත්මක කිරීම | 54-55 |
| 13. | මූල්‍ය සමාලෝචනය | 56-62 |

13.1 විශ්‍රාමික පාරිතෝෂික ගෙවීම 57

13.2 මාසික විශ්‍රාම වැටුප් ගෙවීම 59

13.3 ගෙවීම් සාරාංශය 61

14. මූලාශ්‍ර ප්‍රකාශන 63-77

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

## දැක්ම

ආර්ථික හා සාමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක්

## මෙහෙවර

රාජ්‍ය සේවා විශ්‍රාමිකයන් හා ඔවුන්ගේ ප්‍රතිලාභීන් සඳහා තොරතුරු තාක්ෂණය හා තිරසාර කළමනාකරණ ක්‍රමවේද භාවිතයෙන් ද, පෞද්ගලික හා රාජ්‍ය අංශ මුහුවෙන් ඉහළ සේවාලාභී හා සේවාදායක තෘප්තිය තහවුරු කරමින් නෛතික ප්‍රතිලාභයන් පිළිගැන්වීම

## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව - අනුමත කාර්ය මණ්ඩලය

| තනතුරේ ස්වභාවය | තනතුර | අදාළ වන සේවය | වැටුප් ක්‍රමය | අනුමත මුළු තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | SLAS (Special) | SL 3 | 01 | 01 | 00 |
| | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ | SLAS (Class I) | SL 1 | 03 | 02 | 01 |
| | ප්‍රධාන ගණකාධිකාරී | SLAcS(Class I) | SL 1 | 01 | 01 | 00 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | SLAS (Class II or III) | SL 3 | 07 | 09 | 00 |
| | ගණකාධිකාරී | SLAcS(Class II or III) | SL 4 | 09 | 08 | 01 |
| | නි.අ/ස.අ. | SLICT Service II/ III | SL 5 | 01 | 00 | 01 |
| | නීති නිලධාරී | Dept | SL 6 | 01 | 00 | 01 |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරී | PMAS (Supra) | MN 7 | 04 | 01 | 03 |
| | භාෂා පරිවර්තක | TS | MN 6 | 02 | 02 | 00 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | SLICT Service | MN 6 | 05 | 02 | 03 |
| ද්විතීය මට්ටම | අයවැය සහකාර | Related Service | MN 4 | 01 | 01 | 00 |
| | විශ්‍රාම වැටුප් නිලධාරී | Related Service | MN 4 | 340 | 300 | 40 |
| | කාර්මික නිලධාරි | SLTS | MN 3 | 01 | 00 | 01 |
| | රාජ්‍ය කළමනාකරණ සහකාර | PMAS | MN 2 | 190 | 110 | 80 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | SLICT Service | MT 1 | 05 | 01 | 04 |
| | සංවර්ධන නිලධාරි | D/O | MN 4 | 398 | 365 | 33 |
| | ලේඛන සහකාර | Dept | MN 1 | 141 | 130 | 11 |
| ප්‍රාථමික මට්ටම | බංගලා භාරකරු | Dept | PL 1 | 02 | 02 | 00 |
| | අරක්කැමි/උද්‍යාන කම්කරු | Dept | PL 2 | 04 | 04 | 00 |
| | රියදුරු | D/S | PL 3 | 12 | 08 | 04 |
| | කාර්යාල කාර්ය සහයක | KKS | PL 1 | 56 | 37 | 13 |
| | විදුලි කාර්මික | Dept | PL 3 | 01 | 00 | 01 |
| **එකතුව** | | | | **1185** | **984** | **197** |

# සංවිධාන සටහන




වි.වැ.නි - විශ්‍රාම වැටුප් නිලධාරී
අ.ස - අයවැය සහකාර
ලේ.ස - ලේඛණ සහකාර
කා.සේ.සේ. - කාර්යාල සේවක සේවය

ස.නි - සංවර්ධන නිලධාරී
රා.ක.ස - රාජ්‍ය කළමනාකරණ සහකාර
තො.තා.නි. - තොරතුරු තාක්ෂණ නිලධාරී
බ.භා. - බංගලා භාරකරු

## විවරණය

වසර 1934 පෙබරවාරි 05 දින ස්ථාපිත වූ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ කලින් කලට සිදුකරන ලද සංශෝධනයන්ට යටත්ව දැනට 1972 මැයි 05 වැනි දින සංශෝධිත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව ප්‍රකාරව විශ්‍රාම වැටුප් ගෙවීම ශ්‍රී ලංකා රජයේ නීතියේ කොටසක් බවට පත්ව තිබේ.එමෙන් ම 1898 අංක 01 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත හා 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් පනත හඳුන්වා දීම සිදුවේ. 1981 අංක 44 දරණ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් සංශෝධන පනත යටතේ ආබාධිත විශ්‍රාම වැටුප් ක්‍රමය ද හඳුන්වා දෙන ලදි. මේ සියලු ම සංශෝධනයන්ට යටත්ව 2010 අංක 08 හා 09 දරණ සංශෝධනයන් බලපැවැත්වෙන පරිදි වැන්දඹු, වැන්දඹු පුරුෂ අනත්දරු හා ආබාධිත යන විශ්‍රාම වැටුප් ක්‍රම ශ්‍රී ලංකාව තුළ නෛතිකව ස්ථාපිත වන්නේ ය. තවද 1942 අංක 18 දරණ ආඥා පනත ප්‍රකාරව නෛතිකව ක්‍රියාත්මක වන රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල යන විෂය ත්‍රිත්වයට අදාල ප්‍රතිලාභීන් වෙත ගෙවීම් ක්‍රියාවලිය නියාමනය කිරීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ වගකීම වේ.

වසර 1970-12-23 දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ වන "ඒ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත වන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, 2016 වසර අවසන් වන විට පන්ලක්ෂ හැත්තැපන්දහසක විශ්‍රාමික ප්‍රජාවක් වෙත සේවා සපයමින් ඔවුන් සමාජීය හා ආර්ථිකමය වශයෙන් තෘප්තිමත් කරනු වස් දැවැන්ත ක්‍රියාන්විතයක නිරතව සිටී. රජයේ ස්ථිර, අනියම්, තාවකාලික, ආදේශක ආදී පත්වීම් ලාභීන්, ත්‍රිවිධ හමුදා සාමාජිකයන්, අමාත්‍ය කාර්ය මණ්ඩල සහායක, වැන්දඹු අනත්දරු, වැන්දඹු පුරුෂ සහ අනත්දරු, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පවත්වා ගනිමින් සාමාජිකයන් ලක්ෂ 12කට අධික සමස්තයක් සමග අඛණ්ඩ සම්බන්ධතාවක් පවත්වා ගෙන යනු ලැබේ. විශ්‍රාමික ප්‍රජාව හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් උදෙසා කඩිනම් හා ගුණාත්මක සේවාවක් ලබාදීම සඳහා අනෙකුත් රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය හා නවීන තොරතුරු තාක්ෂණය සම්බන්ධ කර ගනිමින් 2016 වසර තුළ ජාතික මට්ටමේ ජයග්‍රහණ හා ඇගයීම්වලට පාත්‍ර වීමටත් සුවිශේෂයෙන් සමස්ත විශ්‍රාමික ප්‍රජාවගේ විශ්වාසය දිනාගැනීමටත් හැකි වීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ලද නොමිනිය හැකි ජයග්‍රහණයකි.

තවදුරටත් පෞද්ගලික අංශයේ දායකත්වය විශ්‍රාමික ප්‍රජාව වෙත ළඟා කරමින් ඔවුන්ගේ ආර්ථික ජීවිතය වඩාත් ශක්තිමත් කිරීම උදෙසා වූ විවිධ ණය යෝජනා ක්‍රම, වට්ටම් සහිත භාණ්ඩ හා සේවා පහසුකම් මෙන් ම ආර්ථික වශයෙන් ස්වයං නැගීසිටීමක් උදෙසා වූ උපදේශනයන් ද, විශ්‍රාමික ප්‍රජාව වෙත සැපයීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට මේ වසර තුළ හැකියාව ලැබුණි.

එමෙන් ම ආයතනික වශයෙන් භෞතික සංවර්ධන ක්‍රියාවලිය තුළ විශ්‍රාමික ප්‍රජාවටත් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයටත් වඩාත්

සඵලදායී සේවා වටපිටාවක් ඇති කිරීම උදෙසා වූ සංවර්ධනයන් මෙන් ම විශේෂයෙන් විශ්‍රාමික ප්‍රජාව හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ විශ්‍රාම සුව උදෙසා වන නිවාඩු නිකේතන පහසුකම් වැඩි දියුණු කරමින් විශ්‍රාමික ප්‍රජාව වෙත විශ්‍රාම වැටුපෙන් ඔබ්බට ගිය සේවාවන් පිළිබඳ මේ වසර තුළදී ද අවධානය යොමු විය.

තව ද වඩාත් සඵලදායී සේවාවක් උදෙසා මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් විවිධ පුහුණු වැඩසටහන් දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත ලබා දීම මෙන් ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්පත් දායකයන් වශයෙන් යොදාගෙන බාහිර වෙනත් රාජ්‍ය ආයතනික නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ දැනුම්වත්භාවය දියුණු කිරීම උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් විශ්‍රාම වැටුප් ගෙවීමේ සාම්ප්‍රදායික විෂය පථයෙන් ඔබ්බට යමින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වසර 2016 තුළ දැවැන්ත කාර්ය භාරයක් සනිටුහන් කර ඇත.

## 01. දෙපාර්තමේන්තු මෙහෙයුම් ක්‍රියාවලිය ප්‍රතිනිර්මාණය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ මෙහෙයුම් ක්‍රියාවලිය වන විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය හා ඊට සම්බන්ධ උප ක්‍රියාවලීන් 2016 වසර තුළදී ප්‍රතිනිර්මාණයන්ට භාජනය විය. නවීන තොරතුරු තාක්ෂණික විසඳුම් මඟින් සාම්ප්‍රදායික රාජ්‍ය සේවයෙන් ඔබ්බට ගිය විප්ලවීය ක්‍රියාවලි සංවර්ධනයක් මෙහිදී සිදු විය. එහිදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණ ඒකකය විසින් දිනෙන් දින සිදු කෙරෙන නවීන තොරතුරු තාක්ෂණික සංවර්ධන ක්‍රියාවලි අභිමුවේ සිය රාජකාරී වපසරිය යාවත්කාලීන කරගනිමින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේත්, සීමාවාසික පුහුණු සංචිතයේත්, අත්දැකීම් බහුල තොරතුරු තාක්ෂණික උපදේශකවරුන්ගේත් මාර්ගෝපදේශකත්වයන් ඔස්සේ නව ගමනක හැරවුම් ලක්ෂ ගණනාවක සටහන් තබන ලදි.

මේ අනුව විශ්‍රාම වැටුප් කළමණාකරණ පද්ධතිය පළමු අදියර යටතේ රාජ්‍ය නිලධාරීන් වැන්දඹු අනත්දරු අරමුදලේ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය මාර්ගගත ක්‍රමයට සිදුකිරීමේ මෘදුකාංගමය විසඳුමක් සංවර්ධනය කිරීම සිදු විය. රට පුරා රාජ්‍ය ආයතන හාරදහසක පමණ ප්‍රමාණයක් සමඟ මාර්ගගත ක්‍රමයෙන් ඒකාබද්ධ වී මෙහිදී කටයුතු සිදුකිරීමට සිදුවන බැවින් එහි මූලික පියවර වශයෙන් එකී රාජ්‍ය ආයතන මෙම පද්ධතියේ ලියාපදිංචි කිරීම සිදු වූ අතර රාජ්‍ය ආයතන 2,121ක පරිශීලකයන් 3,260 ක් 2016-12-31 දිනට මේ පද්ධතිය තුළ ලියාපදිංචි කරගැනීමට හැකියාව ලැබී ඇත. එමෙන් ම 29,613 ක් වූ රාජ්‍ය නිලධාරීන් සංඛ්‍යාවක් මාර්ගගත ක්‍රමයෙන් සිය වැන්දඹු අනත්දරු ලියාපදිංචිය සඳහා අයදුම් කර ඇති අතර 2016-12-31 වන විට 25,106 ක ප්‍රමාණයක් මේ ක්‍රමය මඟින් වැන්දඹු අනත්දරු ක්‍රමයේ ලියාපදිංචි කරගෙන ඇත. මීට අමතරව වැන්දඹු අනත්දරු හිමිකම් නැවත ලියාපදිංචි කිරීමේ තොරතුරු තාක්ෂණික වැඩසටහනක් නිර්මාණය කරමින් විශ්‍රාම වැටුපකට හිමිකම් ලත් රාජ්‍ය සේවකයන්ගේ පරිපූර්ණ දත්ත පද්ධතියක් සංවර්ධනය කිරීමේ මෙහෙයුමක් ද ක්‍රියාත්මක වේ.

එමෙන් ම තැපැල් කාර්යාලයන් මඟින් විශ්‍රාම වැටුප ලබාගන්නා විශ්‍රාමික ප්‍රජාවගේ ගෙවීම් කටයුතු පරිපාලනමය වශයෙන් පහසු කිරීම හා අවම පිරිවැයක් යටතේ සිදුකිරීම සඳහා තැපැල් දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව මාර්ගගත ගෙවීම් පද්ධතියක් සංවර්ධනය කරන ලදි.

ඒ අනුව වසර 2015 දී මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය මධ්‍යගත දත්ත පද්ධතියක් ඔස්සේ සිදු කිරීම ආරම්භ වුවත්, තැපැල් කාර්යාලයන් හා ප්‍රාදේශිය බැංකු වෙතින් සිදු වූ ගෙවීම් සියල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් ඔස්සේ වවුචර්පත් මඟින් විමධ්‍යගත ආකාරයෙන් ම සිදු විය. එහිදී ඇතිවූ පරිපාලනමය දුෂ්කරතාවයන් හා අධික පිරිවැය වළක්වා ගැනීම උදෙසා මාර්ගගත ගෙවීම් ක්‍රමයක් ද සංවර්ධනය විය. ඒ අනුව මධ්‍යගත දත්ත පද්ධතිය ඔස්සේ මධ්‍යගත ක්‍රමයට තැපැල් කාර්යාල ගෙවීම් ද ඉතා අඩු මාසික පිරිවැයකින් හා පහසු පරිපාලන ක්‍රම ඔස්සේ සිදුකිරීමට

හැකියාව ලැබුණු අතර දළවශයෙන් වාර්ෂිකව රුපියල් 500,000.00 ක පමණ පිරිවැයක් රජයට ඉතිරි කිරීමට මේ අනුව හැකියාව ලැබුණි.

විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතියේ දෙවන අදියර යටතේ 2016-10-08 වැනි දින මාර්ගගතව (online) විශ්‍රාම වැටුප් හිමිකම් ලියාපදිංචිය ජාතික විශ්‍රාමික දින උළෙල දී රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් දියත් කරන ලදි.

විශ්‍රාම ගනු ලබන රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වැටුප් ලියාපදිංචිය මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදුවන අතර විශ්‍රාම වැටුප් ලියාපදිංචිය සම්බන්ධ තොරතුරු විශ්‍රාමිකයා වෙත සන්නිවේදනය කිරීම සඳහා ඩයලොග් ආයතනය හා සම්බන්ධව ගාස්තු රහිත කෙටි පණිවුඩ සේවාවක් ද මීට සමගාමීව ක්‍රියාත්මක වේ. එමෙන් ම සත්කාර පියසේ විශ්‍රාමික ලියාපදිංචි ක්‍රියාවලිය ද මේ සමඟ අනුබද්ධ කරමින් සමස්ත විශ්‍රාම වැටුප් ලියාපදිංචි ක්‍රියාවලිය ඒකීය ක්‍රියාවලියක් බවට පත් කරන ලදී.

එයින් විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර පරීක්ෂාව සඳහා ගත වූ විනාඩි 40ක සමාන්‍ය කාලය විනාඩි 15ක් දක්වා අවම කර ගැනීමට, විශ්‍රාම වැටුප් ගණනය කිරීම හා පරිවර්තන කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීයව සිදු වන හෙයින් දෙපාර්තමේන්තුව වෙත ලැබෙන විමසීම් ප්‍රමාණය අඩුවීමත්, ගතවන කාලය අවමවීමත් ප්‍රතික්ෂේප වන අයදුම්පත්‍ර සංඛ්‍යාව අවමවීමත් සිදු විය.

මෙසේ මාර්ගගත ක්‍රමයට විශ්‍රාම වැටුප් ලියාපදිංචිය ආරම්භ කළ 2016.10.08 දින සිට 2016.12.31 දින දක්වා අයදුම්පත් 6238ක් මේ පද්ධතියට ඇතුළත් කර ඇති අතර දෘඪ පිටපත් 4,249ක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇත. එයින් 22.4%ක් ප්‍රතික්ෂේපිත අතර අයදුම්පත් 1,903කින් 44.8%ක් අනුමත කරන ලදී.

විශ්‍රාමික ප්‍රජාව වෙත විවිධ අවස්ථාවලදී හිඟ විශ්‍රාම වැටුප් ගෙවීමේ අවස්ථා උද්ගත වන අතර ඒ අවස්ථාවලදී හිඟ විශ්‍රාම වැටුප් සඳහා වන ඉල්ලීම් සලකා බැලීම සඳහා දෙපාර්තමේන්තුවේ පිහිටුවනු ලැබූ "සක්‍රීය කිරීමේ ඒකකය" මඟින් මධ්‍යගත ක්‍රමයට දිවයින පුරා විශ්‍රාමික ප්‍රජාවගේ හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම් නියාමනය කරන ලදී. එහිදී ඒ සඳහා අධික කාලයක් වැය වූ අතර ඇතැම් දෝෂයන්, ව්‍යාජයන් හා ප්‍රමාදයන් සිදුවිය හැකි බැවින් මේ ක්‍රියාවලිය 2016 මාර්තු මාසයේ දී සම්පූර්ණයෙන් ම ස්වයංක්‍රීයව ක්‍රියාත්මක කළ හැකි පරිදි වැඩසටහනක් නිර්මාණය කළ අතර එය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු මධ්‍යගත දත්ත පද්ධතියට සම්බන්ධ කළ අතර ඒ අනුව හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය ගණකාධිකාරිවරයකුගේ අධීක්ෂණය යටතේ මාර්ගගතව සිදුකිරීම සඳහා විමධ්‍යගත කළ හැකි විය. ඒ අනුව 2016 මාර්තු මාසයේ සිට 2016.12.31 වන විට මාර්ගගත ක්‍රමයට ලද අයදුම්පත් 14,998 ක් අතරින් 9,670 ක ප්‍රමාණයක් හිඟ විශ්‍රාම වැටුප් ගෙවා අවසන් කිරීමට හැකි විය.

එමෙන් ම විශ්‍රාම වැටුප් කළමණාකරණ පද්ධතියේ තුන්වැනි අදියර යටතේ විශ්‍රාම වැටුප්

දෙපාර්තමේන්තු මධ්‍යගත දත්ත පද්ධතිය ඔස්සේ මාර්ගගත ක්‍රමයට විශ්‍රාමික ප්‍රජාව වෙත නිදහස් දුම්රිය බලපත්‍ර ලබා දීමේ වැඩසටහන් පද්ධතියක් වසර 2016 ජාතික විශ්‍රාමික දින උළෙලට සමගාමීව දියත් කරන ලදි. එමෙන් ම රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ සමාජිකයන් උදෙසා වඩාත් පුළුල් දත්ත පද්ධතියක් නිර්මාණයටත්, අදාළ මාර්ගගත ගෙවීම් ක්‍රමයක් සඳහා නව මෘදුකාංගයක් 2016 දෙසැම්බර් මස නිර්මාණය කළ අතර වසර 2017 දී එය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. වසර 2015 දී ආරම්භ කරන ලද විශ්‍රාමික ඉලෙක්ට්‍රොනික හැඳුනුම්පත් නිකුත් කිරීමේ වැඩසටහන 2016 වසරේ දී ප්‍රතිව්‍යුහගත කරනු ලබන අතර එහිදී සත්කාර පියස වෙත පැමිණෙන විශ්‍රාමික ප්‍රජාව වෙත එදින ම ඉලෙක්ට්‍රොනික හැඳුනුම්පත ලබා දීම සඳහා වැඩසටහනක් සකස් කරන ලදී. මේ වැඩසටහන ඔස්සේ විශ්‍රාමිකයින් සඳහා ඉලෙක්ට්‍රොනික හැඳුනුම්පත මඟින් විශ්‍රාමික ජීවිත සහතිකය ලබා ගැනීමේ ක්‍රියාවලිය, නිදහස් දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම ආදි ව්‍යාපෘති ද 2016 වසරෙන් පසුව ද වැඩිදියුණු කිරීමට නියමිත ය.

මෙසේ තොරතුරු තාක්ෂණික ක්‍රියාවලි සංවර්ධනයේ දී දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ද අත්‍යාවශ්‍ය කාරණයක් විය. මක්නිසාද සමස්ත විශ්‍රාමික ප්‍රජාවගේ ලියාපදිංචිය ආශ්‍රිත තොරතුරු මෙන් ම ගෙවීම් තොරතුරු ද යන වටිනා තොරතුරු සමූහයක් ද මේ පද්ධතිය තුළ පවත්වාගෙන යන බැවින් වසර 2016 ආරම්භයේදී දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණ ඒකකය සතුව තිබූ ඉතා පැරණි සේවා සැපයුම් උපකරණ යුගලය තුළ මෙකී තොරතුරු රැස ගබඩා කිරීම අවදානම් සහගත වූවක් බැවින් මේ තොරතුරුවල සුරක්ෂිතතාවය තහවුරු කිරීම උදෙසා සේවාගාරය නවීකරණය කිරීමට කටයුතු සිදුවූ අතර තොරතුරු හා සන්නිවේදන ආයතනය (ICTA) විසින් අතහැර දැමූ සේවා උපකරණ පහක් අලුත්වැඩියා කර භාවිතයට ගත් අතර ඒවායේ තොරතුරුවල ආරක්ෂාව තර කරන ලදී. මීට අමතරව මිලදීගත් නවීන සේවා සැපයුම් උපකරණ යුගලය ද ඇතුළුව මේ වන විට දෙපාර්තමේන්තුව සතුව ඇති සේවා උපකරණ නවයකින් මෙකී අභ්‍යන්තර හා බාහිර සියලු අවශ්‍යතාවයන් පූරණය කරමින් කාර්යක්ෂම තොරතුරු තාක්ෂණික සේවාවක් සැපයීම සිදුවේ.

මෙහිදී දෙපාර්තමේන්තු පරිශ්‍රයෙන් පරිබාහිරව දිවයින පුරා විසිරුණු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හි මෙන් ම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා මාර්ගගතව සම්බන්ධ වන වෙනත් රාජ්‍ය ආයතන යන්හි ද තොරතුරු හුවමාරුවක් සිදුවන බැවින් මේ මාර්ගගත සම්බන්ධතාවය මැනවින් පවත්වාගෙන යාම හා සුරක්ෂිත කිරීම සඳහා එටිසලාට් පුද්ගලික සමාගම සමඟ ජාලකරණය හා සුරක්ෂිතතාවය වෙනුවෙන් එකඟතාවයකට පැමිණෙන ලදී.

තවද දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණ සංවර්ධනය සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 14ක මුදලින් උපරිම ප්‍රතිලාභ අත්පත් කර

ගත් අතර තොරතුරු තාක්ෂණ මෙහෙයුම් මෘදුකාංග සංවර්ධනය කිරීමෙන් රුපියල් 3, 000,000.00 ක මුදලකට අධික වටිනාකමින් යුතු යෙදවුම් මෘදුකාංග නිකුත් කිරීමට හැකියාව ලැබී ඇත.

## 02. ලියාපදිංචි ක්‍රියාවලිය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ක්‍රියාවලියේ මූලික ම පියවර වන්නේ ලියාපදිංචි ක්‍රියාවලියයි. ප්‍රතිලාභ හිමි ප්‍රතිලාභීන් නිරවද්‍යතාවයෙන් යුතුව තෝරා ගැනීම හා ඔවුන්ට හිමි ප්‍රතිලාභ නිර්ණය කිරීම මෙහිදී ප්‍රමුඛ වගකීමක් වන අතර එහිදී ප්‍රතිලාභීන්ටත් රජයටත් සමබර හා විනිවිදභාවයෙන් යුතුව ලියාපදිංචි ක්‍රියාවලිය පවත්වාගෙන යාමට ද හැකියාව ලැබී ඇත.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන් විශ්‍රාම වැටුප් ලියාපදිංචිය, වැන්දඹු අනත්දරු ලියාපදිංචිය හා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ලියාපදිංචිය යන විෂය ත්‍රිත්වය අනුව වර්ග කළ හැකි ය.

වගුව 01

| විශ්‍රාම වැටුප් ලියාපදිංචි කිරීම - 2016 | |
|---|---|
| **මාසය** | **සංඛ්‍යාව** |
| ජනවාරි | 1969 |
| පෙබරවාරි | 2044 |
| මාර්තු | 1555 |
| අප්‍රේල් | 1417 |
| මැයි | 1398 |
| ජූනි | 1760 |
| ජූලි | 2449 |
| අගෝස්තු | 2198 |
| සැප්තැම්බර් | 2700 |
| ඔක්තෝබර් | 1952 |
| නොවැම්බර් | 1475 |
| දෙසැම්බර් | 2454 |
| **එකතුව** | **23371** |

මූලාශ්‍රය - ලියාපදිංචි අංශය

ප්‍රස්ථාර 01




## 2. 1 විශ්‍රාම වැටුප් ලියාපදිංචි ක්‍රියාවලිය

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2015 ප්‍රකාරව 2015 වසර තුළ විශ්‍රාම වැටුප් ලියාපදිංචි අංක ලබාදීම PD 3 ආකෘති පත්‍රය මඟින් සිදු විය. ඒ අනුව විශ්‍රාම වැටුප් අපේක්ෂිත රාජ්‍ය නිලධාරියා විසින් PD 3 ආකෘති පත්‍රය සම්පූර්ණ කර තමා සේවය කළ ආයතනය මඟින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු ය. එහිදී එකී ආකෘති පත්‍රය පරීක්ෂා කර මාසික විශ්‍රාම වැටුප් ගෙවීම හා පාරිතෝෂික ගෙවීම අනුව විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් අංකයක් ලබාදීම සිදු විය.

**ප්‍රස්ථාර 02**




**වගුව 02**

| මාසය | සිවිල් | හමුදා | එකතුව |
|---|---|---|---|
| ජනවාරි | 1212 | 757 | 1969 |
| පෙබරවාරි | 1045 | 999 | 2044 |
| මාර්තු | 925 | 630 | 1555 |
| අප්‍රේල් | 958 | 459 | 1417 |
| මැයි | 978 | 420 | 1398 |
| ජූනි | 1130 | 630 | 1760 |
| ජූලි | 1719 | 730 | 2449 |
| අගෝස්තු | 1258 | 940 | 2198 |
| සැප්තැම්බර් | 1,568 | 1,132 | 2700 |
| ඔක්තෝබර් | 983 | 969 | 1952 |
| නොවැම්බර් | 9 | 233 | 242 |
| දෙසැම්බර් | 5 | 313 | 318 |
| **එකතුව** | **11790** | **8212** | **20002** |

මූලාශ්‍රය - ලියාපදිංචි අංශය

වසර 2016 දී මේ ක්‍රියාවලිය තවදුරටත් නවීන තොරතුරු තාක්ෂණික භාවිතාවන් සමඟ මුසු කරමින් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2015 සංශෝධන II ප්‍රකාරව රාජ්‍ය නිලධාරීන් විශ්‍රාම ලබාගන්නා ආයතන මඟින් PD 3 ආකෘති පත්‍රයේ තොරතුරු මාර්ගගත ක්‍රමය යටතේ දත්ත පද්ධතියට ඇතුළත් කරනු ලැබේ. එසේ ඇතුළත් කිරීමෙන් එකී තොරතුරු ඒ මොහොතේදී ම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලැබෙන අතර තොරතුරු ඇතුළත් කිරීමේ දී සිදුවිය හැකි වැරදි හා අතපසුවීම් අවම වන අයුරින් මේ මාර්ගගත දත්ත පද්ධතිය නිර්මාණය කර තිබෙන නිසා අඩුපාඩු සහිත අයදුම්පත්‍ර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත පැමිණීම අවම වී ඇත. මෙසේ මාර්ගගත දත්ත පද්ධතිය වෙත තොරතුරු ඇතුළත් කිරීමෙන් පසුව ලබාගන්නා තොරතුරු පත්‍රිකාව අදාළ ආයතනය මඟින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමුකළ යුතු අතර එකී තොරතුරු පත්‍රිකාව හා දත්ත පද්ධතිය පරීක්ෂා කර කඩිනමින් විශ්‍රාම වැටුප් අංකයක් නිකුත් කරනු ලැබේ. එසේ නිකුත් කරන අංකය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ විශ්‍රාමික තොරතුරු කවුළුවෙන් ඕනෑ ම විශ්‍රාමිකයකුට පරීක්ෂා කරගත හැකි වන අතර විශ්‍රාමිකයාගේ ජංගම දුරකථනයට කෙටි පණිවුඩයක් මඟින් විශ්‍රාම වැටුප් අංකය දැනුම් දීම ද සිදුවේ. ඒ සමඟ ම අංක නිකුත් කළ සියලු විශ්‍රාමික ප්‍රජාව වෙත සත්කාර පියසේ සේවාව සඳහා ආරාධනා කරමින් ලිපියක් යවන අතර එහි දී ද ඔහුගේ හෝ ඇයගේ විශ්‍රාම වැටුප් අංකය සඳහන් කර යවනු ලැබේ.

යම් ආකාරයකින් විශ්‍රාම වැටුප් ලියාපදිංචිය සඳහා යොමුකරන ලද මාර්ගගත අයදුම් පත්‍රයේ අඩුපාඩු වාර්තා වුවහොත් ඒ අඩුපාඩු සියල්ල මාර්ගගත දත්ත පද්ධතියේ ම සටහන් කරන අතර ඒ පිළිබඳව විශ්‍රාමිකයා ද කෙටි පණිවිඩයක් මඟින් දැනුම්වත් කරනු ලැබේ. අදාල ආයතනය විසින් යොමු කරන ලද තොරතුරු පත්‍රිකාව ද නැවත එකී ආයතනය වෙත යොමු කරන අතර එහිදී අඩුපාඩු සම්පූර්ණ කර නැවත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු ය. මෙසේ සිවිල් හා හමුදා යන විශ්‍රාම වැටුප් සියල්ල මාර්ගගත ක්‍රමයට ලියාපදිංචි ක්‍රියාවලිය සිදුවන අතර ඒ මඟින් විශ්‍රාමික ප්‍රජාවටත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවටත් වාසි රැසක් අත්වී ඇත.

**ප්‍රස්ථාර 03**




**වගුව 03**

| මාසය | සිවිල් | හමුදා | එකතුව |
|---|---|---|---|
| නොවැම්බර් | 890 | 343 | 1233 |
| දෙසැම්බර් | 1,712 | 424 | 2136 |
| **එකතුව** | **2602** | **767** | **3369** |

මූලාශ්‍රය - ලියාපදිංචි අංශය

විශේෂයෙන් මේ දත්ත පද්ධතියට විශ්‍රාම වැටුප් ගණනයට අදාළ තොරතුරු ඇතුළත් කර ඇති බැවින් විශ්‍රාම වැටුප් ගණනය කිරීම දත්ත පද්ධතිය මඟින් ස්වයංක්‍රීයව සිදුවන අතර එහිදී ගණනය කිරීම මෙන් ම පරීක්ෂා කිරීම ද පහසු වනවා මෙන් ම කාලය ද ඉතිරි වේ. තවද අඩුපාඩු සහිත අයදුම්පත්‍ර යොමුවන ප්‍රමාණය අවම වීම හා අඩුපාඩු මාර්ගගත ක්‍රමය මඟින් දැනුම් දීම නිසා ඉතා අඩු කාලයක් තුළ අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට අනෙක් ආයතනයන්ට හා විශ්‍රාමික ප්‍රජාවටත් අවස්ථාව ලැබෙන අතර එහි ප්‍රතිඵලයක් ලෙස කඩිනමින් විශ්‍රාම වැටුප් ලියාපදිංචියේ සිට ප්‍රථම ගෙවීම් දක්වා සියලු පියවරයන් පිළිබඳ ජංගම දුරකථනය වෙත කෙටි පණිවිඩයක් මඟින් තොරතුරු සම්ප්‍රේෂණය කරන බැවින් සිදුවන විමසීම් ප්‍රමාණය අඩු වේ.

## 2.2. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වීම.

රාජ්‍ය සේවයට බැඳෙන සියලු නිලධාරින් 1898 අංක 01 දරණ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත යටතේ 1898.06.23 දින සිට අනිවාර්යයෙන් ලියාපදිංචි කිරීම හා ඔවුන්ගේ මාසික වේතනයෙන් අදාල දායක මුදල් උක්ත

අරමුදල වෙත අය කිරීමත් රාජ්‍ය සේවයට බැඳෙන සියලු නිලධාරිණියන් 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත යටතේ 1983.08.01 දින සිට අනිවාර්යයෙන් ලියාපදිංචි කිරීම හා ඔවුන්ගේ මාසික වේතනයෙන් අදාල දායක මුදල් උක්ත අරමුදල වෙත අය කිරීමත් සිදු වේ. මෙහිදී මේ ලියාපදිංචි ක්‍රියාවලිය ගත වූ පෙර වසර ගණනාව තුළ සිදු වූ ආකාරයේ තිබූ යම් යම් දුර්වලතා මත දායකයාගේ ඇවෑමෙන් වැන්දඹු අනත්දරු හිමිකම් පිළිගැන්වීමට අවශ්‍ය වන මොහොතේ අදාල කලත්‍රයන්ට මෙන් ම නිලධාරින්ට ද දුෂ්කරතා රැසකට මුහුණ දීමට සිදු විය. එහිදී වැන්දඹු අනත්දරු අංකයක් ලබාගෙන නොතිබීම මෙන් ම වැන්දඹු අනත්දරු ලිපිගොනුව නිවැරදිව යාවත්කාලීන නොවීම මත මේ අපහසුතාවයන් උද්ගතවන බව නිරීක්ෂණය විය. ඊට ලබා දිය හැකි සාර්ථක විසඳුම් ලෙස වසර 2016 සිට විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 2/2016 මඟින් සියලු ම රජයේ නිලධාරින් හා නිලධාරිණියන් වැන්දඹු අනත්දරු විශ්රාම වැටුප් පනතේ ලියාපදිංචි වීම හා අංක ලබා ගැනීම අන්තර්ජාලය ඔස්සේ මාර්ගගත ක්‍රමයට සිදු කිරීමට උපදෙස් ලබාදෙන අතර ඊට අදාල කටයුතු ද සම්පාදනය කරන ලදී.

මෙහිදී අදාල රාජ්‍ය නිලධාරියා රාජකාරි සිදු කරන ආයතනයේ විෂය ලිපිකරු විසින් එකී නිලධාරියාගේ තොරතුරු මාර්ගගත දත්ත පද්ධතියට ඇතුළත් කිරීම මෙන් ම එකී නිලධාරියාගේ පත්වීම් ලිපිය හා ජාතික හැඳුනුම්පත පරිලෝකනය කර දත්ත පද්ධතියට ඇතුළත් කිරීම ද කළ යුතු ය. පසුව මේ දත්ත පද්ධතියෙන් මුද්‍රණය කරගන්නා අදාල නිලධාරියාගේ තොරතුරු පත්‍රය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වැන්දඹු අනත්දරු අංශය වෙත යොමු කළ යුතු ය. එහිදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අදාල නිලධාරින් මේ තොරතුරු පරීක්ෂා කර වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ එකී නිලධාරියා ලියාපදිංචි කර ලියාපදිංචි අංකයක් නිකුත් කිරීම සිදු කරයි. එහිදී නිකුත් කරන ලියාපදිංචි අංකය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ විශ්‍රාමික සේවා කවුළුවට පිවිස තමන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර ලබාගත හැකි ය.

මෙහිදී මීට පෙර තිබූ ක්‍රමය අනුව සිදු වූ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුළ අදාල නිලධාරින් වෙනුවෙන් වැන්දඹු අනත්දරු ලිපිගොනුව නඩත්තු කිරීම සිදු නොවන අතර විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 6/2015 I අනුව වැන්දඹු අනත්දරු ලිපි ගොනුවේ නඩත්තු වූ සියලු ලේඛන අදාල නිලධාරින්ගේ පෞද්ගලික ලිපි ගොණුව තුළ යාවත්කාලීන කළයුතු බවට සියලු රාජ්‍ය ආයතනයන්ට උපදෙස් ලබා දී ඇත.

මෙසේ සරල හා පහසු ක්‍රමයක් මඟින් අංක ලබාදීම හා එය සන්නිවේදනය කිරීම නිසා සැලකිය යුතු ප්‍රමාණයකින් ඒ පිළිබඳව දිනපතා දුරකතන මාර්ගයෙන් හා පැමිණ සිදු කරන විමසීම්වල අඩුවීමක් නිරීක්ෂණය වේ.

වැන්දඹු අනත්දරු දායකයන්ගේ සියලු තොරතුරු ඇතුළත් දෘඩ පිටපත් ලේඛනාගාරයක් වෙනුවට මෘදු පිටපත් ඇතුළත් ඉලෙක්ට්‍රොනික ලේඛනාගාරයක් පවත්වාගෙන යාම හා

යාවත්කාලීන කිරීම පිළිබඳ අවධානය යොමු කර ඒ සඳහා වැන්දඹු අනත්දරු හිමිකම් නැවත ලියාපදිංචි කිරීම මඟින් පරිපූර්ණ දත්ත පද්ධතියක් ගොඩනගා ගැනීම සඳහා අදාල දත්ත පද්ධතියක් සංවර්ධනය කළ අතර දැනට සිටින වැන්දඹු අනත්දරු සමාජික සාමාජිකාවන් ප්‍රති ලියාපදිංචි කිරීමේ වැඩසටහන වසර 2017 දී ආරම්භ කිරීමට නියමිත ය.

### 2.2.1 වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ලියාපදිංචිය

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වන්නේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ ලියාපදිංචි වූ දායකයකු හෝ දායිකාවකගේ අභාවයකින් පසුව ය. එහි දී කලත්‍රයාට වැන්දඹු හෝ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ගෙවීම හෝ අනත්දරුවන්ට අනත්දරු වැටුප අනත්දරු සීමාව තෙක් ගෙවීම හා ආබාධිත දරුවන් වෙත නීතිප්‍රකාර කාලසීමාවක් තුළ ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම ද සිදුවේ.

මෙකී ගෙවීම් ආරම්භ කිරීම සඳහා අදාල හිමිකරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රමය මෙතෙක් විමධ්‍යගතව පැවති අතර එහිදී හිමිකරුවන් විසින් දායකයාගේ මරණ සහතිකය ඇතුළු හිමිකරුවන්ගේ තොරතුරු ඇතුළත් ලියවිලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් පසු එකී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් අදාල දායකයාගේ වැන්දඹු අනත්දරු ලිපිගොණුව ගෙන්වා ගෙන හිමිකරුවන්ට අදාල විශ්‍රාම වැටුප සකසා දීම සිදු විය. එහි දී මේ විමධ්‍යගත ක්‍රමය අනුව දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ම වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ලියාපදිංචි අංක නිකුත් වූ බැවිනුත් ඒ එක එකක් ආයතන ඒකීය පද්ධතියක් ඔස්සේ ලියාපදිංචි අංක නිකුත් නොකිරීමත් හේතුවෙන් එකම අංකය ප්‍රාදේශීය ලේකම් කර්යාලය ගණනාවකින් නිකුත් වන්නට විය. එමෙන් ම එකී දීර්ඝ ක්‍රියාවලිය හේතුවෙන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවිය. එබැවින් දිවයිනේ සියලු ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සජීවී ව ජාලගත වන එක ම පද්ධතියක් ඇසුරින් මධ්‍යගත ක්‍රමයකට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ලියාපදිංචිය සිදු කිරීම ආරම්භ කරන ලදී. එහිදී දායකයාගේ ඇවෑමෙන් වැන්දඹු අනත්දරු හිමිකම සහිත අයගෙන් PD 4 ආකෘතිය සම්පූර්ණ කරවා ගන්නා අතර එහි තොරතුරු හා පරිලෝකනය කරන ලද දායකයාගේ මරණ සහතිකය ඇතුළු අනෙකුත් ලියකියවිලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ජාලගත දත්ත පද්ධතියට ඇතුළත් කිරීම සිදු කරයි.

අනතුරුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වැන්දඹු අනත්දරු අංශය විසින් මේ තොරතුරු හා එකී දායකයාට අයත් වැන්දඹු අනත්දරු ලිපිගොනුව ලේඛනාගාරයෙන් ලබාගෙන එකී තොරතුරු සමඟ පරීක්ෂා කර විසිලක්ෂ කාණ්ඩයෙන් ඇරඹෙන ලියාපදිංචි අංකයක් ලබා දීම සිදු වේ. මෙහිදී දැනටමත් සත්කාර පියස ඔස්සේ විශ්‍රාමිකයා වෙත වැන්දඹු අනත්දරු

ලිපිගොනුව ලබා දී තිබෙන අවස්ථාවලදී මෙකී තොරතුරු පරිලෝකනය කළ දත්ත පද්ධතිය ඇසුරින් පරීක්ෂා කර අංක ලබා දීම සිදු වේ.

එහිදී වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය මාර්ගගත දත්ත පද්ධතිය තුළ ස්වයංක්‍රීයව සැකසෙන අතර එහි මුද්‍රිත පිටපතක් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ලබා ගැනීමේදී කලත්‍රයා වෙත තැපැලෙන් ලැබීමට සලසන අතර අවශ්‍ය අවස්ථාවක දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් එහි පිටපතක් මුද්‍රණය කරවා ගත හැකි ය. අනත්දරු හා ආබාධිත යන කාණ්ඩයන් අතරේ සිදු කරන ගෙවීම් ලියාපදිංචිය ද මේ ආකාරයෙන් ම සිදු කෙරේ.

## 2.3 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ක්‍රමයේ ලියාපදිංචිය

වසර 1942 අංක 18 දරණ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ 1942.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍යසේවා අර්ථසාධක ප්‍රතිලාභ රාජ්‍ය සේවයේ නියුතු විශ්‍රාම වැටුප් රහිත දෛනික වැටුප් ලබන, අනියම් ආදේශක, තාවකාලික, මෙන් ම මධ්‍යම රාජ්‍ය හෝ පළාත් සභා අමාත්‍ය කාර්ය මණ්ඩල හා ශ්‍රී ලංකික විදේශ දූත මණ්ඩලයක සේවය කරන විශ්‍රාම වැටුප් රහිත දේශීය හා විදේශීය රාජ්‍ය සේවකයන්ට හිමි වන්නේ ය. මෙසේ රාජ්‍යසේවා අර්ථසාධක අරමුදලේ ලියාපදිංචියට සුදුසුකම් ලත් රාජ්‍ය සේවකයන්ගේ මාසික වැටුපෙන් 8% ක අනිවාර්ය දායක මුදලක් හා 12%ක රජයේ දායකත්වයත් රාජ්‍යසේවා අර්ථසාධක අරමුදල වෙත බැර කිරීමට අදාල ආයතනය වගබලාගත යුතු ය.

මෙහිදී එකී සාමාජිකයන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ලියාපදිංචිය උදෙසා අදාලවන PD1N හා PD2N අයදුම්පත්‍ර සම්පූර්ණ කර සහතික කරන ලද ජාතික හැඳුනුම්පතේ පිටපතක් හා අනියම් පත්වීම් ලිපිය ආදී ලියකියවිලි සමඟ ආයතන ප්‍රධානියා මගින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ රාජ්‍ය සේවා අර්ථසාධක අංශය වෙත යොමුකළ යුතු ය.

එහිදී අදාල තොරතුරු පරීක්ෂා කර එකී සාමාජිකයා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ලියාපදිංචි කර අංකයක් නිකුත් කරන අතර එය ලිපියක් මඟින් අදාල ආයතන ප්‍රධානියා දැනුම්වත් කිරීම සිදුවේ. අනතුරුව එම ආයතනය විසින් අදාල නිලධාරියා දැනුම්වත් කිරීම සිදුවේ.

මෙසේ ලිපි හා තැපැල් මාර්ගයෙන් පියවර ගණනාවකින් සිදුකරන මේ ක්‍රියාවලිය තවදුරටත් සරලව හා වේගවත්ව විධිමත් අයුරින් සිදු කිරීම සඳහා 2016 වසරේදී අවධානය යොමුවී ඇති අතර මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචිය සඳහා තොරතුරු ඇතුළත් කිරීම, තොරතුරු පරීක්ෂාව හා අංක නිකුත්කර එය ආයතනය හා සාමාජිකයා වෙත සන්නිවේදනය කිරීම යන සියලු පියවරයන් මාර්ගගතව කෙටි කාලයකින් සිදුකිරීමට හැකි වෙතැයි මෙහිදී අපේක්ෂා කෙරේ. ඒ සඳහා අවශ්‍ය මාර්ගගත දත්ත පද්ධතිය නිර්මාණය කළ අතර එය වසර 2017 දී ක්‍රියාත්මක කිරීමට නියමිත ය.

## 03. ප්‍රථම ගෙවීම් ක්‍රියාවලිය

රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබූ විශ්‍රාමික නිලධාරියකු වෙත විශ්‍රාම වැටුප මුල්වරට ගෙවීමේ ක්‍රියාවලියත් රාජ්‍ය නිලධාරියකුගේ හෝ රජයේ විශ්‍රාමිකයකුගේ අභාවයෙන් පසු කලත්‍රයාට, අනත්දරුවන්ට හෝ ආබාධිත දරුවන්ට අදාළ ප්‍රතිලාභ ගෙවීම් ආරම්භ කිරීමේ ක්‍රියාවලියත් ප්‍රථම ගෙවීම් ක්‍රියාවලිය ලෙස හඳුන්වමු.

මෙහිදී විමධ්‍යගතව තිබූ මෙකී ප්‍රථම ගෙවීම් ක්‍රියාවලිය නවීන තොරතුරු තාක්ෂණයේ සංවර්ධනීය සීඝ්‍රගාමී ගමනත් සමඟ වසර 2014 අග භාගයේ සිට මධ්‍යගත ක්‍රියාවලියක් බවට පරිවර්තනය වන්නට විය. එහිදී මූලික වශයෙන් විශ්‍රාම වැටුප් ප්‍රථම ගෙවීම් ක්‍රියාවලිය මධ්‍යගත දත්ත පද්ධතියක් ඔස්සේ මාර්ගගත ගෙවීම් ක්‍රමයක් දක්වා වසර 2016 තුළදී සංවර්ධනය වී ඇත.

ඒ අනුව ප්‍රථම ගෙවීම් ක්‍රියාවලිය සත්කාර පියස, විශ්‍රාම වැටුප් ප්‍රථම ගෙවීම් හා වැන්දඹු හා අනත්දරු ප්‍රථම ගෙවීම් වශයෙන් ඒකාබද්ධ ක්‍රියාවලි තුනට යටත්ව සිදු වේ. එය පහත සවිස්තරාත්මකව දැක්වේ.

### 3.1 සත්කාර පියස

රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබන විශ්‍රාමික ප්‍රජාව වෙත ගෙවීම් ආරම්භයට පෙර එක් වරක් පමණක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සත්කාර පියසේ සම්මුඛ පරීක්ෂණය වෙත සහභාගී වීම අනිවාර්ය වේ. විශ්‍රාම වැටුප් ලියාපදිංචි අංක නිකුත් කිරීමත් සමඟ සත්කාර පියස වෙත පැමිණිය යුතු දිනය හා විශ්‍රාම වැටුප හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ගෙවීම සම්බන්ධව අවශ්‍ය වන ලිපි ලේඛන ලැයිස්තුව ඇතුළත් ලිපියක් මඟින් විශ්‍රාමිකයා දැනුම්වත් කිරීම සිදුවේ. මේ පිළිබඳව විශ්‍රාමිකයාගේ ජංගම දුරකථනය වෙත කෙටි පණිවිඩයක් මගින් දැනුම්වත් කිරීම ද දෙපාර්තමේන්තු කෙටි පණිවිඩ සේවාව ඔස්සේ සිදුවේ.

විශ්‍රාමික ප්‍රතිලාභ තහවුරු කර ගැනීම උදෙසා සත්කාර පියස වෙත පැමිණෙන විශ්‍රාමිකයා සමඟ සිදුකරනු ලබන සම්මුඛ සාකච්ඡාවකින් අනතුරුව එකී තොරතුරු ඔහුගේ විශ්‍රාම වැටුප් ලියාපදිංචි අංකය යටතේ දත්ත පද්ධතියට ඇතුළත් කරන අතර විශ්‍රාම වැටුප සක්‍රිය කිරීම හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම් තහවුරුව සඳහා අදාල වන ලිපි ලේඛන සියල්ල පරිලෝකනය කර දත්ත පද්ධතියට ඇතුළත් කිරීමත් සිදුවේ.




මූලාශ්‍රය - මාධ්‍ය අංශය

මෙහිදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුළ නඩත්තු වූ වැන්දඹු අනත්දරු ගොනුවේ සියලු ලියකියවිලි පරිලෝකනය කර දත්ත පද්ධතියට ඇතුළත් කරන අතර එහි දී ගොනුව සහ විශ්‍රාම

වැටුප් හිමිකම් පත්‍රය ද විශ්‍රාමිකයා වෙත ලබාදීම සිදුවේ. එමෙන් ම ඉලෙක්ට්‍රොනික විශ්‍රාමික හැඳුනුම්පත හා දත්ත පද්ධතිය වෙත ඇඟිලි සලකුණු ලබා ගැනීම ද මේ සමග සිදුවේ.

මාර්ගගත ක්‍රමය ඔස්සේ විශ්‍රාම වැටුප් ලියාපදිංචිය සිදුකළ සියලු විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම් සක්‍රිය කරනුයේ මෙකී සම්මුඛ පරීක්ෂණයෙන් ප්‍රතිලාභ තහවුරු කිරීමෙන් අනතුරුව ය. එබැවින් සත්කාර පියස යනු විශ්‍රාම වැටුප් ලියාපදිංචිය හා සම්බන්ධ ක්‍රියාවලියකි. සත්කාර පියස ආරම්භ වූ යුගයේ දිනකට සම්මුඛ පරීක්ෂණ 50 ක් පමණ සිදුකිරීම හේතුවෙන් මෙකී සේවාව ලබාගැනීම උදෙසා දිගු පොරොත්තු ලේඛනයක් පැවතුණි.එහෙත් විශ්‍රාම වැටුප් ලියාපදිංචිය හා ඒකාබද්ධ ක්‍රියාවලියක් වීම සමඟ ම මෙකී පොරොත්තු ලේඛන ඉවත්ව දිනකට සම්මුඛ සාකච්ඡා 120 ක් පමණ සිදු කරමින් කඩිනම් සේවාවක් සැපයීමට හැකියාව ලැබුණි. ඒ අනුව 2016 වසර පුරා සම්මුඛ සාකච්ඡා 13,990 ක ප්‍රමාණයක් සිදුකර සේවා සැපයීමට හැකියාව ලැබී ඇත.

### 3.2 විශ්‍රාම වැටුප් ප්‍රථම ගෙවීම

සත්කාර පියසේ විශ්‍රාමික සම්මුඛ පරීක්ෂණයෙන් පසුව එළැඹෙන මාසයේ විශ්‍රාම වැටුප් ගෙවීම් දිනයට විශ්‍රාමිකයාගේ ප්‍රථම මාසික විශ්‍රාම වැටුප සිය පෞද්ගලික බැංකු ගිණුම වෙත බැර වන අතර ප්‍රථම ගෙවීම් ක්‍රියාවලිය සිදුවන්නේ සත්කාර පියසේ සම්මුඛ පරීක්ෂණය මඟින් විශ්‍රාමිකයා තහවුරු කර ගැනීම පදනම් කර ගෙන ය.

වසර 2015 දී ක්‍රියාත්මක වූ ප්‍රථම ගෙවීම් ක්‍රියාවලිය මඟින් එළැඹෙන මාසය තුළ දී සෘජුව ම විශ්‍රාමිකයාගේ ගිණුමට මාසික විශ්‍රාම වැටුප බැර කිරීම සිදු වූ අතර වසර 2016 දී ඒ ක්‍රමය තවදුරටත් සංවර්ධනය කරමින් ගෙවීම්වල නිරවද්‍යතාවය තහවුරු කරගැනීමටත් වැරදි සහගත ගෙවීම් වෙතොත් හැකි ඉක්මනින් වළක්වා ගැනීමටත් අවශ්‍ය ලෙස ක්‍රියාවලි සංවර්ධනයක් සිදු විය.

ඒ අනුව සත්කාර පියස තුළදී විශ්‍රාමික තහවුරුව ලබාගත හැකි විය. එමෙන් ම විශ්‍රාමිකයා වෙත ප්‍රථම ගෙවීමෙන් අනතුරුව මාස තුනක් ඇතුළත ඔහු හෝ ඇය සේවය කළ ආයතනය විසින් අදාල විශ්‍රාමිකයාගේ විශ්‍රාම වැටුප් ලිපිගොනුව විශ්‍රාමිකයාගේ ස්ථිර පදිංචියට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යැවිය යුතු අතර එසේ නොවන අවස්ථාවලදී එකී විශ්‍රාම වැටුප තාවකාලිකව නතර කිරීමට කටයුතු කරනු ඇත. ඒ මඟින් සියලු ගෙවීම් ආරක්ෂිත හා නිරවද්‍ය තහවුරුවක් මත පිහිටා සිදුවන බව ප්‍රධාන කාර්යාලයට සනාථ කරගත හැකිවනු ඇත.

මෙහිදී තොරතුරු තාක්ෂණ ඒකකය මඟින් ලබාගන්නා ප්‍රථම ගෙවීම් වාර්තාවක් මාස්පතා ලබාගන්නා අතර එහිදී එක් එක් දිස්ත්‍රික්කයන්ට අදාල විශ්‍රාම වැටුප් ප්‍රථම ගෙවීම් වාර්තා අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි දිස්ත්‍රික් සම්බන්ධීකාරක විශ්‍රාම වැටුප් නිලධාරීවරුන් වෙත විද්‍යුත් තැපෑලෙන් යැවීම සිදුවේ. එහි දී දිස්ත්‍රික් සම්බන්ධීකාරක නිලධාරීන් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ගෙන් තොරතුරු ලබාගෙන ප්‍රථම ගෙවීම් සිදු වූ විශ්‍රාමිකයන්ගේ ලිපිගොනු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබුණේද

යන්න තහවුරු කරයි. එසේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් වෙත මාස තුනක් ඇතුළත විශ්‍රාම වැටුප් ලිපිගොනු නොලැබෙන අවස්ථාවල දී අදාළ විශ්‍රාමිකයා මෙන් ම ඔහු සේවය කළ ආයතනය ද දැනුම්වත් කරන අතර තාවකාලිකව විශ්‍රාම වැටුප් ගෙවීම නතර කරනු ලැබේ.

අදාළ විශ්‍රාමිකයාගේ විශ්‍රාම වැටුප් ලිපිගොනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබුණු පසු නැවත මාසික විශ්‍රාම වැටුප් ගෙවීම හිඟ මුදල ද සමඟ ආරම්භ කරයි. මෙසේ තාවකාලිකව විශ්‍රාම වැටුප අත්හිටුවීම මඟින් පසු විපරම් පරීක්ෂාවක් සිදුවන අතර ද්විත්ව ගෙවීමක් හෝ ව්‍යාජ ගෙවීමක් සිදුවීම වැළකෙනු ඇත.

වගුව 04

| මාසය | සිවිල් | හමුදා | එකතුව |
|---|---|---|---|
| ජනවාරි | 1078 | 750 | 1828 |
| පෙබරවාරි | 1206 | 840 | 2046 |
| මාර්තු | 999 | 909 | 1908 |
| අප්‍රේල් | 859 | 547 | 1406 |
| මැයි | 634 | 458 | 1092 |
| ජූනි | 428 | 384 | 812 |
| ජූලි | 295 | 385 | 680 |
| අගෝස්තු | 1084 | 446 | 1530 |
| සැප්තැම්බර් | 2268 | 775 | 3043 |
| ඔක්තෝබර් | 1457 | 665 | 2122 |
| නොවැම්බර් | 1691 | 546 | 2237 |
| දෙසැම්බර් | 1023 | 682 | 1705 |
| එකතුව | **13022** | **7387** | **20409** |

මූලාශ්‍රය - ලියාපදිංචි අංශය

ප්‍රස්තාර 04




ප්‍රථම ගෙවීම් ක්‍රියාවලිය තුළ ම විශ්‍රාමිකයා වෙත මුදල් ගිණුම්ගත කිරීමේ මූල්‍ය හැසිරවීමේදී දෙපාර්තමේන්තු ගිණුම් අංශය මඟින් මෙකී ගෙවීම්වල නිරවද්‍යතාවය නිරන්තරයෙන් පරීක්ෂාවට භාජනය වේ. එහිදී අදාල මාසය තුළ ප්‍රථම විශ්‍රාම වැටුප් ගෙවීම් ලැයිස්තුව තුළ ද්විත්ව ගෙවීම් වැනි අඩුපාඩු පිරික්සා ගිණුම් අංශයේ දත්ත පද්ධතියට අදාළ ගෙවීම් ඇතුළත් කරන අතර එහි වාර්තාවක් නැවත ලියාපදිංචි අංශයට යවා ගෙවීම් කළයුතු නිවැරදි තොරතුරු බවට නැවත පරීක්ෂා කිරීමක් සිදුවේ. ලියාපදිංචි අංශය මඟින් නැවත සනාථ කිරීමෙන් අනතුරුව ගිණුම් අංශය මඟින් ගෙවීම සඳහා පියවර ගැනීම සිදුවේ.

එහි දී ඒ ඒ බැංකුවලින් මුදල් ලබාගන්නා විශ්‍රාමික ප්‍රජාවගේ තොරතුරු ලැයිස්තු සමඟ ඒ ඒ බැංකුවට අදාල වන සම්පූර්ණ මුදල චෙක්පතක් මඟින් අදාළ බැංකු වෙත යොමු කිරීම සිදුවේ. මෙසේ ප්‍රධාන බැංකු 13 ක් වෙත චෙක්පත් දහතුනක් හා තොරතුරු ලැයිස්තු යවන අතර අනෙක් බැංකු වෙත අදාළ මුදල් බැර කිරීම සඳහා මහජන බැංකුවේ රජින ශාඛාව වෙත අදාල තොරතුරු ඇතුළත් ලිපියක් මඟින් දැනුම් දෙනු ලැබේ. එමෙන් ම තවදුරටත් තැපැල් කාර්යාලයන් මඟින් විශ්‍රාම වැටුප් ලබාගන්නා විශ්‍රාමික ප්‍රජාව වෙත ගෙවීම් සිදුකිරීම සඳහා තැපැල් දෙපාර්තමේන්තු මූලස්ථානය වෙත අදාළ විශ්‍රාමිකයන්ගේ ගෙවීම් තොරතුරු හා මුදල් ලබාගන්නා තැපැල් කාර්යාලයන් ඇතුළත් තොරතුරු සමඟ අදාළ මුළු මුදල සහිත චෙක්පතක් යොමු කරනු ලැබේ.

එහිදී තැපැල් මූලස්ථානය විසින් ඒ ඒ තැපැල් කාර්යාලයන් වෙත විශ්‍රාමික තොරතුරු හා අදාල මුදල් යොමු කරන අතර නියමිත දිනයේ දී තැපැල් කාර්යාලයන් මඟින් විශ්‍රාම වැටුප් ලබාගන්නා සියලු විශ්‍රාමිකයන්ට සිය විශ්‍රාම වැටුප ලබා ගැනීමට අවස්ථාව උදාවේ.

එමෙන් ම ග්‍රාමීය බැංකු හා සණස සමිති මඟින් විශ්‍රාම වැටුප් ලබාගන්නා විශ්‍රාමිකයන්ගේ ගෙවීම් තවදුරටත් ඒ ඒ විශ්‍රාමිකයාට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් මඟින් සිදු කරන අතර ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් වෙත ප්‍රතිපාදන යැවීම සිදුවේ.

මේ මඟින් සමස්ත මූල්‍ය හැසිරවීමේ ක්‍රියාවලිය තවදුරටත් සරල වූ අතර ක්‍රියාවලිය කෙටි වීමත් සමඟ අවම මානව සම්පත් යෙදවීමකින් කටයුතු සියල්ල නිමා කළ හැකි විය. එමෙන් ම එක් බැංකු වක් වෙත එක් චෙක්පතක් පමණක් යැවීම ආදී සරල ක්‍රම යෙදීමෙන් අනවශ්‍ය පිරිවැය යෙදවීම ද වළක්වා ගත හැකි විය.

**ප්‍රස්ථාර 05**




**වගුව 05**

| බැංකුව | විශ්‍රාමිකයන් සංඛ්‍යාව | |
|---|---|---|
| | **2015** | **2016** |
| මහජන බැංකුව | 199826 | 207008 |
| ලංකා බැංකුව | 138456 | 145339 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 70029 | 75176 |
| වෙනත් බැංකු | 152149 | 151985 |
| **එකතුව** | **560460** | **579508** |

මූලාශ්‍රය - ගිණුම් අංශය

## 3.3 වැන්දඹු හා අනත්දරු ප්‍රථම ගෙවීම් ක්‍රියාවලිය

වැන්දඹු අනත්දරු අරමුදලේ දායකයාගේ මියයාමෙන් අනතුරුව වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු හා ආබාධිත යන විශ්‍රාම වැටුප් කාණ්ඩ ඔස්සේ අදාල හිමිකරුවන් වෙත මාසික විශ්‍රාම වැටුප් ගෙවීම සිදුවේ.

ප්‍රස්තාර 06




වගුව 06

| මාසය | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 690 |
| පෙබරවාරි | 740 |
| මාර්තු | 889 |
| අප්‍රේල් | 1054 |
| මැයි | 863 |
| ජූනි | 949 |
| ජූලි | 756 |
| අගෝස්තු | 771 |
| සැප්තැම්බර් | 802 |
| ඔක්තෝබර් | 703 |
| නොවැම්බර් | 831 |
| දෙසැම්බර් | 744 |
| **එකතුව** | **9792** |

මූලාශ්‍රය - වැන්දඹු හා අනත්දරු අංශය

ප්‍රස්ථාර 07




වගුව 07

| මාසය | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවූ මුදල |
|---|---|
| ජනවාරි | 120.55 |
| පෙබරවාරි | 152.89 |
| මාර්තු | 195.95 |
| අප්‍රේල් | 222.46 |
| මැයි | 166.46 |
| ජූනි | 184.11 |
| ජූලි | 143.54 |
| අගෝස්තු | 120.90 |
| සැප්තැම්බර් | 133.65 |
| ඔක්තෝබර් | 122.29 |
| නොවැම්බර් | 141.33 |
| දෙසැම්බර් | 140.11 |
| **එකතුව** | **1,844.24** |

මූලාශ්‍රය - වැන්දඹු හා අනත්දරු අංශය

### 3.3.1 වැන්දඹු හා වැන්දඹු පුරුෂ ප්‍රථම ගෙවීම

දායකයාගේ මියයාමෙන් පසුව වැන්දඹුව හෝ වැන්දඹු පුරුෂයා වෙත මාසික විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කරනු ලැබේ. එහිදී වැන්දඹු අනත්දරු ගෙවීම් ලියාපදිංචි අංකය ලබාදීමෙන් අනතුරුව දායකයා මියගිය දිනට පසු දිනයේ සිට අදාල ගෙවීම් ආරම්භ කරන දිනය දක්වා හිඟ වැටුප ද සමඟ එළැඹෙන මාසයේ විශ්‍රාම වැටුප් ගෙවීම් දිනට කලත්‍රයාගේ බැංකු ගිණුමට සෘජුව ම මුදල් බැර කිරීම සිදුවේ. එහිදී රුපියල් ලක්ෂ දහය දක්වා වන සියලු හිඟ ගෙවීම් මාර්ගගත දත්ත පද්ධතිය අනුව ගෙවීමට කටයුතු කරන අතර රුපියල් ලක්ෂ දහය ඉක්මවූ හිඟ ගෙවීම් ඇති විශ්‍රාමිකයාගේ මාසික විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කර හිඟ වැටුප හිඟ වැටුප් ගෙවීම් කමිටුවේ අනුමැතිය ලැබීමෙන් පසුව ගෙවීමට මූලාශ්‍රය - වැන්දඹු අනත්දරු අංශය වැන්දඹු හෝ වැ: මූලාශ්‍රය - වැන්දඹු අනත්දරු අංශය ම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අදාල දත්ත නිවැරදිව එම මාසයේ 25 වැනි දිනට පෙර දත්ත පද්ධතියට ඇතුළත් කරන්නේ නම් ඊළඟට එළැඹෙන මාසයේ විශ්‍රාම වැටුප් ගෙවීම් දිනයට අදාල විශ්‍රාමිකයාට හිමි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ඔහුගේ හෝ ඇයගේ බැංකු ගිණුමට සෘජුව ම බැර කිරීමට කටයුතු කෙරේ.

### 3. 3.2 අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රථම ගෙවීම.

වැන්දඹු අනත්දරු පනතේ ලියාපදිංචි දායකයා සහ කලත්‍රයා මියගොස් සිටින අවස්ථාවක ඔවුන්ට දාව ඉපදුණු වයස අවුරුදු 26 ට අඩු දරුවන්ට විවාහය නොසලකා රැකියාවක් නොකරන්නේ නම් අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම පවතින්නේ ය. එබැවින් යම්කිසි අවස්ථාවක අනත්දරු විශ්‍රාම වැටුපක් ආරම්භ කිරීමේදී උක්ත සඳහන් වැන්දඹු හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ප්‍රථම ගෙවීම් ක්‍රියාවලිය සිදුවන පරිදි ම මාර්ගගත දත්ත පද්ධතිය මඟින් ගෙවීම් සිදුකිරීම සිදුවේ. එහිදී අනත්දරු විශ්‍රාම වැටුපක් සඳහා පමණක් අදාල වන අනත්දරුවාගේ උප්පැන්න සහතිකය හා රැකියාවක් නොකරන බවට තොරතුරු ඇතුළත් "අනත්වාර්තාව" ප්‍රාදේශීය ලේකම් මඟින් ලබාගැනීම සිදුවේ. අනත්දරු විශ්‍රාම වැටුප ගෙවීමේදී වයස අවුරුදු 18 ට වැඩි අනත් දරුවන් සඳහා සෘජුව ම ඔවුන්ගේ බැංකු ගිණුම වෙත මුදල් බැර කිරීමත් වයස අවුරුදු 18 ට අඩු අනත්දරුවන් සඳහා සුදුසු භාරකාරයකු මඟින් අනත්දරුවා වෙත විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරන අනිවාර්ය මාසික ඉතිරිකිරීමක් සහිතව අනත්දරු විශ්‍රාම වැටුප ගෙවීමට කටයුතු කෙරේ. අනත්දරුවාට වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු භාරකරු මඟින් ගෙවීම් නවතා අනත්දරුවාගේ බැංකු ගිණුමට සෘජුව ම මුදල් බැර කිරීම ආරම්භ කරනු ලැබේ.

### 3. 3.3 ආබාධිත විශ්‍රාම වැටුප් ප්‍රථම ගෙවීම.

ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම සිදුවන්නේ උපතේ දී හෝ වයස අවුරුදු 26 සම්පූර්ණ වීමට පෙර (අනත්දරු වයස් සීමාව තුළ) කායිකව හෝ මානසිකව පූර්ණ හෝ අර්ධ වශයෙන් ආබාධිත තත්ත්වයට පත්ව ඇති වැන්දඹු අනත්දරු දායකයකුගේ දරුවන්ට ය.

ආබාධිත විශ්‍රාම වැටුප් ප්‍රථම ගෙවීම් ක්‍රියාවලියේ දී අදාල ආබාධිත අයගේ ආබාධිත විශ්‍රාම වැටුප් ලිපිගොනු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙන්වාගෙන පරීක්ෂා කර ගෙවීම් සිදුකළ යුතුව පවතින බැවිනුත්, වෛද්‍ය මණ්ඩල වාර්තාවල නිර්දේශ අනුව ගෙවීම් සිදුකළ යුතුව පවතින බැවිනුත් සිදුකරන සෑම ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම් ආරම්භ කිරීමක් ම වෙන වෙන ම පරීක්ෂණ කළ යුතුව පවතින බැවිනුත් ආබාධිත විශ්‍රාම වැටුප් ප්‍රථම ගෙවීම් ක්‍රමය මාර්ගගතව සිදුකළ නොහැකිව පවතී. තවද පූර්ණ කායික හෝ මානසික ආබාධිත තත්ත්වයක් පවතින බවත් ඔහුට හෝ ඇයට ආබාධිත විශ්‍රාම වැටුපක් හිමියයි විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැඟී යන අවස්ථාවල දී අදාල විශ්‍රාම වැටුප හිමි ගැන්වීමට කටයුතු කරන නමුත් ආබාධිත තත්ත්වය නිශ්චය කරගත නොහැකි අවස්ථාවලදී සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් වෛද්‍ය මණ්ඩලයෙන් නිර්දේශ ලබාගෙන ගෙවීම් ආරම්භ කරනු ඇත.

එහිදී සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ආබාධිත පුද්ගලයාට අපහසුතාවයක් නොවන පරිදි ඔහු පදිංචි ස්ථානයට ළඟ ම පිහිටි මූලික රෝහලක දී අවම වශයෙන් වෛද්‍යවරු තිදෙනකුගෙන් යුතු කමිටුවක් මඟින් අදාල නිර්දේශ ලබාගැනීම සිදුවේ. එහිදී මුදල්මය කටයුතු සිදුකිරීමට නොහැකි පුද්ගලයන් වෙත පමණක් භාරකාරයකු පත්කර භාරකරු මඟින් ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම සිදුවේ. මෙහිදී පූර්ණ ආබාධිත පුද්ගලයන් වෙත ජීවිත කාලය පුරා ම ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවන අතර එසේ නොවන අවස්ථාවල දී වසර පහකට වරක් නැවත වෛද්‍ය පරීක්ෂණයක් මඟින් ආබාධිතභාවය පරීක්ෂා කර ගෙවීම් යාවත්කාලීන කිරීමට කටයුතු සිදුවේ.

### 3. 3.4 කලත්‍රයාගේ නැවත විවාහ සඳහා ප්‍රථම ගෙවීම.

වැන්දඹු හෝ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ලබන කලත්‍රයා නැවත විවාහ වන අවස්ථාවන්හිදී විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/2010 ප්‍රකාරව 50% ක වැන්දඹු හෝ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුපක් හිමිවේ. එහිදී කලත්‍රයා නැවත විවාහ වුවත් දායකයා සමඟ වූ විවාහයේ දී වයස අවුරුදු 26 ට අඩු (අනත්දරු වයස් සීමාවේ) රැකියා නොකරන දරුවන් සිටී නම් ඔවුන් වෙත වයස අවුරුදු 26 දක්වා සම්පූර්ණ අනත්දරු විශ්‍රාම වැටුප ගෙවීම සිදුවේ. මෙසේ අනත්දරු හිමිකම සහිත දරුවන් නොසිටී නම් කලත්‍රයා නැවත විවාහ වූ දින සිට 50% ක මාසික වැන්දඹු හෝ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට හිමිකම පවතින්නේ ය.

මෙවැනි අවස්ථාවල දී අදාල කලත්‍රයාගේ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් මාර්ගගත දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට අවශ්‍ය

පහසුකම් සලසා ඇත. එසේ ඇතුළත් කරන තොරතුරු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් පරීක්ෂා කර අදාල වැටුප් ගෙවීමට කටයුතු සිදු කරයි.

මෙසේ විවිධ කාණ්ඩ යටතේ වුවත් සිදු කරන ප්‍රථම ගෙවීම් ක්‍රියාවලියේ මූල්‍ය හැසිරවීමේ ක්‍රියාවලිය දෙපාර්තමේන්තු ගිණුම් අංශය ඔස්සේ සිදුවන අතර විශ්‍රාම වැටුප් ප්‍රථම ගෙවීම් ක්‍රියාවලියේදී විග්‍රහ කළ ආකාරයට ම මෙකී කාණ්ඩයන්හි දී ද සිදුවේ.

එමෙන් ම විශ්‍රාම වැටුප් වැන්දඹු, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් යන සියලු කාණ්ඩයන්හි මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් ඒකීය දත්ත පද්ධතියක් ඔස්සේ සිදුවන අතර එහිදී මූල්‍ය හැසිරවීමේ ක්‍රියාවලිය මාර්ගගත දත්ත පද්ධතිය ඔස්සේ ඉහත විශ්‍රාම වැටුප් ප්‍රථම ගෙවීම් ක්‍රියාවලිය යටතේ විස්තර කර ඇති පරිදි සිදුවන බැවින් මාසික විශ්‍රාම වැටුප ගෙවීමේ වෙන ම ගෙවීම් ක්‍රියාවලියක් පවත්වාගෙන යාමක් හෝ ප්‍රථම ගෙවීම් ක්‍රියාවලියක් වෙන ම පවත්වාගෙන යාමක් සිදුනොවන අතර මෙකී ක්‍රියාවලි ද්විත්වය ම ඒකීය ක්‍රියාවලියක් ලෙස සිදුවේ. එහිදී මාසික ගෙවීම් ක්‍රියාවලිය තුළ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් ඔස්සේ යාවත්කාලීන වන තොරතුරු යාවත්කාලීන කරමින් ගෙවීම් ක්‍රමය පවත්වාගෙන යාම සිදුවේ.

## 04. එක්වරක් පමණක් ගෙවන ප්‍රතිලාභ නියාමනය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් සිදුකෙරෙන ප්‍රධාන ම ගෙවීම් ක්‍රියාවලිය වන විශ්‍රාම වැටුප් ප්‍රථම ගෙවීම් ක්‍රියාවලිය හා එහි මාසික ගෙවීම් ක්‍රියාවලිය හැරුණුකොට එක්වරක් පමණක් ගෙවීම් සිදුකරන ප්‍රතිලාභ නියාමනය කිරීම ද ප්‍රමුඛ කාර්ය භාරයකි. එහිදී දායකත්ව සාමාජිකයන්ගේ දායක මුදල් ආපසු ගෙවීම හා රජය මඟින් ගෙවනු ලැබීමේ හිමිකම සහිතව සිදුකරන ගෙවීම් ද මේ අතර වේ.

### 4. 1 දායකත්ව ප්‍රතිලාභ ගෙවීම

රාජ්‍ය සේවයේ යෙදී සිටින කාලය තුළ තමන්ගේ වේතනයේ  යම් ප්‍රතිශතයකින් දායකත්වය දක්වන ලද අරමුදලක  තමන් සතු අරමුදල් සහ ඊට ම රජය විසින් ගෙවීමට නෛතිකව බැඳී සිටින අරමුදල් හා පොලී මුදල් නිසි සුදුසුකම් සම්පූර්ණ වීම මත ගෙවීමේ අවස්ථාවන් දෙකක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේනතු විෂය පථයට අන්තර්ගත ය. එනම් වැන්දඹු අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම හා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීමයි.

### 4. 1.1 වැන්දඹු හා අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම

වැන්දඹු අනත්දරු ප්‍රතිලාභය සඳහා හිමිකම් ලැබිය හැකි ප්‍රතිලාභීන් නොමැතිවීම හෝ ප්‍රතිලාභීන් සඳහා හිමිකම නොමැතිවීම අදාල දායකයාගෙන් අයකරනු ලැබූ මුදල් එකී දායකයාට ද ඔහු හෝ ඇය මියගොස් ඇති අවස්ථාවක දායකයාගේ උරුමකරුවන්ට ද ගෙවීම සඳහා නෛතික ප්‍රතිපාදන සලසා ඇත.

මෙහිදී අවිවාහක ලෙස රාජ්‍ය සේවය අවසන් කිරීම, දරුවන් නොමැති වැන්දඹු හෝ වැන්දඹු පුරුෂ භාවයෙන් රාජ්‍ය සේවය අවසන් කිරීම, දරුවන් නොමැති දික්කසාද (නියත තීන්දුව ලද) භාවයෙන් රාජ්‍ය සේවය අවසන් කිරීම යන අවස්ථාවලදී එකී තත්ත්වයන් උත්පන්න වන දින සිට අයවී ඇති දායක මුදල් 2.5% ක පොලී මුදලක් ද සහිතව ආපසු ගෙවීම සිදුවේ.

තවද විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබා සේවය අවසන් වන අවස්ථාවකදී අයවූ සියලු දායක මුදල් සහ කලත්‍රයා මියයාම, බාළ දරුවාට වයස අවුරුදු 26 සම්පූර්ණ වීම, බාළ දරුවා රැකියාවක නිරතවීම යන සිදුවීම් ත්‍රිත්වයෙන් දායකයා අවසන් වරට අත්විඳින සිදුවීම සිදු වූ දින සිට අයවූ දායක මුදල් ද පොලී රහිතව ආපසු ගෙවීමේ විධිවිධාන පවතී.

වැන්දඹු අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම, ගෙවීම් ක්‍රියාවලි තුනක් යටතේ සිදුවේ. එහිදී අදාල ගෙවීම් ක්‍රියාවලිය තීරණය වන්නේ දායකයා විශ්‍රාම ලබන දිනය අනුව ය. වසර 2015.01.01 දිනට පෙර

විශ්‍රාම ලබා දායක මුදල් ඉල්ලීම් සිදුකරන දායකයන් වෙනුවෙන් දායක මුදල් ගෙවීමේ ක්‍රියාවලිය දීර්ඝ වූ ක්‍රියාවලියකි. මේ වනවිට ද වසර 2015.01.01 ට පෙර විශ්‍රාම ලැබූවන් දායක මුදල් ආපසු ගෙවීම් සඳහා ඉල්ලීම් සිදුකරන බැවින් හා සේවයෙන් ඉල්ලා අස්වන, සේවයෙන් පහකරන හා සේවයේ යෙදී සිටියදී මියයන දායකයන් වෙනුවෙන් ගෙවීම් සිදුකිරීම සඳහාත් මේ ක්‍රියාවලිය තවදුරටත් පවත්වාගෙන යාමට සිදුව ඇත.

එහිදී හිමිකම්ලාභියා අයදුම්පත්‍රයක් මගින් දායක මුදල් ආපසු ලබාගැනීම සඳහා අයදුම් කළයුතු අතර තැපැල් මාර්ගයෙන් හෝ ගෙනැවිත් බාරදීම මගින් එකී අයදුම්පත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලැබීම සිදුවිය යුතු ය. එහිදී එම අයදුම්පත සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු ආරම්භ කරන අතර ඔහුට හෝ ඇයට අදාල වැන්දඹු අනත්දරු ගොනුව පරීක්ෂා කර හිමිකම්ලාභියා වෙත හා ඔහු හෝ ඇය අවසන් වරට සේවය කළ ආයතනය වෙත අදාල ආකෘති පත්‍ර හා ලියවිලි තැපැල් කිරීම සිදුවේ. මේ සියලු ආකෘති පත්‍ර හා ලියවිලි සම්පූර්ණ කර නැවත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලැබීමෙන් අනතුරුව ඒවා පරීක්ෂා කර අදාල ගණනයන් කිරීමෙන් අනතුරුව ගෙවීම් තහවුරු කර හිමිකම්ලාභියා වෙත අදාල මුදල් ගෙවීම සිදුවේ.

මීට අමතර ව 2015.01.01 දින සිට 2015.10.31 දින දක්වා විශ්‍රාම ලැබූවන් සඳහා වැන්දඹු අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම් සිදුවන්නේ වෙනත් ක්‍රියාවලියක් යටතේ ය. එහිදී හිමිකම්ලාභියා තමන් අවසන්වරට සේවය කළ ආයතනය වෙත අදාල අයදුම්පත ඉදිරිපත් කිරීම කළ යුතු ය. එහිදී අදාල ලිපිගොනු හා ලියවිලි සියල්ල පරීක්ෂා කර එකී ආයතනය විසින් ගෙවීම් තහවුරු කරගෙන දායකයා වෙත ගෙවීම් සිදු කිරීම සිදුවේ. පසුව එකී මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිපූරණය කිරීම සිදුවේ. මේ සමස්ත ක්‍රියාවලිය සති තුනක පමණ කාලයක් හෝ ඊට අඩු කාලයක් ඇතුළත සිදු කළ හැකි වන අතර ඒ මගින් වඩාත් කාර්යක්ෂම ව දායකයා වෙත අදාල මුදල් ලබාදීම සිදුකළ හැකි ය.

එමෙන් ම 2015.11.01 සිට මේ දක්වා විශ්‍රාම ලබන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ දායකයන් වෙත දායක මුදල් ආපසු ගෙවීමේ අවස්ථාවක දී ඒ සඳහා ඉල්ලුම් කිරීම විශ්‍රාම වැටුප් ලියාපදිංචිය සඳහා වන PD 3 ආකෘති පත්‍රයේ IV වැනි කොටස මගින් කළ යුතු ය. එකී කොටස සම්පූර්ණ කර දායකයා අවසන් වරට සේවය කළ ආයතනය මගින් වාර්ෂික දායක මුදල් අයවීම් විස්තර ද පොලී ගෙවීම් හිමිකම ඇත්නම් පොලී ගණනයේ පිටපත ද සිවිල් තත්ත්වය තහවුරු කරගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා සහතික කරන ලද ලේඛන ද යන විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 2/2015 හි ඇමුණුම් සහිතව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත අයදුම් කළ යුතු ය. එහිදී දායක මුදල් ලබාගැනීමේ හිමිකම සනාථ කරන ලේඛනයන් වන විවාහක නම් කලත්‍රයාගේ මියයාමක දී මරණ සහතිකය, දික්කසාදයක දී නම් නියත තීන්දු පිටපත, බාල දරුවාගේ උප්පැන්න සහතිකය හෝ බාලදරුවාගේ රැකියා පත්වීම් ලිපියේ පිටපත යන ලේඛන ද මෙහි දී පරීක්ෂාවට ලක්කෙරේ.

මෙසේ දායක මුදල් ඉල්ලීම් කරන දායකයාගේ වැන්දඹු අනත්දරු ගොනුව ලේඛනාගාරයෙන් ලබාගෙන අදාල තොරතුරු පරීක්ෂා කිරීම සිදුවේ.

එහිදී මාර්ගගත ක්‍රමය ඔස්සේ වැන්දඹු අනත්දරු අංක ලබාගත් දායකයන්ගේ ගොනුවක් නඩත්තු නොවන බැවින් එවැනි දායකයාගේ තොරතුරු මාර්ගගත දත්ත පද්ධතිය ඔස්සේ පරීක්ෂා කර එහි පිටපතක් බාගත කර ගොනුවක් නිර්මාණය කර ගැනීම සිදුවේ. මෙසේ ගොනුගත තොරතුරු පරීක්ෂා කර ගණනය කිරීම් නිවැරදි නම් චෙක්පත් මඟින් දායකයාගේ ගිණුම වෙත අදාල මුදල් බැර කිරීම සිදුවේ. එසේ ගෙවීම් සිදුකිරීම පිළිබඳව දායකයාටත් ඔහු හෝ ඇය අවසන් වරට සේවය කළ ආයතනයටත් ලිපියක් මඟින් දැනුම්දීම ද සිදුවේ.

තව ද මෙහිදී ද්විත්ව ගෙවීමක් සිදු නොවන ලෙසට ලිපිගොනුවේ ගිණුම් කාඩ්පත, පොදු 86 හෝ පොදු 86 'අ' ආකෘතිපත්‍ර ඇතුළු ගොනුවට අදාල සියලු ලේඛනවල සීල් තබා මාණ්ඩලික නිලධාරියකු අත්සන් තබා මුදල් ගෙවූ ගොනුවක් බවට සහතික කරන අතර මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි වූ දායකයන්ගේ මාර්ගගත දත්ත පද්ධතිය තුළට ගෙවීම් වව්චරය හා ශාඛාවේ විගණන වාර්තාව පරිලෝකනය කර ඇතුළත් කරනු ලැබේ. මීට අමතරව ගෙවීම් ලේඛනයක් ද නඩත්තු වන බැවින් මේ දායක මුදල් ද්විත්ව ගෙවීමක් සිදු නොවන ලෙස ගෙවීම් පද්ධතිය සකසා ඇත.

### 4.1.2 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම

වර්ෂ 1942 අංක 18 දරණ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත යටතේ සාමාජිකත්වය ලැබූ සාමාජිකයන්ගේ අවසන් ප්‍රතිලාභ ගෙවීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අංශය මඟින් ක්‍රියාත්මක කරයි.

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලියාපදිංචි වූ සාමාජිකයකුට අනියම් සේවයේ සිට ස්ථිර පත්වීම, විශ්‍රාම වැටුප් රහිත රාජ්‍ය සේවකයකු සේවය අවසන් කිරීම, තනතුර අහෝසි වීම, සේවය හැරයාම, සේවයෙන් පහකිරීම යන අවස්ථාවලදී රාජ්‍ය අර්ථසාධක ආඥා පනතේ අදාල විධිවිධාන පරිදි අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ලැබිය හැකි ය. එමෙන් ම විශ්‍රාම වැටුප් රහිත පත්වීමක් ලැබූ රාජ්‍ය සේවකයකු මියයාමකදී ද එකී සාමාජිකයාගේ උරුමකරුවන්ට අදාල අර්ථසාධක ප්‍රතිලාභ ලබා ගැනීමේ හිමිකම ඇත.

මේ ප්‍රතිලාභ ගෙවීම රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතේ වගන්ති තුනක් යටතේ ගෙවීම සිදුවේ. එහිදී වයස අවුරුදු හැට සම්පූර්ණ වූ අනියම්, ආදේශක හෝ කොන්ත්‍රාත් පත්වීම් ලැබූ රාජ්‍ය සේවකයන් වෙත හා එකී පත්වීම් ලැබූ රාජ්‍ය සේවකයන්ගේ සේවා කාලය අවසන් වීම මත ප්‍රතිලාභ ගෙවීම රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතේ 14වැනි වගන්තියට අනුකූලව සිදුවේ. එහිදී දායකයාගෙන් අය වූ අනිවාර්ය දායක මුදල හා රජයේ ප්‍රසාද මුදලත් ඒ දායක මුදල් සඳහා වූ පොලී මුදලත් දායකයා වෙත

හිමිවේ. විනය විරෝධි ක්‍රියා හේතුවෙන් වැඩ තහනමට ලක් වන හෝ සේවය අත්හිටුවනු ලබන දායකයන් වෙනුවෙන් එකී පනතේ 16 වැනි වගන්තිය ක්‍රියාත්මක වන අතර එවැනි දායකයන් වෙත අනිවාර්ය දායක මුදල හා පොලී මුදල පමණක් හිමිවේ. තවද අනියම්, ආදේශක හෝ කොන්ත්‍රාත් පත්වීම් ලබා සිට රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් ලබන දායකයන් වෙත දායක මුදල් ආපසු ගෙවීම පනතේ 20 වැනි වගන්තිය යටතේ සිදුවන අතර එවැනි අවස්ථාවලදී ද අනිවාර්ය දායක මුදල හා පොලී මුදල පමණක් ගෙවනු ලැබේ.

මීට අමතරව සදොස් අයකිරිම්වලදී එකී දායකයන් වෙනුවෙන් පොලී රහිතව අයකරගත් දායක මුදල පමණක් ගෙවීම සිදුවේ.

මෙසේ දායකයන් වෙනුවෙන් පොලී ගෙවීමේදී පොලිය තීරණය වන්නේ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ආයෝජනවලින් ඒ ඒ වසරවලදී ලැබූ පොලී ප්‍රතිශතයයි. ඒ ඒ වසර සඳහා ලැබුණු පොලී ප්‍රතිශතයන් අදාල දායකයා වෙත ප්‍රතිලාභ ගෙවීමේදී ගණනය කර ගෙවීම සිදුවේ. ඒ අනුව වසර 2016 දී පොලිය වශයෙන් 12.34% ක පොලී ප්‍රතිශතයක් ගෙවීමට හැකි වූ අතර එය මෙතෙක් වාර්තා වූ ඉහළ ම පොලී ප්‍රතිශතය බවට වාර්තාගත ය.

මෙසේ දායකයකු සිය අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා තමන් සේවය කළ ආයතනය මඟින් PD P1 P සහ PDP2 P යන අයදුම්පත් මඟින් අයදුම් කළ යුතු ය. මෙසේ අයදුම් කරන සාමාජිකයන් වෙනුවෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අංශයේ ගෙවීම් ගොණුවක් විවෘත වන අතර පරිගණක ගත දත්ත පද්ධතියේ අදාල දායකයාගේ සාමාජික අංකය යටතේ ලබා ගන්නා වාර්තාව හා ආවරණ වාර්තා සමඟ සසඳමින් පරීක්ෂා කරනු ලැබේ. අංශ ප්‍රධානීගේ අධි නිරීක්ෂණයෙන් හා ලේකම් හා ගණකාධිකාරීගේ අනුමැතිය මඟින් එකී ප්‍රතිලාභ ගෙවීම සිදු වේ. එකී ප්‍රතිලාභයන්ගෙන් රජයට අයවීම් ඇති සමාජිකයන්ගේ හා රජයේ ස්ථිර පත්වීම් ලැබූ සාමාජිකයන්ගේ ප්‍රතිලාභ ගෙවීම ඔවුන් රාජකාරි සිදු කළ ආයතනය මඟින් ගෙවීම් කිරිම සඳහා එකී ආයතන වෙත චෙක්පත් මඟින් යොමු කරන අතර අනෙක් සාමාජිකයන්ගේ ප්‍රතිලාභ මුදල් ඍජුව ම ඔවුන්ගේ පෞද්ගලික බැංකු ගිණුම් වෙත බැර කෙරේ. එසේ මුදල් ඍජුව ම බැංකු ගිණුම්ගත කරන අවස්ථාවේ දී දායකයා වෙත හා ආයතනය වෙත ප්‍රදාන පත්‍රයක් තැපැල මඟින් නිකුත් කර දැනුම්වත් කිරීම ද සිදුවේ. තවද ද්විත්ව ගෙවීම් සිදු නොවන ලෙස සාමාජික ලේඛනයේ ගෙවීම් සිදුකළ සාමාජිකයාගේ සාමාජික අංකය ඉදිරියෙන් සටහනක් යෙදීම විගණනයේදී සිදු කෙරේ. මෙකී ගෙවීම් ක්‍රියාවලිය වසර 2017 දී සම්පූර්ණයෙන් ම මාර්ගගත දත්ත පද්ධතියක් ඔස්සේ ක්‍රියාත්මක් කිරීමට මේවන විට කටයුතු සම්පාදනය කරමින් පවතී.

### 4. 2 එක් වරක් ගෙවන රාජ්‍ය ප්‍රදානයන් නියාමනය.

රජය විසින් නෛතිකව පනවනු ලැබූ නිශ්චිත රාජ්‍යසේවා කාලයක් සම්පූර්ණ කිරීම මත රජය විසින් ප්‍රදානය කරනු ලබන එක්වරක් පමණක් ගෙවන ප්‍රතිලාභයන් නියාමනය කිරිම ද විශ්‍රාම

වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යභාරයකි. ඒ අනුව විවිධ කාණ්ඩ යටතේ රජයේ දායකත්වයෙන් සිදුකරන ප්‍රදානයන් ඇත.

ප්‍රස්ථාර 08




වගුව 08

| බැංකුව | පාරිතෝෂික ගෙවීම් (රු.මිලියන) 2015 | පාරිතෝෂික ගෙවීම් (රු.මිලියන) 2016 |
|---|---|---|
| මහජන බැංකුව | 4,162.64 | 5,839.82 |
| ලංකා බැංකුව | 3,700.77 | 4,740.43 |
| ජාතික ඉතිරිකිරිමේ බැංකුව | 1,878.91 | 2,400.92 |
| **එකතුව** | **9,742.31** | **12,981.17** |

මූලාශ්‍රය - ලියාපදිංචි අංශය

ප්‍රස්ථාර 09




වගුව 09

| මාසය | මරණ පාරිතෝෂික | මරණ පාරිතෝෂික සංශෝධන |
|---|---|---|
| ජනවාරි | 81 | 6 |
| පෙබරවාරි | 80 | 6 |
| මාර්තු | 85 | 14 |
| අප්‍රේල් | 88 | 12 |
| මැයි | 75 | 23 |
| ජූනි | 72 | 14 |
| ජූලි | 82 | 14 |
| අගෝස්තු | 112 | 26 |
| සැප්තැම්බර් | 107 | 23 |
| ඔක්තෝබර් | 122 | 18 |
| නොවැම්බර් | 86 | 27 |
| දෙසැම්බර් | 86 | 25 |
| **එකතුව** | **1076** | **208** |

මූලාශ්‍රය - ගිණුම් අංශය

රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබන නිලධාරීන්ට සිය මනාපය පළකිරීම මත විශ්‍රාම පාරිතෝෂිකය ලබා ගැනීමේ හිමිකම ඇත. එහිදී එකී නිලධාරියාට හිමි මූලික විශ්‍රාම වැටුප මෙන් 24 ගුණයක මුදලක් විශ්‍රාම පාරිතෝෂිකය ලෙස ගණනය කරන අතර විශ්‍රාම වැටුප් ලියාපදිංචිය මාර්ගගත ක්‍රමයට සිදු කිරීම ආරම්භ කිරීමත් සමඟ එකී ක්‍රියාවලියේ කොටසක් ලෙස විශ්‍රාම වැටුප මෙන් ම විශ්‍රාම පාරිතෝෂිකය ගෙවීමේදී සෘජුව ම අදාල අයගේ බැංකු ගිණුමට බැර කෙරේ. එහිදී ගෙවීම් සිදුකරන බැංකු වෙත වෙන වෙන ම චෙක්පත් යැවීම වෙනුවට විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගෙවීම් ලැයිස්තු යැවීම මගින් කඩිනමින් විශ්‍රාම පාරිතෝෂික මුදල් ගෙවනු ලැබේ.

මීට අමතරව රාජ්‍ය සේවයේ සිටියදී මියයන නිලධාරීන් වෙනුවෙන් මියගිය දිනය විශ්‍රාම ගිය දිනය සේ සලකා එදිනට ලබන විශ්‍රාම පාරිතෝෂිකය හෝ මියගිය නිලධාරියාගේ වාර්ෂික වැටුප යන දෙකින් වැඩි අගය මරණ පාරිතෝෂිකය ලෙස මියගිය අයගේ යැපෙන්නන්ට ගෙවීම් සිදුවේ. මෙහිදී සම්පූර්ණ කරන ලද PD6 ආකෘති පත්‍රය යැපෙන්නන් මඟින් ලබා ගන්නා අතර එහි තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කර සෘජුව ම යැපෙන්නන්ගේ ගිණුමට අදාල මුදල් බැර කිරීමට කටයුතු යොදන ලදි. මීට පෙර සිදුවූ මරණ පාරිතෝෂික ගෙවීම් ක්‍රියාවලියේ දී අදාල නිලධාරියා සේවය කළ ආයතනය වෙත ගෙවීම් සිදුකර ආයතනය මඟින් යැපෙන්නන්වෙත ගෙවීමට කටයුතු කළ අතර එහිදී යැපෙන්නන් වෙත මුදල් ලැබීමේ දී සැලකිය යුතු කාලයක් ගත වන බැවින් මේ ක්‍රමය මගින් එක් අමතර කාලයක් වැයවීම වළක්වා ගෙන සෘජුව ම මුදල් ප්‍රේෂණය කළ හැකි වේ.

තවද මාස 120 ක සේවා කාලයක් සම්පූර්ණ නොකොට විශ්‍රාම ලබන නිලධාරීන් වෙනුවෙන් ගෙවනු ලබන සේවා පාරිතෝෂිකය ද රාජකාරියේ සිටියදී සිදුවන හදිසි ආපදාවක් හේතුවෙන් මිය යන හෝ ආබාධිත තත්ත්වයට පත්වන රාජ්‍ය සේවකයන්ට හා එසේ මිය යන සේවකයන් වෙනුවෙන් ඔවුන්ගේ යැපෙන්නන්ට ගෙවන විශේෂ වන්දි යන එක් වරක් පමණක් සිදුකරන ගෙවීම් ද මේ අතර වේ.

එහිදී සේවා පාරිතෝෂිකය මේ වනවිට සෘජුව ම අදාල පුද්ගලයාගේ ගිණුමට බැර කිරීමට මේ වනවිට කටයුතු යොදා තිබෙන අතර විශේෂ වන්දි තවදුරටත් අදාල ආයතනය මඟින් ගෙවීමට කටයුතු සලකා ඇත. ඉදිරියේ දී මේ සියලු ගෙවීම් ක්‍රම මාර්ගගත දත්ත පද්ධතියක් ඔස්සේ සිදුකිරීම සඳහා අවධානය යොමු වී ඇත.

ප්‍රස්ථාර 10



වගුව **10**

| පාරිතෝෂිකය | මුදල (රු.මිලියන) |
|---|---|
| සිවිල් | 8657 |
| සන්නද්ධ සේවා | 4958 |
| ගණන් බැලීම් | 381 |
| මරණ | 330 |
| වෙනත් | 1065 |
| **එකතුව** | **15391** |

මූලාශ්‍රය - ගිණුම් අංශය

## 5. විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම් නියාමනය

විශ්‍රාමිකයකු වසර තුනක් හෝ ඊට වැඩි කාලයක් සඳහා විදේශගත වන අවස්ථාවල දී එවැන්නකුගේ විශ්‍රාම වැටුප් ගෙවීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ විදේශ විශ්‍රාම වැටුප් ශාඛාව මඟින් සිදු කෙරේ.

මෙහිදී විවැ/උපදෙස් ලිපි අංක 03/2016 ප්‍රකාරව වසර තුනක් දක්වා කාලයක් සඳහා විදේශගත වන විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් මඟින් ලබා ගැනීමේ අවස්ථාවත් වාර්ෂික ජීවිත සහතිකය Skype තාක්ෂණය ඔස්සේ ලබාදීමේ අවස්ථාවත් වසර 2016 දී උදාකර දී ඇත.

වසර 03ක් හෝ ඊට වැඩි කාලයක් සඳහා විදේශ ගත වන විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු විදේශ විශ්‍රාම වැටුප් ශාඛාව වෙත අදාළ තොරතුරු යොමු කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් කළ යුතු අතර එකී තොරතුරු යොමු කිරීම සඳහා වූ ආකෘති පත්‍ර සියල්ල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකි වේ.

මෙසේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් දැනුම්වත් කර විශ්‍රාම වැටුප විදේශ විශ්‍රාම වැටුප් ශාඛාව වෙත යොමු කිරීමකින් තොරව විදේශගත වන විශ්‍රාමික ප්‍රජාවට සිය විශ්‍රාම වැටුප තමා පදිංචි රටේ සිට ම විදේශ විශ්‍රාම වැටුප් ශාඛාව වෙත යොමු කිරීමේ හැකියාව ද පවතී. ඒ සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියෙන් අදාළ දත්ත පත්‍රිකා ලබා ගෙන නිසි පරිදි සම්පූර්ණ කර එම රටේ ශ්‍රී ලංකා මහා කොමසාරිස් කාර්යාලය හෝ කොන්සියුලර් ජෙනරාල් කාර්යාලයක් මඟින් සහතික කර විදේශ විශ්‍රාම වැටුප් ශාඛාව වෙත එවිය යුතු ය.

මෙසේ විදේශ විශ්‍රාම වැටුප් අංශය මඟින් විශ්‍රාම වැටුප ලබා ගන්නා විශ්‍රාමික ප්‍රජාව වෙත දේශීය බැංකු 4ක් ඔස්සේ සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය ඔස්සේ ඕස්ට්‍රේලියාව, ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, ඉන්දියාව, එක්සත් රාජධානිය යන රටවල පිහිටි ශ්‍රී ලංකා කොන්සියුලර් කාර්යාල ඔස්සේ ගෙවීම සිදු වේ. මෙහිදී විදේශ රටවලට දේශීය මුදල් ගලා යාම අවම කිරීම සඳහා, විදේශ දූත මණ්ඩල ඔස්සේ විශ්‍රාම වැටුප ලබා දීම සීමා කරමින් දැනට එසේ විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයන් හැර අනෙක් සියලු විදේශ ගත විශ්‍රාමිකයන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම දේශීය බැංකු මඟින් පමණක් සිදු කිරීමට වසර 2016 දී තීරණ ගන්නා ලදී.

එහිදී දේශීය බැංකු වන ලංකා බැංකුවේ මෙට්‍රොපොලිටන් ශාඛාව, මහජන බැංකුවේ රැජිණ ශාඛාව, පැන්ඡ්ෂියා බැංකුවේ බොරැල්ල ශාඛාව හා හැටන් නැෂනල් බැංකුවේ මාලිගාවත්ත ශාඛාව මඟින් විදේශ ගත විශ්‍රාමියන් වෙත විශ්‍රාම වැටුප් ලබා ගත හැකි වන අතර ඒ ඒ බැංකුවලට අදාළව ගිණුම් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ද විශ්‍රාම වැටුප් නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකි ය.

මෙසේ විදේශ විශ්‍රාම වැටුප් ලබන විදෙස් ගත විශ්‍රාමිකයන් සෑම වසරකට වරක් (මාර්තු 31ට පෙර) තමා පදිංචි රටෙහි ශ්‍රී ලංකා මහා කොමසාරිස් කාර්යාලයක් හෝ කොන්සියුලර් කාර්යාලයක් මඟින් සහතික කළ ජීවිත සහතිකයක් විදේශ විශ්‍රාම වැටුප් ශාඛාව වෙත යොමු කළ යුතු ය. එසේ නොමැති නම් Skype තාක්ෂණය ඔස්සේ විදේශ විශ්‍රාම වැටුප් ශාඛාවේ නිලධාරියෙකු හා සම්බන්ධ වී පවත්වන සම්මුඛ සාකච්ඡාවක් මඟින් ජීවිත සහතිකය ලබා දිය හැකි ය. එහිදී අදාළ විශ්‍රාමිකයාගේ ඡායාරූපය හා අත්සන Skype තාක්ෂණය ඔස්සේ ලබා ගනී. මෙසේ ලබා ගන්නා සියලු ජීවිත සහතික අදාළ විශ්‍රාමිකයාගේ ඡායාරූපයක් සහිතව දත්ත පද්ධතියට ඇතුළත් කරන අතර එය ඉදිරි කාලයේ දී විශ්‍රාමිකයා සිදු කරන විමසීම්වලදී හඳුනා ගැනීම පහසු කරනු ඇත.

තවද මෙසේ විදේශගත විශ්‍රාමිකයකු නැවත ශ්‍රී ලංකාවේ පදිංචියට පැමිණීමෙන් පසු පදිංචිය සනාථ කිරිමේ ග්‍රාම නිලධාරි සහතිකයක් ඉදිරිපත් කර තමාගේ පදිංචියට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත විශ්‍රාම වැටුප් ලිපිගොනුව මාරු කර ගත යුතු ය.

මීට අමතරව විදේශ ගත විශ්‍රාමිකයන්ගේ ලිපි ගොනු ඇතුළත් ලේඛනාගාරය දත්ත පද්ධති ගත කිරීම 2016 වසරේදී සිදු වු අතර ඒ මඟින් කාර්යක්ෂමව ලිපිගොනු සෙවීම කළ හැකි වේ. තවද විශ්‍රාමිකයකු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුම්වත් කර විදේශ ගත වන අවස්ථාවලදී විශ්‍රාම වැටුප් ගෙවීම තාවකාලිකව නවතා ලිපිගොනුව විදේශ විශ්‍රාම වැටුප් ශාඛාව වෙත එවා නැවත විදේශ විශ්‍රාම වැටුපක් ලෙස හිඟ මුදල් සහිතව ආරම්භ කිරිමේ පැරණි ක්‍රමය වෙනුවට 2016 වසරේදී මධ්‍යගත දත්ත පද්ධතිය ඔස්සේ සෘජුව ම විශ්‍රාම වැටුප විදේශ ශාඛාව වෙත මාරු කිරිම සිදු කරන බැවින් විශ්‍රාමිකයා වෙත අඛණ්ඩව විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කළ හැකි වී ඇත. එමෙන් ම නැවත ශ්‍රී ලංකාවේ පදිංචියට පැමිණි පසු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට විශ්‍රාම වැටුප මාරුකිරීම ද මාර්ගගත ක්‍රමයට මධ්‍යගත දත්ත පද්ධතිය ඔස්සේ සිදු කිරීමෙන් කාර්යක්ෂම ව මේ සියලු කටයුතු සිදු කරගත හැකි වේ.

## 6. සමුච්චිත ලැබීම් නියාමනය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලැබෙන දායක අරමුදල් මෙන් ම, ගොඩනැගිලි කුලී හා නිවාඩු නිකේතන ආදායම් ආදී වූ මූල්‍යමය ලැබීම් විධිමත් පරිදි නියාමනය කිරීමද 2016 වර්ෂයේදී ප්‍රමුඛ කාර්යයක් වශයෙන් ක්‍රියාත්මක විය.

### 6.1 වැන්දඹු හා අනත්දරු දායක මුදල් ලැබීම් නියාමනය

වර්ෂ 1898 අංක 01 දරණ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත මඟින් සිවිල් රාජ්‍ය නිලධාරීන් ද 1970 අංක 18 දරණ වැන්දඹු හා අනත්දරු ( සන්නද්ධ හමුදා ) පනත හා 1998 අංක 60 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු (සන්නද්ධ හමුදා) මඟින් සන්නද්ධ හමුදා නිලධාරීන්ද වැන්දඹු අනත්දරු දායක අරමුදලේ සාමාජිකත්වය ලබන්නේ ය. ඒ අනුව මෙකී නිලධාරීන්ගේ මාසික වැටුපෙන් ප්‍රාථමික හා ද්වීතික මට්ටමේ නම් 6% ක මුදලක් ද තෘතීක හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ නම් 7% ක මුදලක් ද වැන්දඹු අනත්දරු දායක අරමුදල වෙත බැර කිරීම සිදුවන්නේ ය. එය මධ්‍යම රජයේ ආයතන වෙතින් හර සටහන් මඟින් මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සිදුවන අතර පළාත් පාලන ආයතන විසින් චෙක්පත් මඟින් මහජන බැංකුවේ පළමු නගර ශාඛාවේ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ නමින් ඇති ගිණුමට බැර කරනු ලැබේ. වැන්දඹු අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම සඳහා ද මෙකී මුදල් ම නැවත යොදා ගැනීම සිදුවේ.

**ප්‍රස්තාරය 11**




**වගුව 11**

| පළාත | ආදායම (රු.මිලියන) 2016 |
|---|---|
| බස්නාහිර පළාත | 1,296.01 |
| දකුණු පළාත | 772.03 |
| මධ්‍යම පළාත | 815.47 |
| ඌව පළාත | 483.38 |
| සබරගමුව පළාත | 551.82 |
| වයඹ පළාත | 787.87 |
| උතුරු මැද පළාත | 428.49 |
| උතුරු පළාත | 473.61 |
| නැගෙනහිර පළාත | 480.45 |
| **එකතුව** | **6,089.14** |

මූලාශ්‍රය - ගිණුම් අංශය

## 6.2 රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ලැබීම නියාමනය

වර්ෂ 1942 අංක 18 දරණ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත ප්‍රකාරව රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලැබූ නිලධාරීන්ගේ මාසික වැටුපෙන් 8% ක අනිවාර්ය දායක මුදලක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට අයවන අතර එම මුදල එකී නිලධාරියා සේවය කරන ආයතනය මඟින් අයකර චෙක්පත් මඟින් සෑම මසකම 08 වැනි දිනට පෙර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අංශය වෙත එවනු ලැබේ. මීට අමතරව රජයේ දායකත්වය වන නිලධාරියාගේ මාසික වැටුපෙන් 12% ක මුදල ද චෙක්පත් මඟින් මාසිකව ලැබෙන අතර මේ සියලු චෙක්පතක් රාජ්‍යසේවා අර්ථසාධක අරමුදලේ ලැබීම් ලෙස ගිණුම්ගත කෙරේ. රාජ්‍ය සේවා අර්ථසාධක ප්‍රතිලාභ ගෙවීම මේ ආදායම් මඟින් සිදුකරන බැවින් අරමුදල් ආපසු ගෙවීමට අවශ්‍ය ප්‍රමාණයේ මුදල් හැර ඉතිරි සියලු මුදල් ආයෝජනය කිරීම සිදුවේ. භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හා ස්ථාවර තැන්පතු වශයෙන් මෙම මුදල් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව එහි සභාපති වන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියෙන් ආයෝජනය කිරීම සිදුවේ. වසර 2016 දී මෙසේ චෙක්පත් මඟින් දායක මුදල් එවන ආයතන වර්ගීකරණයක් කර සංකේත අංකයක් ලබාදෙමින් මෙකී ලැබීම් තවදුරටත් විධිමත් ලෙස නියාමනය කිරීමට හැකිවූ අතර එය මූල්‍ය පරිපාලනය පහසු කරන්නක් විය.

## 6.3 ගොඩනැගිලි කුලී ආදායම්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පවත්වාගෙන යාමට අවශ්‍ය ඉඩ ප්‍රමාණයට අමතරව ඇති ඉඩකඩ වෙනත් ආයතන 16 ක් වෙත කුලී පදනම මත ලබාදී ඇති බැවින් ඒ මඟින් මාසිකව ආදායම් උපයා ගැනීමට සමත්ව ඇත.

**ප්‍රස්තාරය 12**

**ගොඩනැගිලි කුලී ලැබීම %**



වගුව **12**

| **ආයතනයේ නම** | **බිම් ප්‍රමාණය %** | **ගොඩනැගිලි කුලී ලැබීම් (රු )** |
|---|---|---|
| ආයුර්වේද ඖෂධ සංස්ථාව | 0.42 | 100,000 |
| හයිලන්ඩ් කිරිහල | 0.48 | 115,500 |
| සම්පත් බැංකුව A T M | 1.03 | 246,000 |
| හැටන් නැෂනල් බැංකුව | 8.30 | 1,980,000 |
| හැටන් නැෂනල් බැංකුව ATM | 1.01 | 240,000 |
| රාජ්‍ය සේවා විශ්‍රාමිකයින්ගේ භාර අරමුදල | 0.50 | 120,000 |
| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | 14.33 | 3,420,000 |
| ලංකා හොස්පිටල් (පුද්) සමාගම | 1.51 | 360,000 |
| පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව | 6.11 | 1,457,951 |
| මෝටර් රථ ප්‍රවාහන පළාත් කොමසාරිස් කාර්යාලය | 32.69 | 7,800,000 |
| ආපන ශාලාව | 1.51 | 360,000 |
| පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (බ.ප.) | 12.57 | 3,000,000 |
| සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය (බ.ප.) | 15.84 | 3,780,000 |
| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය II කොටස | 3.27 | 780,000 |
| රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව | 0.42 | 100,000 |
| | 100.00 | 23,859,451 |

මූලාශ්‍රය - පාලන අංශය

## 6.4 නිවාඩු නිකේතන ආදායම්

හෙක්ටයාර 3.0575 ක වපසරියකින් යුතු භූමි භාගයක පිහිටි කැලණිය වෙදමුල්ල නිවාඩු නිකේතනය විශ්‍රාමික ප්‍රජාව, රාජ්‍ය සේවක ප්‍රජාව හා වෙනත් බාහිර පුද්ගලයින් වෙත ලබාදීම මඟින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ආදායම් උපයා ගැනීමට සමත් වී ඇත. එහි දී බිම් මහලේ හා උඩු මහලේ කාමර 18 ක් තනි නිවාස 4ක් යුගල නිවාස 3ක් හා මිතුපියස මෙන් ම අංග සම්පූර්ණ ප්‍රධාන ශාලාව දේශන ශාලාව හා භෝජනාගාරය ද ගෙවත්ත ඇතුළු සියලු පහසුකම් සේවා දායකයන්ට ලබාදීම සිදුවේ. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණයෙන් යුතු කමිටුවක් මඟින් මේ පහසුකම් සැපයීම සම්බන්ධයෙන් වන ගාස්තු නිර්දේශ කරන අතර රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියෙන් විශ්‍රාමික ප්‍රජාව වෙත සහනදායී ක්‍රමයකටත් රාජ්‍ය නිලධාරීන් සඳහා වෙනම මිලකටත් මේ සේවාවන් ලබාදීම සිදුවේ. ඒ අනුව වෙදමුල්ල නිවාඩු නිකේතනය සේවා සැපයීම මඟින් 2016 වසර තුළ රු.3,012,765.56 ක මුදලක් උපයා ගැනීමට සමත් ව ඇත.

එමෙන්ම හෙක්ටයාර 0.1427 ක භූමිභාගයක පිහිටි රම්බොඩ නිවාඩු නිකේතනය ද විශ්‍රාමික ප්‍රජාව, රාජ්‍ය නිලධාරීන් බාහිර පුද්ගලයින් හා විදේශිකයන් වෙනුවෙන් ද පහසුකම් සපයමින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ආදායම් උත්පාදනය කරන්නේ ය. කාමර පහකින්, බැල්කනියකින් හා ප්‍රභූ පන්තියේ කාමරයකින් ද යුතු මේ දෙමහල් නිවාඩු නිකේතනය නුවරඑළියට ආසන්නව පිහිටා ඇති බැවින් සංචාරක

ආකර්ෂණය දිනාගෙන තිබෙන අතර සංචාරක කර්මාන්තයට උචිත ආකාරයෙන් මෙහි පහසුකම් සලසා ඇත. එහෙත් රම්බොඩ නිවාඩු නිකේතනය ද විශ්‍රාමික ප්‍රජාව උදෙසා විශේෂ සහන මිල ගණන් පවත්වාගෙන යන අතර රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් ද විශේෂිත මිල ගණන් පවත්වාගෙන යයි. ඒ අනුව 2016 වසර තුළ රම්බොඩ නිවාඩු නිකේතනයේ සේවා සැපයීම වෙනුවෙන් රු.498,799.52 ක මුදලක් උපයා ගැනීමට හැකිවී ඇත.

| නිවාඩු නිකේතනය | ආදායම (රු.) |
|---|---|
| කැලණිය නිවාඩු නිකේතනය | 3,012,765.56 |
| රම්බොඩ නිවාඩු නිකේතනය | 498,799.52 |
| **මුළු ආදායම** | **3,511,565.08** |

මූලාශ්‍රය - පාලන අංශය

## 07. අභ්‍යන්තර විගණනය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සිය ඉලක්ක හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම අරමුණු කර ගනිමින් ආයතනික මූල්‍ය පද්ධති ක්‍රමවේදයන් නිවැරදි ආකාරයට අනුගමනය කරමින් සම්පත් උපරිම අයුරින් යොදවන බවට තහවුරු කර ගැනීම ද අමාත්‍යාංශ මෙන් ම දෙපාර්තමේන්තු චක්‍රලේඛයන්ට අනුකූලව විශ්‍රාම වැටුප් ආදී සියලු ගෙවීම් සිදුකිරීමේදී විශ්‍රාමිකයන්ට, ඔවුගේ කලත්‍රයන් හා යැපෙන්නන්ට ප්‍රතිලාභ ලැබෙන බවට සහතික වීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්, දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ හා මාසික ගෙවීම් දත්ත පද්ධති අභ්‍යන්තර විගණනයට ලක්කිරීම සිදුවේ. ඒ මඟින් වඩාත් නිරවද්‍ය හා විනිවිදභාවයෙන් යුතු ගෙවීම් ක්‍රමයක් පවත්වාගෙන යාමට හැකිවී තිබේ.

වසර 2016 තුළ උක්ත කාරණය සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් 08ක් ද විශේෂ පරීක්ෂණ 07ක් ද දෙපාර්තමේන්තු අභ්‍යන්තර පරීක්ෂණ හා දත්ත පද්ධති පරීක්ෂණ 63ක් ද මහජන පැමිණිලි 103ක් ද නිරීක්ෂණ ඉදිරිපත් කරන ලද හා පරීක්ෂා කරන ලද ලිපිගොනු 202ක් ද රුපියල් ලක්ෂ දහයට වැඩි හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම් ලිපිගොනු 650ක් පරීක්ෂා කිරීම ද සිදු විය.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් වෙත විගණන විමසුම් 07ක් ද දත්ත පද්ධති විගණන විමසුම් 63ක් ද විශේෂ පරීක්ෂණ විගණන විමසුම් 07ක් ද ඉදිරිපත් කිරීමට හැකිවී ඇත. තවද ලිපිගොනු 185කට නිරීක්ෂණ ඉදිරිපත් කිරීම ද මහජන පැමිණිලි 98ක් සඳහා පිළිතුරු යැවීම් ද 2016 වසර තුළ සිදු විය.

එමෙන් ම මෙකී විගණනයෙන් මඟින් සිදුවීමට ගිය වැඩිපුර ගෙවීම් වළක්වා ගැනීම මඟිනුත් සිදුවූ වැඩිපුර ගෙවීම් නැවත අයකර ගැනීමට උපදෙස් ලබාදීම මඟිනුත් රජයට විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට හැකියාව ලැබුණි. ඒ අනුව විගණනයට ලක් කළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි දත්ත පද්ධති පරීක්ෂා කිරීමෙන් අනාවරණය කරගත් වැඩිපුර ගෙවීම් රු. මි. 31.35 ක මුදලක් ද, ලක්ෂ දහයට වැඩි හිඟ ගෙවීම් ගොනු පරීක්ෂා කිරීමෙන් අනාවරණය වී නිවැරදි කරන ලද වැඩිපුර ගෙවීම් රු. මි. 4.80 ක මුදලක්ද වෙනත් දත්ත පද්ධති පරීක්ෂාවෙන් අනාවරණය වී නිවැරදි කර වැඩිපුර ගෙවීම් රු. මි. 4.04 ක මුදලක් ද විශේෂ පරීක්ෂණ මඟින් අනාවරණය වී නිවැරදි කළ වැඩිපුර ගෙවීම් රු. මි. 1.87 ක මුදලක් ද මෙසේ වසර 2016 තුළදී රජයට ඉතිරි කිරීමට හැකියාව ලැබුණි. එමෙන් ම එසේ වැඩිපුර ගෙවීම් අදාල විශ්‍රාමිකයාගෙන් අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් වෙත දැනුම්වත් කිරීම මෙන් ම සිදුවී ඇති වංචා සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමටත් අදාල අංශ දැනුම්වත් කිරීම ද අභ්‍යන්තර විගණනය මඟින් සිදුවූ බවද සඳහන් කළ යුතුය.

## 08. ප්‍රතිපත්තිමය තීරණ යාවත්කාලීන කිරීම.

රටපුරා විශ්‍රාමික ප්‍රජාව වෙනුවෙන් විශ්‍රාම වැටුප් පිළිගැන්වීමේ ආයතන භාරදහසක පමණ විශ්‍රාම වැටුප් විෂය පිළිබඳව උද්ගතවන ගැටලු කළමනාකරණය මෙන් ම විශ්‍රාමික ගැටලු සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ලබාදීම මඟින් විශ්‍රාම වැටුප් ක්‍රමය දිනෙන් දින සමාජ ආර්ථික විචල්‍යතා හමුවේ යාවත්කාලීන කිරීම සිදුවේ.

එමෙන් ම විශ්‍රාම වැටුප් සම්බන්ධ නෛතික කාරණා සම්බන්ධයෙන් අධිකරණය නීතිපති දෙපාර්තමේන්තුව, මානව හිමිකම් කොමිෂන් සභාව, පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාව ආදී ආයතන සමඟ සම්බන්ධවී විශ්‍රාම වැටුප පිළිබඳ නෛතික උපදේශනය, සමාලෝචනය, වාර්තා කරණය මෙන්ම අධිකරණය හමුවේ පෙනී සිටීම ද මේ අතර සිදුවේ. තවද රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන වන්දි කමිටුව හා විනය කමිටුව නියෝජනය කරමින් එකී කාර්ය කඩිනම් හා සාධාරණ ලෙස ඉටු කිරීම ද මේ අතර වේ.

තව ද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් ඉදිරිපත් කරන විශ්‍රාම වැටුප් සම්බන්ධ කැබිනට් පත්‍රිකා සඳහා ප්‍රකාශනයක් ලබා දීමත් ඒ අනුව විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය අදාල නීති පටිපාටිය පූර්වාදර්ශ සම්පිණ්ඩනය කරමින් එවැනි ඉල්ලීම්වල යෝග්‍යතාව හා උචිතතාවය මත විශ්රාම වැටුප් ක්‍රියාවලිය කළමනාකරණය කිරීමට අවශ්‍ය කටයුතු කෙරේ.

ඒ අතර වසර 2016 ඇතුළත ඉදිරිපත් කළ ප්‍රතිපත්තිමය තීරණ විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ඔස්සේ සමස්ත ප්‍රජාව වෙත ම සන්නිවේදනය කර ඇත.

### චක්‍රලේඛ සම්පිණ්ඩනය

- **විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයවීම 1/2016 – 2016.01.12**

විශ්‍රාම ලබන නිලධාරීන්ගේ (පාරිතෝෂිකයෙන්) සිදුකරන රජයට අයවීම් සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් දැනුම්වත් කිරීම.

- **විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2016 – 2016.02.08**

වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමය යටතේ ලියාපදිංචිය අන්තර්ජාලය හරහා සිදු කිරීම සංශෝධනය කිරීම.

- **විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 09/2015 (1) – 2016.02.08**

සංශෝධිත විශ්‍රාම වැටුප සෘජුව ම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ඔස්සේ ගෙවීම් ආරම්භ කිරීම.

- **විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2016 – 2016.04.27**

අයවැය යෝජනා අනුව රජයේ නිලධාරීන්ගේ වැටුප් වැඩිවීම මත, 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ලබන රජයේ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් ගැලපීම.

- **විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 04/2016 – 2016.05.31**

2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ලබන නිලධාරීන් සඳහා 2005 අයවැයෙන් යෝජිත පරිදි නව රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම. (අග්‍රහාර)

- **විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2016 (සංශෝධන 1) – 2016.06.01**

2016.04.27 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/2016 අමතර උපදෙස් නිකුත් කිරීම.

- **විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 11/2014 (සංශෝධන 1)**

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි විශ්‍රාම වැටුප් සරල කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.

- **විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 05/2016 – 2016.10.21**

විශ්‍රාමිකයන් වෙත දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම මාර්ගගත ක්‍රමය යටතේ ඉල්ලුම් කිරීම.

- **විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 06/2016 – 2016.12.15**

2017 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම.

- **විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2015 (සංශෝධන 11) – 2016.09.09**

විශ්‍රාම ලබන දිනට ම විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබාදීම (විශ්‍රාම වැටුප් අයදුම්පත් මාර්ගගතව යොමු කිරීම.)

- **විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 07/2016**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006ට අනුව විශ්‍රාම වැටුප් ගැලපීම (2015) සන්නද්ධ හමුදා 2008.01.01 දිනට පෙර ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගිය බලයලත් නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප ගැලපීම.

## 09. විශ්‍රාමිකයන් වෙනුවෙන් ලබා දෙන වෙනත් ප්‍රතිලාභ

### 9.1 බාහිර ආයතන පුහුණු කිරීම

රාජ්‍ය සේවයේ නියුතු ඕනෑම තරාතිරමක නිලධාරියකු අනිවාර්යයෙන් සම්බන්ධ විය යුතු රාජ්‍ය ආයතනයක් වන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වත්මන් ක්‍රියාවලිය පිළිබඳ වෙනත් රාජ්‍ය ආයතන දැනුම්වත් කිරීම සඳහා මෙම වසර තුළ විශේෂ අවධානයක් යොමු කරන ලදී.

මධ්‍යගත දත්ත පද්ධතියක් ඔස්සේ ක්‍රියාත්මක වන විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය පිළිබඳවත් දත්ත පද්ධතිය ආශ්‍රිතව නිරන්තරව සිදුකරනු ලබන නවීකරණයන් ඇතුළු වෙනස්කම් පිළිබඳව රාජ්‍ය ආයතන දැනුම්වත් කිරීමේ අරමුණින් විශේෂ වැඩමුළු සහ වැඩසටහන් රාශියක් දෙපාර්තමේන්තු පරිශ්‍රය ආශ්‍රිතවත් අදාළ රාජ්‍ය ආයතනවලදීත් සිදු කෙරිණි.

විශේෂයෙන් ම රාජ්‍ය සේවකයන් විශ්‍රාම ගැන්වීමේ අයදුම් පත්‍රය (PD 03) මාර්ගගතව (Online) යොමු කිරීමේ නව ක්‍රමවේදය ආරම්භ කිරීමෙන් පසු ආයතන රැසක් නියෝජනය වන සේ නිලධාරීන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදි.



මූලාශ්‍රය - මාධ්‍ය අංශය

විශ්‍රාමිකයන් සඳහා දුම්රිය බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය මාර්ගගත ක්‍රමයට ලබාදීමේ දී දිවයින පුරා විසිරී සිටින විශ්‍රාමිකයින් වෙත නව ක්‍රමවේදය පිළිබඳ තොරතුරු රැගෙන යාම සඳහා දිස්ත්‍රික් මට්ටමින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරන දිස්ත්‍රික් විශ්‍රාම වැටුප් නිලධාරීන් දැනුම්වත් කිරීම සඳහා ද විශේෂ වැඩසටහන් මාලාවක් මෙහිලා ක්‍රියාවට නැංවිණි.

විශාල පරාසයක ක්‍රියාත්මක වන විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය පිළිබඳව රාජ්‍ය නිලධාරීන් දැනුම්වත් කිරීම අරමුණු කරගනිමින් රාජ්‍ය ආයතන ගණනාවක් වෙත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ඉහළ පරිපාලන නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායම්හි සම්පත් දායකත්වයෙන් විශේෂ පුහුණු සැසි ක්‍රියාත්මක කරන ලදි.



මූලාශ්‍රය - මාධ්‍ය අංශය

දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය, අග්‍රාමාත්‍ය කාර්යාලය, බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය, වයඹ පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය, බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නැගෙනහිර පළාත් සභාව, සබරගමුව පළාත් සභාව, ප්‍රවාහන අධිකාරී කාර්යාලය ආදී රාජ්‍ය ආයතන ගණනාවක දී නව ලියාපදිංචි ක්‍රමවේදය ඇතුළු විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය පිළිබඳ පුහුණු සැසි ගණනාවක් පසුගිය වසර පුරා ක්රියාත්මක විය.

## 9.2 ණය පහසුකම් ලබාදීම.

අභිමානවත් විශ්‍රාමිකයකු බිහි කරමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය, ආර්ථිකය සහ සුභසාධනය ඉහළ නැංවීම වෙනුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පසුගිය වසර කිහිපය මුළුල්ලේ විවිධ වූ ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදී. රාජ්‍ය සහ පෞද්ගලික බැංකු සමඟ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ඇති කරගත් සහ සම්බන්ධතාවය සහ එකඟතාවයේ ප්‍රතිඵලයක් ලෙස විශ්‍රාමික ප්‍රජාව වෙත පිරිනැමීමට හැකි වූ විශේෂ ණය යෝජනා ක්‍රම ඒ අතර සුවිශේෂී වේ. පෞද්ගලික සහ රාජ්‍ය බැංකු ඔස්සේ විශ්‍රාමික ප්‍රජාව වෙත  හඳුන්වා දුන් මෙම ණය යෝජනා ක්‍රම මඟින් මේ වන විට නිකුත් කර ඇති ණය මුදලේ වටිනාකම රුපියල් බිලියන 50 කට අධික වේ. එමඟින් කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරයන් වෙත යොමුවීමට විශ්‍රාමිකයන් වෙත විශාල පෙළඹුමක් ඇති කරන ලද අතර ඒ හරහා ක්ෂුද්‍ර පරිමාණයේ ව්‍යාපාර රාශියක් බිහිවීම හේතුවෙන් රටේ මුදල් සංසරණය වේගවත් වීම අපේක්ෂිත ය.

විශේෂයෙන් විශ්‍රාම ගැනීමත් සමඟ රාජකාරී දිවියට සමුදෙන නමුත් ආර්ථික ක්‍රියාවලියේ සජීවී කොටස්කරුවන් වීමේ ශක්‍යතාවයෙන් යුතු දීර්ඝ කාලීන සේවා අත්දැකීම් සහ විශේෂ ප්‍රාගුණ්‍යයෙන් හෙබි විශ්‍රාමිකයා නැවතත් ආර්ථික හා සේවා ප්‍රවාහයට එක්කර ගැනීමට හැකි වීම මෙම ව්‍යාපෘතිය හරහා අත්කරගත් විශිෂ්ට ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකි ය. ග්‍රාමීය මට්ටමෙන් ක්ෂුද්‍ර පරිමාණයේ ව්‍යාපාර රාශියක් බිහිවීම ඔස්සේ ඒ ඒ ව්‍යවසායකයන්ට අදාල අනෙකුත් ක්ෂේත්‍රයන් සංවර්ධනය වීම ද මේ ඔස්සේ සිදුවිය.

ණය මුදල් ලබාගත් විශ්‍රාමිකයකු යම් හෙයකින් ජීවිතක්ෂයට පත් වුවහොත් සම්පූර්ණ ණය මුදල අවලංගු වන ආකාරයට විශේෂ රක්ෂණ ක්‍රමවේදයකට යොමු කිරීම හේතුවෙන් විශ්‍රාමිකයන් අතර මෙකී ණය යෝජනා ක්‍රමයන්

කෙරෙහි විශ්වසනීයත්වය තහවුරු කිරීමට සමත් වී ඇත.

විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් වෙත ණය පහසුකම් නිකුත් කිරීම කෙරෙහි එතෙක් ඇල් මැරුණු ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ බැංකු ක්ෂේත්‍රය තුළ විශ්‍රාමිකයා රාජ්‍ය නිලධාරියාගේ ශක්‍යතාවය තහවුරු වීමත් සමග පෞද්ගලික හා රාජ්‍ය බැංකු මඟින් විශ්‍රාමිකයා වෙත ණය පහසුකම් ලබාදීම කෙරෙහි විශාල උද්යෝගයක් ඇතිවී තිබේ.

එකී උද්යෝගයත් සමග බැංකු තරගකාරීව ණය නිකුත් කිරීම ආරම්භ කරමින් ස්වකීය ආයතන කෙරෙහි උපරිම විශ්වාසය දිනා ගැනීම උදෙසා ණය පහසුකම්වලට අමතර විවිධ සේවාවන් සහ ප්‍රතිලාභ විශ්‍රාමිකයා වෙත ලබාදීමට ද මේ වන විට උත්සුක වී ඇත.

විශ්‍රාමික ප්‍රජාව සතු ශක්‍යතාවයන් සහ වටිනාකම අවබෝධ කර දෙමින් විශ්‍රාමිකයා සහ එම ආයතන අතර අවබෝධය වර්ධනය කිරීමේ මැදිහත් කරුවෙකු වීමට ලැබීම ඔස්සේ, සේවය අවසන් කළ විශ්‍රාමිකයා යළි ශ්‍රම බලකායට එක් කොට ජාතික ආර්ථිකය වර්ධනයටත් විශ්‍රාමිකයාගේ පෞද්ගලික ජීවිතය සංවර්ධනයටත් දායක වීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හැකියාව උදා විණි.

### 9.3 දුම්රිය බලපත්‍ර මාර්ගගත ක්‍රමයට ලබාදීමේ ක්‍රියාවලිය

විශ්‍රාමික ප්‍රජාව නවීන තොරතුරු තාක්ෂණික ලෝකය සමඟ බද්ධ කරමින් ඔවුන්ගේ ජීවිත වඩා සුවපහසු කිරීමට විවිධ අත්හදා බැලීම්වල නිරත වන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විශ්‍රාමික දුම්රිය බලපත්‍රය මාර්ගගත (Online) ක්‍රමයට ලබාදීම සඳහා දියත් කරන ලද වැඩ පිළිවෙල මෙම වසර තුළ හඳුන්වා දුන් සුවිශේෂී සේවාවක් වේ. විශ්‍රාමික රාජ්‍ය නිලධාරියෙකුට හිමිවන ඉහළ වරප්‍රසාදයන් අතරින් එකක් වූ විශ්‍රාමික දුම්රිය බලපත්‍රය ලබාදීමේ දී පැවති සංකීර්ණ ක්‍රමවේදය වෙනුවට විශ්‍රාමිකයාට වඩාත් පහසු සරල නව ක්‍රමවේදයක් හඳුන්වා දීමට අවකාශය විවර විය.



මූලාශ්‍රය - මාධ්‍ය අංශය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන මෙම සුවිශේෂී සේවාව ලබා ගැනීම සඳහා විශ්‍රාමිකයා එක් වරක් පමණක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතු ආකාරයට ක්‍රමවේදය සකස් කර තිබේ. විශ්‍රාමිකයන් ලියාපදිංචි කිරීම මාර්ගගත පද්ධතිය මඟින් සිදුකළ යුතු අතර ලියාපදිංචිය සඳහා තොරතුරු ඇතුළත් කිරීමේ හැකියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් වෙත ලැබෙන පරිදි මෙම ක්‍රමය සකස් කරන ලදී. මෙසේ ලියාපදිංචි වූ විශ්‍රාමිකයන් හට නැවත

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් වෙත පැමිණීමකින් තොරව දුම්රිය ස්ථානයන් වෙත විශ්‍රාමික හැඳුනුම්පත ඉදිරිපත් කිරීමෙන් කෙටි කාල සීමාවක් තුළ දුම්රිය ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට හැකියාව උදාවුණි. එකී කාර්යය තවදුරටත් පහසු කරමින් එක් වරක් ලියාපදිංචි වූ විශ්‍රාමිකයන් නැවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හෝ දුම්රිය ස්ථානය වෙත යාම අවම කරවමින් මොබිටෙල් දුරකතන ජාලයේ ඕනෑ ම දුරකතනයකින් අංක 365 අමතා අවශ්‍ය තොරතුරු ලබාදීම මගින් සිය ප්‍රවේශ පත්‍ර සෘජුව ම වෙන් කර ගැනීමේ අවස්ථාව උදාකර දෙනු ලැබී ය. විශ්‍රාමිකයන් හට වසරකට හිමිවන දුම්රිය බලපත්‍ර කට්ටල දෙක ඇතුළු නිදන, නිරීක්ෂණ, වායු සමනය කළ සහ වෙන් කළ මැදිරි පහසුකම් සඳහා හිමිකම් මෙම නව ක්‍රමවේදය ඔස්සේ තහවුරු කෙරිණි.



මූලාශ්‍රය - මාධ්‍ය අංශය

යැපෙන්නන්ගේ දීමනා, පුණ්‍යාධාර දීමනා, ලබන්නන් හා අනත් දරුවන්ගේ සහ ආබාධිතයන්ගේ භාරකරුවන්ට දුම්රිය බලපත් හිමිකම නොමැති අතර අනෙකුත් සියලු ම විශ්‍රාමිකයන් වෙත දුම්රියබලපත්‍ර මාර්ගගත ක්‍රමයට ලබා ගැනීමේ හැකියාව මෙමඟින් උදා විය. දුම්රිය දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාමිකයන් වෙත විශ්‍රාම වැටුප් පද්ධතියෙන් නිකුත් කරනු ලැබූ දුම්රිය බලපත්‍රවලට අදාල බිල්පත් නිරවුල් කිරීම දුම්රිය දෙපාර්තමේන්තුව වෙත සෘජුව ම සිදු කරනු ලබන්නේ ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟිනි.

### 9.4 අග්‍රහාර ප්‍රදානය

2005 වර්ෂයේ අයවැය යෝජනා අනුව රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් හඳුන්වා දුන් අග්‍රහාර රක්ෂණ ක්‍රමය 2016.04.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 (vi) හි විධිවිධානයන්ට අනුව තවදුරටත් පුළුල් කිරීමට කටයුතු යෙදිණි. ඒ අනුව රාජ්‍ය සේවයේ නිරත දායකයන්ගේ ස්වකීය කැමැත්ත පරිදි දායක විය හැකි රන් සහ රිදී යන නව යෝජනා ක්‍රම දෙකක් හඳුන්වා දීමටත් විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් සඳහා අග්‍රහාර රැකවරණය නමින් නව යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමටත් කටයුතු කරනු ලැබී ය. 2016.05.31 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 04/2016 මගින් 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ගන්නා නිලධාරීන් සඳහා යෝජිත පරිදි නව රක්ෂණ ක්‍රමයක් (අග්‍රහාර) හඳුන්වාදෙන ලදී.

විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් වෙතින් මසකට රුපියල් දෙසියයක් වැනි මාසික දායකත්වයක් ලබා ගනිමින් විශාල ප්‍රතිලාභ රැසක් ඔවුන් වෙත ලබාදෙන පරිදි සකස් වූ මෙකී රැකවරණය රාජ්‍ය

පරිපාලන චක්‍රලේඛ 12/2005 (vi) හි විධිවිධානයන්ට අනුව 2016.01.01 දින සිට විශ්‍රාම ගන්වනු ලැබූ සියලුම රාජ්‍ය නිලධාරීන්ට අනිවාර්යය වේ.

වයස අවුරුදු 70 දක්වා ප්‍රතිලාභ හිමිකම් ලැබෙන පරිදි සකස් වූ අග්‍රහාර රක්ෂණය සඳහා අයකරනු ලබන රුපියල් 200 ක දායක මුදල, යම් රාජ්‍ය නිලධාරියෙකු විශ්‍රාම ලබා ගන්නා මාසයට පසු මාසයේ සිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් අයකර ගනු ලබන අතර එය ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ප්‍රේෂණය කිරීම සිදු කරනු ලබයි. විදේශගත විශ්‍රාමිකයන් සඳහා ද මෙම ක්‍රමයේ දායකත්වය මත ප්‍රතිලාභ ලබාගැනීමට අවකාශය හිමි වූ අතර විදේශගත විශ්‍රාමිකයින් විසින් ඒ සඳහා අවශ්‍ය ලියකියවිලි අදාළ විදේශ රටෙහි තානාපති කාර්යාලය ඔස්සේ තහවුරු කළ යුතු විය.

ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් හඳුන්වා දෙනු ලැබූ අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය මඟින් විශ්‍රාමික රාජ්‍ය නිලධාරියා වෙත ප්‍රතිලාභ රාශියක් හිමි කර දෙනු ලැබූ අතර විශ්‍රාමිකයා රෝහල්ගත වීමකදී රෝහල් සහ සාත්තු නිවාස ගාස්තු රුපියල් 30,000.00 දක්වා ගෙවීම සිදු කරනු ලැබේ. විශේෂඥ වෛද්‍යවරයෙකුගේ නිර්දේශ මත ලබාදෙන විශේෂ ප්‍රතිකාර සඳහා රුපියල් 50,000.00 දක්වා ද ආරෝග්‍ය ශාලාවක හෝ සාත්තු නිවාසයක ප්‍රතිකාර ලබාගැනීමේදී වෛද්‍ය උපදේශන සහ විශේෂඥ වෛද්‍ය සේවා සඳහා රුපියල් 20,000.00 දක්වාත් ප්‍රතිලාභ හිමි කර දී ඇත. එමෙන් ම දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලියාපදිංචි වූ පෞද්ගලික ආයුර්වේද රෝහලක නේවාසික ප්‍රතිකාර ලබාගැනීම වෙනුවෙන් රුපියල් 120000.00 බැගින් ද රජයේ රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබාගන්නේ නම් දිනකට රුපියල් 500.00 බැගින් 5000.00 දක්වාත් මිලදී ගනු ලබන ඖෂධ වියදම් සඳහා රුපියල් 50,000.00 දක්වාත් වෛද්‍ය පරීක්ෂණ සඳහා රුපියල් 20,000.00 දක්වාත් ගෙවීම් සිදු කරනු ලැබේ. හෘදය ආශ්‍රිත ශල්‍යකර්ම වෙනුවෙන් රුපියල් 500,000.00 උපරිමයට යටත්ව ගෙවීම් සිදු කරනු ලබන අතර පිළිකා සහ වකුගඩු ආශ්‍රිත රෝග සඳහා ශල්‍යකර්ම වෙනුවෙන් රුපියල් 200,000.00 දක්වා රක්ෂණ වරයක් හිමිකර දෙනු ලැබී ය. ශ්‍රවණ ආධාර සඳහා රුපියල් 200,000.00 දක්වා රක්ෂණ වරයක් හිමිකර දෙනු ලැබී ය. ශ්‍රවණ ආධාර සඳහා රුපියල් 50,000.00 ක් ද ස්වාභාවික මරණයක දී රුපියල් 15,000.00 ක් සහ හදිසි අනතුරක් මඟින් සිදුවන මරණයක දී රුපියල් 600,000.00 ක් වන ප්‍රතිලාභ හිමිකර දීම ඔස්සේ විශ්‍රාමිකයා වෙත ඉහළ රැකවරණයක් සැපයීමට අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය මඟින් අවස්ථාව විවර කර දීමට දායකවීම 2016 වර්ෂයේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සපුරා ගත් සුවිශේෂී ඉලක්කයක් බව සඳහන් කළ යුතු ය.

### 9.5 පෞද්ගලික ආයතන සම්බන්ධ කිරීම.

මාසික විශ්‍රාම වැටුප නියමිත දිනට විශ්‍රාමිකයා අතට පත් කිරීමේ නිල වගකීමෙන් ඔබ්බට යමින් ඔවුන්ගේ සමාජ ආර්ථික ජීවිතය ශක්තිමත් කිරීමට අත්වැලක් වීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව නිබඳව ප්‍රයත්න දැරී ය. විශ්‍රාමිකයා ජාතික වගකීමක් ලෙස සලකා කටයුතු කිරීමේදී රාජ්‍ය ආයතනයක් ලෙස යටත් වීමට සිදුවූ සීමාවන් සහ ඇතැම් දුෂ්කරතාවයන් හමුවේ පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධ වෙමින් කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වූවක් විය. එහිදී පෞද්ගලික අංශයේ ආයතන රාශියක් සමඟ සුහදතාවය වර්ධනය කර ගැනීමට සමත් වීම ඔස්සේ මේ වන විට විශ්‍රාමික ප්‍රජාව වෙත අත්පත් කර දීමට සමත් වූ ජයග්‍රහණයන් රාශියකි.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමඟ ඇති කරගන්නා ලද අවබෝධතාවයේ ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික ආයතන රාශියක් මේවන විට සිය භාණ්ඩ හා සේවා නිශ්පාදනයන් විශ්‍රාමිකයන් වෙත ඉතා සහනදායී මිලකට ලබාදීමට කටයුතු කරමින් සිටියි.

විශ්‍රාමිකයකු රෝහලකට ඇතුළත් වූ අවස්ථාවේ පටන් ප්‍රතිකාර ගැනීම් සිදුකිරීම දක්වා ගාස්තු අය කිරීම්වලදී විශේෂ මට්ටම් නිකුත් කිරීමට පෞද්ගලික අංශයේ රෝහල් ගණනාවක් මේ වන විට කටයුතු කරමින් සිටියි. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් විශ්‍රාමිකයන් නිකුත් කරනු ලබන විද්‍යුත් හැඳුනුම්පත හරහා සහන සේවාවන් රාශියක් පිරිනැමීමට සමත් වී ඇත. Asian Alliance සහ Fair First යන රක්ෂණ සමාගම් සමඟ එක් වී ක්‍රියාත්මක කරන බුහුමන් රක්ෂණ යෝජනා ක්‍රමය හරහා ද ප්‍රතිලාභ රැසක් හිමිකර දී ඇති අතර බුහුමන් රක්ෂණය වයස අවුරුදු 75 දක්වා දීර්ඝ කිරීමට ද හැකි වී තිබේ. එම වයස් සීමාව වයස අවුරුදු 90 දක්වා වැඩි කිරීමට අවශ්‍ය කටයුතු ද මේ වන විට සම්පාදනය කරමින් පවතී. Asian Alliance, Fair First බැංකු අනුගමනය කරමින් අනෙකුත් රක්ෂණ සමාගම් ද විශ්‍රාමිකයා වෙත ප්‍රතිලාභ අත්කර දෙන විවිධ නව රක්ෂණ ක්‍රමයන් මේ වන විට යෝජනා කර තිබේ.

Pan Asia, LB Finance, සණස වැනි ආයතන මඟින් කොළඹ කොටස් වෙළඳ පොළෙහි මූල්‍ය ආයෝජන කටයුතු සඳහා විශ්‍රාමික ප්‍රජාව පෙළඹවීම මඟින් ඔවුන්ගේ ආර්ථිකය නැංවීම සඳහා වන දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබී ය. දුරකතන සමාගම් මඟින් විශේෂ වට්ටම් සහිත නව දුරකතන පැකේජ විශ්‍රාමිකයන් සඳහා ම නිර්මාණය කරන ලදී.

විශ්‍රාමික ප්‍රජාව යළි ශ්‍රම බලකාය වෙත යොමුකිරීම සඳහා ක්‍රියාත්මක වන දිවි අරුණ වැඩසටහන මෙහිලා විශේෂ කාර්යභාරයක් සිදුකරනු ලබයි. රක්ෂණ සමාගම් ඇතුළු පෞද්ගලික ආයතන රාශියක් සුදුකම් සලසා බලමින් විවිධ රැකියා සහ තනතුරු සඳහා විශ්‍රාමිකයන් බඳවා ගැනීම් සිදුකරනු ලැබී ය.

මෙසේ පෞද්ගලික අංශයේ සුහද මිත්‍රයකු බවට පත් වෙමින් විශ්‍රාමිකයා කෙරෙහි ප්‍රතිලාභ දිනා ගැනීමට හැකි වීම 2016 වසරේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ලැබූ විශාල ජයග්‍රහණයක් වේ.

## 9.6 කැළණිය සහ රම්බොඩ නිවාඩු නිකේතන නවීකරණය කිරීම.

ආර්ථික හා සාමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක් බිහි කිරීම දැක්ම කොට ගත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සිය මූලික කාර්යභාරය වන මාසික විශ්‍රාම වැටුප් ගෙවීමට ඔබ්බෙන් විශ්‍රාමිකයා වෙත සුවිශේෂී පහසුකම් සලසන ආයතනයක් වේ. ප්‍රීතිමත්, නිරෝගීමත් සැඳෑ දිවියකට සුව පහසුව සලසමින් කැළණිය වෙදමුල්ල සහ රම්බොඩ යන ස්ථානයන්හි විශ්‍රාමික නිවාඩු නිකේතනයන් ඉදිවනුයේ ඒ අනුවයි. කොළඹ නුවර මාර්ගයේ කොළඹ කටුනායක අධිවේගී මාර්ග පිවිසුමට නුදුරින් පිහිටා ඇති කැළණිය වෙදමුල්ල විශ්‍රාමික නිවාඩු නිකේතනය විවිධ වූ අරමුණු සහිතව අගනගරයට පිවිසෙන විශ්‍රාමිකයාට අගනා නවාතැන්පලක් ලෙසත් විවේකය ගත කිරීමට මනා ගිමන්හලක් ලෙසත් සුවපහසුව සලසනු ලබයි.

රාජ්‍ය අංශයේ මෙන් ම පෞද්ගලික අංශයේ විවිධ ක්‍රියාකාරකම් වැඩමුළු, රැස්වීම් සඳහා භාවිත කළ හැකි වැඩි දියුණු කරන ලද ශ්‍රවණාගාරයකින් සහ අංග සම්පූර්ණ කාමර පහසුකම්වලින් යුත් කැළණිය වෙදමුල්ල නිවාඩු නිකේතනය විශ්‍රාමික ප්‍රජාව මෙන් ම අනෙකුත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන අතර ආකර්ශනය දිනාගත් නිවාඩු නිකේතනයකි. එකී ආකර්ශනය තවදුරටත් පවත්වා ගෙනයමින් සංවර්ධනය කිරීම උදෙසා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මෙම වසර තුළ සිය විශේෂ අවධානය යොමු කරනු ලැබී ය.



මූලාශ්‍රය - මාධ්‍ය අංශය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සතු කැළණිය වෙදමුල්ල නිවාඩු නිකේතනයට විදුලි ජනක යන්ත්‍රයක් ලබා දීම, ජල පොම්පාගාරය පිහිටි ගොඩනැගිල්ලේ අංග සම්පූර්ණ නව කුටි දෙකක් ඉදි කිරීම, ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සහ සනීපාරක්ෂක පද්ධතිය වැඩි දියුණු කිරීම සහ ආරක්ෂිත වැට නවීකරණය ඇතුළු සංවර්ධනය කිරීම් රැසක් සිදු කරනු ලැබුවේ ඒ අනුවයි.

කැළණිය වෙදමුල්ල නිවාඩු නිකේතනය සඳහා ඇති පිවිසුම් මාර්ගය සහ ඒ අවට ප්‍රදේශයේ විදුලි කණු සැකසීම සඳහා ද විශේෂ අවධානයක් යොමු කරමින් එම කාර්යය අවසන් කර විශ්‍රාමික ප්‍රජාව වෙත උපරිම පහසුකම් සම්පාදනය කිරීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමත් වී ඇත.






මූලාශ්‍රය - මාධ්‍ය අංශය

සංචාරක ආකර්ශනයට නොමඳව පාත්‍ර වන්නා වූ සුන්දර රම්බොඩ දිය ඇල්ල දිස්වන මානයේ පිහිටි රම්බොඩ නිවාඩු නිකේතනය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාමික ප්‍රජාව වෙත හිමි කර දුන් උසස් තත්ත්වයේ නිවාඩු නිකේතනයක් වේ. විවේකය සඳහා ම උචිත වූ රමණීය පරිසරය සහ සුවදායී දේශගුණය හේතුවෙන්, විශ්‍රාමිකයන් අතර ශීඝ්‍රයෙන් ජනප්‍රිය වූ රම්බොඩ නිවාඩු නිකේතනයේ නවීකරණ කටයුතුවලදී ද මෙම වසර තුළ ප්‍රමුඛතාවයක් ලබා දෙන ලදී. සංචාරක කලාපයක් තුළ පිහිටි සංචාරක ආකර්ශණයක් සහිත නිවාඩු නිකේතනයක් ලෙස ජාතික ආර්ථිකයට ඉහළ ආදායමක් උත්පාදන කර දෙමින් සෙසු රාජ්‍ය ආයතන කෙරෙහි ආදර්ශ සපයන රාජ්‍ය ආයතනයක් බවට පත් වීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමර්ථ වනුයේ ඒ අනුවයි.

## 9.7 විශ්‍රාම වෙබ් සඟරාව

විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියට පමණක් සීමා නොවී නිරන්තරයෙන් ඵලදායී අර්ථවත් විශ්‍රාම දිවියක් ගොඩනැඟීම වෙනුවෙන් කැප වූ ආයතනයක් ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව 2015 ඔක්තෝබර් 08 හෙවත් ජාතික විශ්‍රාමික දින සැමරුම 2015 දී විශ්‍රාමික ප්‍රජාව වෙත හඳුන්වා දුන් විශ්‍රාම මාසික සඟරාව සෑම මසකදී ම අන්තර්ජාලයට මුදා හැරීමට වසර 2016 දී ද කටයුතු කළේය. අත්දැකීම් බහුල ජ්‍යෙෂ්ඨ පුරවැසියා සතු දැනුම නැවත වතාවක් සමාජගත කිරීමට මෙමඟින් අවකාශය විවර වූ අතර සමාජයීය, ආර්ථික, සෞඛ්‍ය, රසවින්දනාත්මක ශාස්ත්‍රීය ලිපි සම්පාදනය හරහා විශ්‍රාම දිවිය ඵලදායීව ගත කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශයන් සපයන සාර සංග්‍රහයක් ලෙස විශ්‍රාම මාසික වෙබ් සඟරාව කටයුතු කරනු ලබයි.

විවිධ විෂය ක්ෂේත්‍රයන් හි ප්‍රවීණ විද්වතුන්ගේ විශේෂඥ විෂය දැනුම විශ්‍රාමිකයන්ගේත් රාජ්‍ය සේවකයාගේත් ජීවිත වෙත මනා පිටිවහලක් වන සේ සකස් කරන ලද විශේෂාංග ලිපි ඇතුළත් විශ්‍රාම වෙබ් සඟරාව වෙත දෙස් විදෙස් විශ්‍රාමිකයන් ඇතුළු රාජ්‍ය සේවකයින්ගෙන් ඉහළ පාඨක ප්‍රතිචාරයක් ලැබෙමින් පවතී. දිනෙන් දින වෙනස්වීම්වලට ලක් වන විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියෙහි සිදුවන

නවීන වෙනස්කම් පිළිබඳ විශ්‍රාමික ප්‍රජාව දැනුම්වත් කිරීම සඳහා ද විශ්‍රාමිකයා සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යා කරන සන්නිවේදන මාධ්‍යය ලෙස ද විශ්‍රාම මාසික ඉ-සඟරාව විශේෂ මෙහෙවරක නිරත වී සිටියි. පාඨකයින් වැඩිදෙනාගේ අවදානය උදෙසා දෙපාර්තමේන්තු නිල Face book අඩවියේ ද මෙකී සඟරාව පළ කරන අතර ස්මාර්ට් ජංගම දුරකථන ඔස්සේ ද කියවිය ඇකි ආකාරයට විශ්‍රාම වෙබ් සඟරාව නිර්මාණය කර ඇත.




මූලාශ්‍රය - මාධ්‍ය අංශය

## 9.8 විශ්‍රාම රේඩියෝව

දීර්ඝ කාලයක් මුළුල්ලේ විවිධ ක්ෂේත්‍රයන්හි සේවය කරමින් ලබාගත් අත්දැකීම් සම්භාරයක් සහ විශේෂ ප්‍රාගුණ්‍යයක් සහිත විශ්‍රාමික ප්‍රජාව සතු දැනුම නැවත සාමාජගත කිරීමේ අරමුණින් 2015 ඔක්තෝබර් මස 08 වන දිනට යෙදී තිබූ ජාතික විශ්‍රාමික දිනයේ දී විශ්‍රාම වෙබ් ගුවන් විදුලිය දියත් කරන ලදි.




මූලාශ්‍රය - මාධ්‍ය අංශය

සැදෑ සමයට එළඹෙත් ම සමාජ ජීවිතය තුළ හුදෙකලා වූවෙක් බවට පත් නොකර ඔවුන් සතු දැනුම, ආකල්ප සහ නිසඟ හැකියාවන් සඳහා වේදිකාවක් සකස් කිරීමට මෙමඟින් හැකියාව ලැබී තිබේ. තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක් බිහි කිරීම උදෙසා සෞඛ්‍ය, ආර්ථික, විනෝදාස්වාද, රසවින්දන මෙන් ම විශ්‍රාම වැටුප් සම්බන්ධ තොරතුරු පිළිබඳ විශ්‍රාමිකයා යාවත් කාලීන කරනු ලබන වැඩසටහන් අන්තර්ගතයකින් යුක්තව ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සේවයේ නියුතු වූ විශ්‍රාමික ප්‍රවීණ වැඩ සටහන් මෙහෙයවන්නන්ගේ සම්පත් දායකත්වය ද සහිතව විද්වත් ප්‍රජාව සහ විශ්‍රාමික නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් උසස් තත්ත්වයෙන් යුතුව පවත්වා ගෙනයනු ලබන සේවාවක් ලෙස විශ්‍රාම වෙබ් ගුවන් විදුලිය හඳුන්වා දිය හැකි ය.

ස්වාමීන් වහන්සේලා, කතෝලික පියතුමන්ලා සහ වෛද්‍ය, ගුරු, පරිපාලන සේවා ආදී විවිධ වෘත්තීන් නියෝජනය කර විශ්‍රාම ලැබූ විද්වතුන් විශ්‍රාම වෙබ්

ගුවන්විදුලිය ඔස්සේ වැඩසටහන් ඉදිරිපත් කිරීමට නිස්සරණාධ්‍යාශයෙන් ඉදිරිපත්වීම හා ආයතනයේ නිලධාරීන්ගේ දූවා දරුවන් මෙන් ම ආයතනික නිලධාරීන් ද රජ්‍ය සේවයෙන් පරිබාහිර වෙනත් සම්පත් දායක කලාකරුවන් ස්වෙච්ඡාවෙන් විශ්‍රාම වෙබ් ගුවන් විදුලි වැඩසටහන්වලට සිය දායකත්වක ලබාදීම ද වසර 2016 දී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ලැබූ ජයග්‍රහණයකි.




මූලාශ්‍රය - මාධ්‍ය අංශය

# 10. මානව සම්පත් කළමනාකරණය

## 10.1 අභ්‍යන්තර පුහුණු

සිය දැක්ම, අරමුණු, පරමාර්ථ සාක්ශාත් කර ගැනීමේ ක්‍රියාවලියේදී මානව සම්පත කෙරෙහි ඉහළ විශ්වාසයත් තබා ඇති ආයතනයක් ලෙස ආයතනික නිලධාරීන් සතු දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනය කිරීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ පරිපාලන සහ කළමනාකරණ පුහුණු වැඩසටහන් සඳහා මෙන් ම ශාරීරික යෝග්‍යතා පුහුණු වැඩසටහන් සඳහා මෙන් ම ශාරීරික යෝග්‍යතා පුහුණු වැඩසටහන් වෙත ද දෙපාර්තමේන්තු නිලධාරීන් යොමු කිරීමට පියවර ගැණුනේ ඒ අනුවයි.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සියලු ම මාණ්ඩලික නිලධාරීන් සඳහා දෙදින නේවාසික වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු යෙදූ අතර දිස්ත්‍රික් විශ්‍රාම වැටුප් නිලධාරීන්ගේ කළමනාකරණ කුසලතාවයන් වැඩි දියුණු කිරීම සඳහාත් ගිණුම් අත්‍යාවශ්‍යතාවයන් සඳහා කණිෂ්ඨ ගිණුම් නිලධාරීන් පුහුණු කිරීම සඳහාත් ප්‍රමුඛතාවයක් ලබා දෙමින් ඒ සඳහා කටයුතු සංවිධානය කරන ලදි. හරිත ඵලදායීතා සංකල්ප පිළිබඳ ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය මඟින් පවත්වනු ලැබූ වැඩසටහන් සඳහා දෙපාර්තමේන්තුවේ විවිධ අංශ නියෝජනය වන සේ නිලධාරීන් සහභාගී කරවනු ලැබී ය.

ජාතික ශ්‍රම ආයතනය මඟින් විවිධ තේමාවන් රැසක් ඔස්සේ සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් මාලාවකට ද දෙපාර්තමේන්තු නිලධාරීන් සහභාගී කෙරිණි. ඵලදායී සන්නිවේදනය, ඵලදායී සම්බන්ධතා සංවර්ධනය ඵලදායී සංකල්ප ප්‍රායෝගික භාවිතය, ඉහළ ශ්‍රම ඵලදායීතාව සඳහා වෘත්තීය ආරක්ෂාව, සෞඛ්‍ය සහ ගිනි ආරක්ෂණය, ඉහළ ශ්‍රම ඵලදායීතාව සඳහා කාර්යාල කාර්යය සහයක කාර්ය භාරය වැනි ආයතනික ප්‍රගමනය සඳහා සාධක වන්නා වූ ක්ෂේත්‍ර ගණනාවක අත්දැකීම් දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත ලබා දෙමින් න්‍යායික මෙන් ම ප්‍රායෝගික දැනුම් සම්භාරයක් ඔවුන් වෙත සමීප කරවීමට හැකි වූයේ ඒ අනුවයි.




මූලාශ්‍රය - මාධ්‍ය අංශය

තවද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අනියුක්තව දිවයින පුරා දිසිත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවය කරන දිස්ත්‍රික් විශ්‍රාම වැටුප් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරිණි. 2016 වසරේ දී දෙපාර්තමේන්තු තොරතුරු පද්ධතිය හරහා සිදුවුණු නවීකරණයන් මෙන් ම නව හඳුන්වාදීම් පිළිබඳ ඔවුන් දැනුම්වත් කරමින් ඔවුන් හරහා විශ්‍රාමික ප්‍රජාව දැනුම්වත් කිරීමට ද මෙමඟින් හැකියාව උදා විය. විශේෂයෙන් රාජ්‍ය සේවකයෙකු විශ්‍රාම ගැන්වීමේදී සම්පූර්ණ කළයුතු PD 03 ආකෘති පත්‍රය මාර්ගගත ක්‍රමයට ලබා ගැනීමේ ක්‍රියාවලියේදී රාජ්‍ය නිලධාරීන් වෙත පැන නැඟුණු ගැටලු රාශියකට පිළිතුරු ලබාදීමට එමඟින් හැකිවුණු අතර විශ්‍රාමිකයන් සඳහා වූ දුම්රිය බලපත්‍ර මාර්ගගත ක්‍රමයට සම්පූර්ණ කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටියත්, විශ්‍රාමිකයන් ඒ පිළිබඳව දැනුම්වත් කළ යුතු ආකාරයත් පිළිබඳව පුහුණුවක් ලබාදීමට මෙමඟින් හැකියාව ලැබුණි. මෙම වැඩසටහන් මාලාවේ ම තවත් අදියරයක් ලෙස දෙපාර්තමේන්තුව තුළ, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අනියුක්තව සේවය කරන සියලු ම සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් සහ ලේඛණ සහායක නිලධාරීන් සඳහා ද පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.




මූලාශ්‍රය - මාධ්‍ය අංශය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යනු විශ්‍රාමිකයාගේ මාසික විශ්‍රාමික වැටුප නිවැරදිව නියමිත දින දී ම විශ්‍රාමිකයාගේ අතට පත් කරන ආයතනයයි. එකී ක්‍රියාවලියේ නිරවද්‍යතාවත්, විශ්වසනීයත්වයේත් පිළිඹිබුව අන් කිසිවක් නොව ආයතනයේ මානව සම්පතයි. මාසික ගෙවීම් ක්‍රියාවලියෙහි සෑම අදියරකදී ම එකී විශ්වසනීයත්වය පිළිබිඹුවන අතර එය දෙපාර්තමේන්තු නිලධාරීන් අතර පැවති කණ්ඩායම් හැඟීමෙහි ද ප්‍රතිඵලයක් විය. තවදුරටත් එකී හැඟීම් වර්ධනය කරමින් ඔවුන් අතර සුහදතාවය වර්ධනය කරනු සඳහා බැහැරගත පුහුණු වැඩසටහන් වෙත ද කාර්ය මණ්ඩලය යොමු කිරීමට පියවර ගන්නා ලදී. ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථානය මඟින් මෙහෙයවන ලද කාර්යාලයෙන් බැහැරගත පුහුණු වැඩසටහන් එහි

එක් පියවරක් වේ. කණ්ඩායම් තුනක් යටතේ වර්ගීකරණය කරමින් ආයතනික නිලධාරීන් එකසිය පනහක් පමණ සහභාගී කරවන ලද මෙම බැහැරගත පුහුණු වැඩසටහන් මාලාව හරහා කණ්ඩායම් හැඟීම් වර්ධනය කරමින් අභියෝගයන් වෙත මුහුණ දීමේ ශක්තිය වර්ධනය කරන ආකාරයේ ක්‍රීඩාශීලී ක්‍රියාකාරකම් රාශියක් වෙත නිලධාරීන් යොමු කිරීම සිදු විය. එකිනෙකට වෙනස් විවිධ අත්දැකීම් ලබා දෙන්නා වූ පුහුණු වැඩසටහන් ඔස්සේ ආයතනික ඵලදායීතාවය වර්ධනය කිරීමට මෙම වසර තුළ දී සමත් වූයේ ඒ අයුරිනි.

## 10.2 විදෙස් පුහුණු අවස්ථා කළමනාකරණය

මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් වඩාත් නිවැරදිව නියමිත දිනයේදී ගෙවීමේ සිට පසුගිය වසර ගණනාව ඇතුළත විශ්‍රාමික ප්‍රජාව වෙත අත්පත් කරදීමට හැකි වූ සුවිශේෂී ප්‍රතිලාභ දෙපාර්තමේන්තුව සතු මානව ප්‍රාග්ධනය විශිෂ්ට අයුරින් කළමනාකරණය කිරීමෙහි ප්‍රතිඵලයක් වේ. විවිධ වූ ශක්‍යතාවයන්ගෙන් හෙබි දෙපාර්තමේන්තුව සතු මානව සම්පත ගුණාත්මකභාවයෙන් තවදුරටත් පෝෂණය කරමින් අදාළ ක්ෂේත්‍රයන් පිළිබඳ ඔවුන් සතු නිපුණතාවයන් ඉහළ නැංවීම සඳහා දෙපාර්තමේන්තුව වෙත ලැබෙණු විදෙස් පුහුණු අවස්ථා මානව සම්පත් කළමනාකරණය කිරීමට මෙම වසර තුළදී පියවර ගනු ලැබිණි. 2016 වර්ෂයේ මැයි මස 23 සිට 27 දක්වා මැලේසියාවේ පැවති රාජ්‍ය සේවයේ ව්‍යාපාරික විශිෂ්ටත්වය උදෙසා වන පුහුණු වැඩසටහන සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරියකු සහභාගී විය. වාණිජ අංශයේ විශිෂ්ටතාවය, ලාභ ලැබීම මූලික පරමාර්ථය කර නොගත් රාජ්‍ය ආයතනයක් විසින් උකහා ගත යුතු ආකාරය මෙම තෙදින වැඩමුළුවේ දී විශේෂ අවධානයට ලක් වී තිබුණි. පිලිපීනයේ පැවැත්වුණු ආසියා ශාන්තිකර සමාජ ආරක්ෂණ සතිය නියෝජනය කිරීමට ලැබීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට මෙම වසරේ දී හිමි වූ අනර්ඝ අවස්ථාවක් වේ. ඒ මෙරට විශාල ම සමාජ ආරක්ෂණ වැඩපිළිවෙල ලෙස සැලකෙන විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය මෙහෙයවනු ලබන රාජ්‍ය ආයතනය බැවිණි. 2016 ජූලි මස 22 සිට 31 දක්වා මැලේසියාවේ පැවැත්වුණු සංවර්ධන පරිපාලනය නවීකරණය හා පරිවර්තන වැඩසටහන නියෝජනය කිරීමට ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අවස්ථාව හිමි විය. ඒකීය අනන්‍යතාවයක් සහිත සමාජ ආරක්ෂණ තොරතුරු පද්ධතියක් සඳහා වන අන්‍යෝන්‍ය ප්‍රවේශික අන්තර් රාජ්‍ය ඉගෙනුම් පාඨමාලාව නියෝජනය කිරීමට ලැබීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හිමි වූ සුවිශේෂී අවස්ථාවක් ලෙස සැලකිය හැකි ය. එම සමුළුව සැප්තැම්බර් මස 19 සිට 21 දක්වා පවත්වනු ලැබුවේ කොරියානු රාජ්‍යයේ හිදී ය. සැප්තැම්බර් මස 27 සිට 30 දක්වා පිලිපීනයේ පැවැත් වූ ලෝක සෞඛ්‍ය ආවරණය හමුව සඳහා වන ජාතික සෞඛ්‍ය ආරක්ෂණ හමුවට ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සහභාගී විය. මැලේසියාවේ පැවැත්වුණු පරිපාලන සංවර්ධන නව්‍යකරණ හා

පරිවර්තන වැඩසටහන නියෝජනය කරමින් නිලධාරියකු සහභාගී වූයේ 2016 වසරේ සැප්තැම්බර් මස 23 වන දා සිට ඔක්තෝබර් 02 වන දින දක්වා කාලයේ දී යි. එම මාසයේ ම 05 සිට 09 දක්වා සිංගප්පූරුවේ දී පැවැත්වුණු 2020 නායකයෝ වැඩසටහන ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව නියෝජනය කරන ලදී. ගෝලීය සාර්ව ආර්ථික ප්‍රතිපත්තියේ ගෝලීය ආර්ථික විද්‍යා ප්‍රතිපත්ති සඳහා වන විධායක පුහුණුව 2016 නොවැම්බර් මස 28 වන දා සිට 30 වන දා තෙක් ජපානයේ දී පැවැත්වුණු අතර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සහභාගීත්වය එහි දී ද සිදු විය. ඕස්ට්‍රේලියා රජය විසින් ප්‍රදානය කරනු ලබන වසර 2ක ඕස්ට්‍රේලියා ප්‍රදාන ශිෂ්‍යත්වය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂකවරයෙකු වෙත පිරිනැමීම ද මෙම වසර තුළ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හිමි වූ සුවිශේෂී පුහුණු අවස්ථාවක් ලෙස සැලකිය හැකි ය.

මෙකී පුහුණු අවස්ථා ඔස්සේ ලැබූ දැනුම සහ අත්දැකීම් දෙපාර්තමේන්තුවේ සංවර්ධනය සහ පරිපාලනය සඳහා යොදවමින් අන්තර් ජාතික රාජ්‍ය සේවයේ ගුණාත්මක තත්ත්වයන් ආයතනික ක්‍රියාවලිය සමඟ මුසු කිරීමට ලැබීම සපුරා ගත් සුවිශේෂී ඉලක්කයක් වේ. දෙපාර්තමේන්තුවේ මානව සම්පත් හා බැඳුණු විභවතාවයන් හඳුනාගනිමින් විදෙස් පුහුණු අවස්ථා ඵලදායී ලෙස භාවිත කිරීම තුළ ඵලදායී කාර්යක්ෂම සේවාවක් රාජ්‍ය සේවය උදෙසා ලබාදීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමත් වී තිබේ.

## 10.3 බක්මහ උළෙල

සිංහල හින්දු අලුත් අවුරුදු උදාවත් සමඟ එළැඹෙන සැණකෙළි සමයේදී චාරිත්‍ර වාරිත්‍රවලට මුල් තැන දෙමින් සූර්යය මංගල්‍යය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වාර්ෂිකව උත්කර්ෂවත් ලෙස සංවිධානය කරනු ලබන්නක් වේ. එය සම්ප්‍රදායික ජන ක්‍රීඩාවන්ගෙන් ඔබ්බට යමින් විශ්‍රාමික ප්‍රජාව, රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන කලා ශිල්පීන්, මාධ්‍යවේදීන් දෙපාර්තමේන්තු නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල ඥාතීන් අතර අන්‍යෝන්‍ය සුහදතාවය වර්ධනය කරගැනීමේ උළෙලක් බවට පත් කරගැනීමේ අරමුණින් සංවිධානය කරනු ලබන්නකි.




මූලාශ්‍රය - මාධ්‍ය අංශය

කුඩා දරුවන්ගේ සිට විශ්‍රාමික වැඩිහිටියන් දක්වා විවිධ වයස් කාණ්ඩයන් නියෝජනය කරන පිරිස් වෙත සම්බන්ධ විය හැකි පරිදි සකස් කරන ලද වින්දනාත්මක වැඩසටහන්, තරඟ ඉසව් රාශියකගෙන් හක්මහ උළෙල විචිත්‍රවත් විය. විශේෂයෙන් ජනශ්‍රැතික දැනුම පදනම් කරගනිමින් නිර්මාණය කරන ලද සංස්කෘතික අංග ඇතුළත් කලාපයන් සියලු දෙනාගේ ආකර්ශනයටත් පැසසුමටත් පාත්‍ර විය. පාරම්පරික ජන ක්‍රීඩාවලට ප්‍රමුඛස්ථානයක් දෙමින් නූතන තාක්ෂණික ක්‍රීඩාවන් සඳහා ද ඉඩහසර විවර කළ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු බක් මහ උළෙල යුද හමුදා තූර්ය වාදන කණ්ඩායමේ විචිත්‍රවත් කලා අංගයන්ගෙන් අලංකෘත විය.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමඟ නිරන්තර සම්බන්ධතා පවත්වන බැංකු ජාලය ඇතුළු ආයතන රාශියකගේ අනුග්‍රාහකත්වය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට විශාල ශක්තියක් විය.



මූලාශ්‍රය - මාධ්‍ය අංශය



මූලාශ්‍රය - මාධ්‍ය අංශය



මූලාශ්‍රය - මාධ්‍ය අංශය



මූලාශ්‍රය - මාධ්‍ය අංශය

## 11. ජාතික විශ්‍රාමික දිනය

රාජ්‍ය සේවයේ උන්නතිය වෙනුවෙන් සිය ජීවිතයෙහි දශක තුනකට ආසන්න විශාල කාලයක් කැප කරන ලද විශ්‍රාමික රාජ්‍ය සේවකයාගේ විශිෂ්ට මෙහෙවර උදෙසා ලබා දිය හැකි ඉහළ ම රාජ්‍ය ප්‍රණාමය පිරි නැමීමේ අරමුණින් 2005 වසරේ සිට සෑම වසරක ම ඔක්තෝබර් 08 වන දින ජාතික විශ්‍රාමික දිනය ලෙස නම් කිරීමට යෙදුණි.

විශ්‍රාමික ප්‍රජාව වෙනුවෙන් රාජ්‍යය සතු එකී වගකීම මනා ලෙස අවබෝධ කරගත් රාජ්‍ය ආයතනය ලෙස මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියට කිසිවිටෙක සීමා නොවෙමින්, සෑම විට ම විශ්‍රාමික රාජ්‍ය නිලධාරියා කෙරෙහි සුහදත්වයේ දෑත් දිගු කර "විශ්‍රාමයට සෙනෙහසින්" තේමාව පෙරදැරි කරගනිමින් 2016 ජාතික විශ්‍රාමික දිනය උත්කර්ෂවත් ලෙස සැමරීම සිදු විය.



මූලාශ්‍රය - මාධ්‍ය අංශය

ගරු රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍ය රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමන් ගේ ප්‍රධානත්වයෙන් කැළණිය විශ්‍රාමික නිවාඩු නිකේතනයේදී සමස්ත විශ්‍රාමික ප්‍රජාව නියෝජනය වන පරිදි තෝරාගත් දහසකට ආසන්න විශ්‍රාමික ප්‍රජාව ඇතුළු දේශපාලනාධිකාරියේ නියෝජිතයන්, රාජ්‍ය නිලධාරින්, විද්වතුන් සහ ප්‍රවීණ කලාකරුවන් ගේ සහභාගීත්වයෙන් 2016.10.08 වැනි දින අභිමානවත් අයුරින් සැමරීමට යෙදුණේ ඒ අනුවයි.

ජාතික විශ්‍රාමික දින උළෙලට සමගාමීව විශ්‍රාමික ප්‍රජාව වෙත ප්‍රණාම පුද කරමින් විශ්‍රාම වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ තවදුරටත් කඩිනමින් සහ කාර්යක්ෂමව ලබාදීම සඳහා දෙපාර්තමේන්තුව විසින් දියත් කරන ලද නවීන තොරතුරු තාක්ෂණික ව්‍යාපෘති හඳුන්වා දීම මෙහි දී සිදු විය.

රාජ්‍ය සේවකයන් විශ්‍රාම ගැන්වීමේ දී සම්පූර්ණ කළ යුතු PD3 ආකෘති පත්‍රය මාර්ගගත (Online) ක්‍රමයට යොමු කිරීමේ ක්‍රියාවලිය විශ්‍රාමික ප්‍රජාව වෙත හඳුන්වා දීම, විශ්‍රාමික ප්‍රජාව සඳහා දුම්රිය බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය මාර්ගගත ක්‍රමයට සිදු කිරීම, විශ්‍රාමික ප්‍රජාව වෙත විශේෂ දුරකතන පැකේජයක් හඳුන්වා දීම මෙන් ම විවිධ රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන සමඟ සහයෝගයෙන් විවිධ සහන සේවා රැසක් ලබාදීම මේ උළෙලට සමගාමීව සිදු කරනු ලැබිණි.




මූලාශ්‍රය - මාධ්‍ය අංශය



මූලාශ්‍රය - මාධ්‍ය අංශය

සමාජයීය වශයෙන් මෙන් ම ආර්ථික වශයෙන් සවිබල ගැන්වූ විශ්‍රාමික ප්‍රජාවක් බිහිකර ගැනීම සඳහා පෞද්ගලික අංශයේ දැවැන්ත ව්‍යවසායකයන් සමඟ බද්ධ වී විවිධ වූ ආර්ථික ව්‍යාපෘති දියත් කරනු ලබන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට මෙවර ජාතික විශ්‍රාමික දිනය රාජ්‍ය මුදල් භාවිතයකින් තොරව පූර්ණ වශයෙන් පෞද්ගලික අංශයේ සහයෝගීත්වයෙන් අභිමානවත් ලෙස සැමරීමට හැකිවීමත් පෞද්ගලික අංශයේ ව්‍යවසායකත්වයට විශ්‍රාමික ප්‍රජාව සක්‍රීය මානව සම්පතක් ලෙස හඳුන්වා දීමට හැකිවීමත් විශ්‍රාමික ප්‍රජාව මෙන් ම සමස්ත රාජ්‍ය සේවය ලැබූ සුවිශේෂී ජයග්‍රහණයකි.



මූලාශ්‍රය - මාධ්‍ය අංශය



මූලාශ්‍රය - මාධ්‍ය අංශය

## 12. ඵලදායිතා සංකල්ප ක්‍රියාත්මක කිරීම.

දෙපාර්තමේන්තු පරිසරය ඵලදායී අයුරින් කළමනාකරණය කර මානව සම්පත වෙත ඵලදායිතා සංකල්ප හඳුන්වා දී ඔවුන් ඵලදායී වැඩ පරිසරයකට අනුගත කරමින් ක්‍රියාත්මක වූ එස් පහ සංකල්පය අතික්‍රමණය කරමින් දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලි දියුණු ඵලදායීතා සංකල්ප හා මුසු කර කයිසෙන් සංකල්පය ක්‍රියාත්මක කරමින් සමස්ත දෙපාර්තමේන්තු ක්‍රියාවලිය නව හැරවුම් ලක්ෂයක් වෙත යොමු කිරීමට වසර 2016 තුළ හැකියාව ලැබුණි.

මෙහිදී විශ්‍රාම වැටුප් ලියාපදිංචියේ සිට ගෙවීම් හා විශ්‍රාමිකයාගේ ඇවෑමෙන් කලත්‍රයන් වෙත ගෙවීම ඇතුළු සියලු ක්‍රියාවලි මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදුකරමින් වඩාත් කාර්යක්ෂම ඵලදායී සේවාවක් වෙත පිවිසීමේ ක්‍රියාවලි සංවර්ධනයක් සිදුවිය. මේ සඳහා සියලු මානව සම්පත් ඒකරාශී කර ගනිමින් කණ්ඩායම් හැඟීමෙන් යුතුව පිහිටුවාගත් තත්ත්වකව ඔස්සේ දෙපාර්තමේන්තුවේ ඵලදායීතාවය ඉහළ නැංවීම උදෙසා කුඩා කණ්ඩායම් මඟින් සෑම තරාතිරමක ම නිලධාරීන්ගෙන් යෝජනා ලබාගත් අතර එහිදී එකී යෝජනා නැවත ඔවුන්ගේ ඉලක්ක බවට පත් කරමින් එකී ඉලක්ක සාධනය කර ගැනීම මඟින් ඵලදායිතා සංකල්පය සමඟ සමස්ත මානව සම්පත සජීවී දායක කර ගැනීමට 2016 වසර තුළ හැකියාව ලැබුණි.



මූලාශ්‍රය - මාධ්‍ය අංශය

මෙහිදී හරිත ලොවක් උදෙසා හරිත ඵලදායීතාවය වෙනුවෙන් හරිත ඵලදායීතා කවය විසින් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා අපද්‍රව්‍ය වර්ගීකරණය කරමින් වෙන වෙන ම බහාලුම් සැකසීම මෙන් ම කඩදාසි භාවිතය අවම කරමින් විද්‍යුත් තැපැල, විද්‍යුත් සන්නිවේදන ක්‍රම භාවිතය අභ්‍යන්තර කෙටි පණිවිඩ සේවා ක්‍රියාත්මක කිරීම මෙන් ම හරිත වටපිටාවක් වෙනුවෙන් එළවළු පළතුරු හා විසිතුරු ශාක වගා කිරීම හා නඩත්තුව සඳහා ද යොමු විය.

තවද අක්‍රමවත් ව පැවති ලිපිගොනු ක්‍රමවත් ආකාරයෙන් ගබඩා කිරීම, අධික බලශක්ති පිරිවැය පහත හෙළීම සඳහා බලශක්ති විගණන කණ්ඩායම් ක්‍රියාත්මක වෙමින් අක්‍රමවත් විදුලි පරිභෝජනය සිදුවන අවස්ථා හඳුනාගෙන ඒ අවස්ථා වළක්වා ගැනීමෙන් බලශක්ති නාස්තිය වළක්වාගත හැකි විය.

එමෙන් ම විශ්‍රාමික ප්‍රජාව වෙත වඩාත් ඵලදායී සේවාවක් සැපයීම උදෙසා මාර්ගගත දත්ත පද්ධතියක් මඟින් මාසික වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක විය. මීට අමතරව විදේශගත විශ්‍රාමිකයන්ගේ ජීවිත සහතික ලබාගැනීමේදී එකී සහතික කිරීම් සඳහා තානාපති කාර්යාලයන් වෙත යාමට විශ්‍රාමිකයාට සිදුවන නිසා ඒ සඳහා විශාල කාලයක් හා පිරිවැයක් වැයවන බැවින් ඊට විසඳුමක් ලෙස Skype තාක්ෂණය ඔස්සේ ජීවිත සහතික ලබාගැනීමේ නව ක්‍රමවේදයක් සංවර්ධනය කිරීම මේ වැඩසටහන යටතේ සිදුවිය. මීට අමතරව පළමු පරිච්ඡේදය යටතේ විස්තර වූ විශ්‍රාම වැටුප් මාර්ගගත ලියාපදිංචිය, දුම්රිය ගමන් බලපත්‍ර මාර්ගගත ක්‍රමයට ලබාදීම ආදී සියලු තොරතුරු තාක්ෂණික නව විසඳුම් නිර්මාණය වන්නේද ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කිරීම මඟිනි.



මූලාශ්‍රය - මාධ්‍ය අංශය

දෙපාර්තමේන්තු තත්ත්ව කව මාදම්පේ පිහිටි හේකාබ්බ් පී එල් සී ආයතනය වැනි ඵලදායිතා සංකල්පය සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කරන ආයතන නිරීක්ෂණය කිරීම මඟින් දැනුම උකහා ගැනීම හා ඵලදායිතා සංකල්පය ආයතන අතර හුවමාරු කර ගැනීම ද සිදු විය. ජාතික ජලාපවාහන හා ජල සම්පාදන මණ්ඩලය වැනි ආයතන විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව නිරීක්ෂණය කරමින් ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කිරීම පිළිබඳ අත්දැකීම් ලබා ගැනීම මඟින් මෙසේ දැනුම හුවමාරු කරගනිමින් මෙන් ම ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ පුහුණු වැඩමුළු පහක් ද ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, නිපුණතා සංවර්ධන අරමුදල ආදී ආයතන මඟින් පැවැත්වූ විවිධ පුහුණු වැඩමුළු මඟින් ද දැනුම උකහා ගැනීමට හැකි විය.

මෙකී ඵලදායී ගමන් මග පසසනු වස් 2015-2016 වර්ෂ සඳහා ජාතික ඵලදායිතා සම්මාන ප්‍රථම ස්ථානය දිනාගැනීමට ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අවස්ථාව උදාවිය.



මූලාශ්‍රය - මාධ්‍ය අංශය

## 13. මූල්‍ය සමාලෝචනය

විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් ගේ සමාජ සුරක්ෂණය සැලසීමේ ප්‍රමුඛතම ව්‍යාපෘතිය වන විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සහ මාසික විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම සඳහා රජයේ වාර්ෂික අයවැය මගින් මුදල් ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. මෙම ප්‍රතිපාදන සැලසීමේ දී විශ්‍රාමිකයින් සඳහා එකවර ගෙවන විශ්‍රාම පාරිතෝෂිකය, මාසික විශ්‍රාම වැටුප් ගෙවීම, විශ්‍රාමිකයින් ගේ දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර , ත්‍රිවිධ හමුදා සහ පොලිසියේ මිය ගිය සහ අබාධිත රණවිරුවන් ගේ වැටුප් හා දීමනා ගෙවීම සහ එකී ක්‍රියාවලිය කළමනාකරණය සහ පරිපාලනය සඳහා ප්‍රතිපාදන සලසා ඇත. වාර්ෂිකව මෙලෙස වෙන් කරන ප්‍රතිපාදන රටේ දළ දේශීය නිශ්පාදනයෙන් 1.8% ආසන්න අගයක් වන අතර, එය රටේ සමස්ත ආදායමෙන් 12% ක ආසන්න අගයක් ගනී. විශ්‍රාම වැටුප් සඳහා දරණ වියදම ආර්ථිකමය වශයෙන් රජයට වැය බරක් වුවත්, එමගින් ඍජුව ආර්ථික ප්‍රතිලාභයක් රජයට නොලැබේ. එසේ වුව ද වසර 30 කට අධික කාලයක් තම ශ්‍රමය කැප කරමින් රටේ සංවර්ධනයට උර දුන් රජයේ නිලධාරින් ලෙස සේවය කළ විශ්‍රාමිකයන් ගේ සමාජ සුරක්ෂණය සැලසීම රජයේ වගකීම වන බැවින්, විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම සඳහා රජය මගින් ප්‍රතිපාදන සැලසීම අඛණ්ඩව සිදු කරනු ලබයි.

විශ්‍රාමික ප්‍රජාවගේ උපනතිය සැළකූ විට වාර්ෂික 23,000 කට ආසන්න නව විශ්‍රාමික ප්‍රමාණයක් එකතු වෙමින් , විශ්‍රාමික ගහණයේ අඛණ්ඩ වර්ධනයක් දැකිය හැක. විශ්‍රාමිකයන් මිය යාම මාසිකව 1200 කට අගයක් ගනු ලැබුවත්, එම පිරිසෙන් 700 කට ආසන්න ප්‍රමාණයක් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපට හිමිකම් කියනු ලැබේ. එබැවින් සිවිල් විශ්‍රාමිකයන් මිය ගිය ද , ඔවුන් ගේ වැන්දඹුවන් , අනත්දරුවන් සහ ආබාධිත දරුවන් ට හිමිකම විතැන් වන බැවින්, විශ්‍රාමික ගහණයේ අඛණ්ඩ වැඩිවීමක් මිස අඩු වීමක් බලාපොරොත්තු විය නොහැකි ය.

ප්‍රස්ථාර 13



වගුව 13

| මාසය | මාසික වියදම් (රු.මිලියන) |
|---|---|
| ජනවාරි | 13,051.82 |
| පෙබරවාරි | 13,147.49 |
| මාර්තු | 13,349.96 |
| අප්‍රේල් | 13,325.04 |
| මැයි | 13,189.16 |
| ජුනි | 13,265.66 |
| ජුලි | 13,347.09 |
| අගෝස්තු | 13,426.47 |
| සැප්තැම්බර් | 13,727.98 |
| ඔක්තෝබර් | 13,583.88 |
| නොවැම්බර් | 13,663.87 |
| දෙසැම්බර් | 13,864.23 |
| **එකතුව** | **160,942.65** |

මූලාශ්‍රය - ගිණුම් අංශය

## 13.1 විශ්‍රාමික පාරිතෝෂික ගෙවීම

විශ්‍රාම යන සෑම රජයේ නිලධාරියකු ම ඔහු අවසාන වරට ලබා ගත් වැටුප සහ සේවා කාලය පදනම්ව මාස 24ක විශ්‍රාම වැටුපට සමාන පාරිතෝෂිකයකට හිමිකම් ලබයි. මාසිකව විශ්‍රාම යන 2,000 කට අධික විශ්‍රාමික සංඛ්‍යාවට පාරිතෝෂික ගෙවිම සඳහා රුපියල් මිලියන 1,000 කට ආසන්න මුදලක් වැය වේ. 2013 වසරේ අවසානය දක්වා මෙම මුදල මහ භාණ්ඩාගාරය විසින් අඛණ්ඩව සපයන ලදී. එසේ වුවත්, 2014 වසරේ සිට විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා භාණ්ඩාගාරය සෘජුව මුදල් සැපයුම සිදු නොකරන අතර, ඒ සඳහා රාජ්‍ය බැංකු ( 03) තුන මගින් චක්‍රීය ණය පහසුකම් සලසා එමගින් පාරිතෝෂික ගෙවනු ලබයි. ඒ අනුව 2014 සිට 2016 දෙසැම්බර් මස අවසානය දක්වා පාරිතෝෂික ගෙවීම සඳහා රාජ්‍ය බැංකු (03) තුන මඟින් සමස්ත චක්‍රිය ණය පහසුකම රුපියල් මිලියන 32,322 කි. මෙම ණය මුදල කාලීනව වෙනස් වන පොළි අනුපාතයන් මත ලබා දී ඇත. ණය මුදල පියවීම ණය මුදල නිකුත් කළ දින සිට වර්ෂ 18 ක කාලයක් තුළ සිදු වේ. ණය මුදලේ මාසික වාරික හා ණය පොළී ගෙවීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සලසා දී ඇත. ණය වාරිකය මෙන් දෙගුණයක පොළියක් මාසිකව බැංකුව වෙත ගෙවන අතර, ණය මුදල සහ පොළිය ක්‍රමිකව වැඩි වීමක් දැකිය හැකි ය. ණය මුදලේ වර්ධනය 2015 වසර හා සසඳන කල 36% ආසන්න අගයක් ගනී. 3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය මගින් රාජ්‍ය සේවකයින් ගේ මූලික වැටුපෙහි කරන ලද සංශෝධනයන් සමග ගෙවිය යුතු පාරිතෝෂික මුදල ඉහල යාම මෙම වර්ධනයට හේතු වී ඇත. 2017 දී මෙම වර්ධනය 50% වැඩි අගයක් ගනු ඇත. 2020 වර්ෂය වන විට සමස්ත වැටුප් වැඩිවීම 2016 වර්ෂය හා සසඳන කළ 107% වන බැවින් පාරිතෝෂිත ගෙවීම සඳහා ලබා ගන්නා ණය මුදලේ වර්ධනය 2016 හා සසඳන කල විශාල ප්‍රමාණයකින් වර්ධනය වීමත් සමග ඒ සඳහා අති විශාල මුදලක් ද පොළිය වශයෙන් ගෙවීමට සිදු වනු ඇත.

ප්‍රස්ථාර 14




ප්‍රස්තාරය 15




වගුව 14

| වර්ෂය | මහජන බැංකුව (රු.මිලියන) | ලංකා බැංකුව (රු.මිලියන) | ජාතික ඉතිරි කිරීමේ බැංකුව (රු.මිලියන) | එකතුව |
|---|---|---|---|---|
| 2014 | 5489 | 3769 | 1436 | **10694** |
| 2015 | 4163 | 3701 | 1879 | **9743** |
| 2016 | 5840 | 4740 | 2401 | **12981** |
| **එකතුව** | **15492** | **12210** | **5716** | |

මූලාශ්‍රය - ගිණුම් අංශය

වගුව 15

| | වාරිකය (රු.මිලියන) | පොළිය (රු.මිලියන) |
|---|---|---|
| මහජන බැංකුව | 662 | 1271 |
| ලංකා බැංකුව | 519 | 902 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 234 | 406 |

මූලාශ්‍රය - ගිණුම් අංශය

## 13.2 මාසික විශ්‍රාම වැටුප් ගෙවීම

මාසික විශ්‍රාම වැටුප් ලෙස සාමාන්‍ය රජයේ සේවයෙන් විශ්‍රාම යන නිලධාරින් සඳහා සිවිල්, විශ්‍රාම වැටුප් , ත්‍රිවිධ හමුදා සේවය සඳහා හමුදා විශ්‍රාම වැටුප , වැන්දඹු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අනත්දරු විශ්‍රාම වැටුප, ආබාධිත විශ්‍රාම වැටුප, වන්දි විශ්‍රාම වැටුප, දුබලතා විශ්‍රාම වැටුප, යැපීම් දීමනා පුණ්‍යාධාර දීමනා ආදි වශයෙන් ගෙවනු ලබයි.

2016 වර්ෂයේ අවසානයේ විශ්‍රාමික සංඛ්‍යාව 579,508 වු අතර, වර්ෂය ආරම්භයේ විශ්‍රාමික සංඛ්‍යාව 562,460 ක් විය. 2016 වසර තුළ විශ්‍රාමික ගහණයන්ට එකතු වු නව විශ්‍රාමික සංඛ්‍යාව 21,638 කි. 2016 වසර තුළ මාසික විශ්‍රාමික වැටුප් ගෙවීම සඳහා දරණ ලද වියදම රුපියල් මිලියන 160,942.65 කි. විශ්‍රාමික සංඛ්‍යාව වැඩි වීම මෙන් ම රජයේ නිලධාරින්ගේ මූලික වැටුපේ වැඩිවීම ද මෙයට හේතු වි ඇත.

**ප්‍රස්ථාර 16**




**වගුව 16**

| මාසය | විශ්‍රාමිකයින් සංඛ්‍යාව | මාසික වියදම (රු.මිලියන) |
|---|---|---|
| ජනවාරි | 562,460 | 13,051.82 |
| පෙබරවාරි | 564,040 | 13,147.49 |
| මාර්තු | 565,712 | 13,349.96 |
| අප්‍රේල් | 567,764 | 13,325.04 |
| මැයි | 568,522 | 13,189.16 |
| ජුනි | 569,381 | 13,265.66 |
| ජුලි | 569,899 | 13,347.09 |
| අගෝස්තු | 571,266 | 13,426.47 |
| සැප්තැම්බර් | 573,982 | 13,727.98 |
| ඔක්තෝබර් | 575,954 | 13,583.88 |
| නොවැම්බර් | 577,883 | 13,663.87 |
| දෙසැම්බර් | 579,508 | 13,864.23 |
| එකතුව | | **160,942.65** |

මූලාශ්‍රය - ගිණුම් අංශය

2016 දෙසැම්බර් මස අවසානය වන විට සමස්තයක් වන විශ්‍රාමික ගහණය දිස්ත්‍රික්ක 25 පුරා විසිරී ඇත. එයින් 36.3% බස්නාහිර පළාතේ ද,11.8% මධ්‍යම පළාතේ ද 11.8% දකුණු පළාතේ ද, 11.2% වයඹ පළාතේ ද ,27.9% සෙසු දිස්ත්‍රික්ක පුරා විසිරී ඇත. උතුරු පළාතේ විශ්‍රාමික සංඛ්‍යාව 19,870 ක් ද, නැගෙනහිර පළාතේ විශ්‍රාමික සංඛ්‍යාව 22,168 ක් වන අතර, එය පිළිවෙලින් සමස්ත ගහණයෙන් 3.4% ක් සහ 3.8% වේ. විදේශ විශ්‍රාමික සංඛ්‍යාව 9,812 කි.

මාසික විශ්‍රාම වැටුප් ගෙවීමේ දී රාජ්‍ය හා පෞද්ගලික සමස්ත බැංකු පද්ධතිය ම සම්බන්ධ වන අතර, විශ්‍රාමික ගහණයත් 73.8% ක් රාජ්‍ය බැංකු පද්ධතිය මඟින් විශ්‍රාම වැටුප ලබා ගනිති.

පෞද්ගලික බැංකු මගින් 19% ක් විශ්‍රාම වැටුප් ලබා ගන්නා අතර, තැපැල් කාර්යාල මගින් 7.2 % විශ්‍රාම වැටුප ලබා ගනී.

සමස්ත විශ්‍රාමිකයන් 67.7% එනම් 392,325 ක් සාමාන්‍ය විශ්‍රාමිකයින් වන අතර, 32.3% ක් එනම් 187,183 ක් වැන්දඹු අනත්දරු විශ්‍රාමිකයින් වේ.

සාමාන්‍ය විශ්‍රාමිකයන් තුළ සිවිල් විශ්‍රාමිකයන් සංඛ්‍යාව 323,393 ක් වන අතර, හමුදා විශ්‍රාමිකයින් ගේ සංඛ්‍යාව 68,932 කි. එය පිළිවෙළින් සමස්ත විශ්‍රාමික ගහණයෙන් 55% ක් හා 11% වේ.

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප්ලාභීහු සැලකිය යුතු ප්‍රමාණයක් පහත කාණ්ඩයන් යටතේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ලබති. විශ්‍රාමිකයින් ගෙන් 114,936 ක් වැන්දඹු වැටුප් ලබන අතර, 7,885 ක් වැන්දඹු පුරුෂ වේ. හමුදා වැන්දඹු අනත්දරු පුරුෂ 11,308 කි. අනත්දරු විශ්‍රාම වැටුප අනත්දරුවන් 993 කට ගෙවනු ලැබේ.

## 13.3 ගෙවීම් සාරාංශය

- **විශ්‍රාම වැටුප් ගෙවීම**

ප්‍රස්ථාර 17




ප්‍රස්ථාර 18




වගුව 17

| පළාත | ගෙවූ විශ්‍රාම වැටුප (රු.මිලියන) |
|---|---|
| උතුරු පළාත | 5,629.63 |
| වයඹ පළාත | 18,248.61 |
| බස්නාහිර පළාත | 61,077.57 |
| උතුරු මැද පළාත | 9,186.41 |
| මධ්‍යම පළාත | 20,773.90 |
| සබරගමුව පළාත | 12,934.32 |
| නැගෙනහිර පළාත | 5,970.43 |
| ඌව පළාත | 7,714.42 |
| දකුණු පළාත | 19,407.37 |
| **එකතුව** | **160,942.65** |

මූලාශ්‍රය - ගිණුම් අංශය

වගුව 18

| පළාත | විශ්‍රාමිකයන් සංඛ්‍යාව |
|---|---|
| උතුරු පළාත | 19,870 |
| වයඹ පළාත | 64,700 |
| බස්නාහිර පළාත | 210,282 |
| උතුරු මැද පළාත | 34,294 |
| මධ්‍යම පළාත | 73,980 |
| සබරගමුව පළාත | 45,993 |
| නැගෙනහිර පළාත | 22,168 |
| ඌව පළාත | 29,039 |
| දකුණු පළාත | 69,370 |
| **එකතුව** | **569,696** |

මූලාශ්‍රය - ගිණුම් අංශය

- පාරිතෝෂික ගෙවීම

ප්‍රස්ථාර 19




වගුව 19

| පාරිතෝෂිකය | මුදල (රු.මිලියන) |
|---|---|
| සිවිල් | 8,656.74 |
| සන්නද්ධ සේවා | 4,958.52 |
| ගණන් බැලීම් | 381.08 |
| මරණ | 330.42 |
| වෙනත් | 1,065.75 |
| එකතුව | **15,392.51** |

මූලාශ්‍රය - ගිණුම් අංශය

- අනතුරට ලක්වූ හා මියගිය ආරක්ෂක රණවිරුවන් සඳහා සේවා වන්දි ගෙවීම

ක්‍රියාත්මකයේදී අනතුරට පත්වූ සහ මියගිය ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය නිළධාරීන් හට හෝ ඔවුන්ගේ යැපෙන්නන් හට අවුරුදු 55 දක්වා වැටුප් ගෙවනු ලැබේ.

ප්‍රස්ථාර 20




වගුව 20

| වියදම | සංඛ්‍යාව | රු.මිලියන |
|---|---|---|
| යුධ හමුදා | 34756 | 23,681.70 |
| නාවික හමුදා | 1415 | 1,036.92 |
| ගුවන් හමුදා | 560 | 409.57 |
| පොලීසිය | 2503 | 1,550.90 |
| එකතුව | **39234** | **26,679.09** |

මූලාශ්‍රය - ගිණුම් අංශය

# 14. මූල්‍ය ප්‍රකාශන

වියදම් ශීර්ෂ අංකය: 253

දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

| වාර්ෂික ඇස්තමේන්තුවෙ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3)<br>(1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම්<br>(4-5) |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 1 | <u>පුනරාවර්තන</u><br>මෙහෙයුම් වැඩසටහන | -<br>192,767,975,000 | 7,855,000,000 | 3,407,103,000<br>-3,407,103,000 | 200,622,975,000 | 199,105,429,108 | 1,517,545,892 |
| | උප එකතුව (පුනරාවර්තන) | **192,767,975,000** | **7,855,000,000** | **0** | **200,622,975,000** | **199,105,429,108** | **1,517,545,892** |
| 1 | <u>මූලධන</u><br>මෙහෙයුම් වැඩසටහන | -<br>40,000,000 | 0 | 0 | 40,000,000 | 32,497,557 | 7,502,443 |
| | උප එකතුව (මූලධන) | **40,000,000** | **0** | **0** | **40,000,000** | **32,497,557** | **7,502,443** |
| | මුළු එකතුව | **192,807,975,000** | **7,855,000,000** | **0** | **200,662,975,000** | **199,137,926,665** | **1,525,048,335** |

# ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම්

**ඩී.ජී.එස්.ඒ - 1**

වියදම් ශීර්ෂ අංකය : 253

දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

| ව්‍යාපෘති අංකය / නම, පුද්ගලික පඩිනඩි සහ සියළුම ව්‍යාපෘති සඳහා අනෙකුත් වියදම් | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම් | මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | (4) (5) මුළු වියදම් | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (4-5) |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **01. සාමාන්‍ය පරිපාලනය** | | | | | | |
| පුද්ගල පඩිනඩි | 42,000,000 | 0 | 4,500,000 | 46,500,000 | 45,674,770 | 825,230 |
| අනෙකුත් වියදම් | 35,925,000 | 0 | 2,595,000 | 38,520,000 | 37,465,222 | 1,054,778 |
| උප එකතුව | 77,925,000 | 0 | 7,095,000 | 85,020,000 | 83,139,992 | 1,880,008 |
| **02. විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම** | | | | | | |
| පුද්ගල පඩිනඩි | 424,500,000 | 0 | -4,500,000 | 420,000,000 | 400,318,022 | 19,681,978 |
| අනෙකුත් වියදම් | 192,265,550,000 | 7,855,000,000 | -2,595,000 | 200,117,955,000 | 198,621,971,094 | 1,495,983,906 |
| උප එකතුව | 192,690,050,000 | 7,855,000,000 | -7,095,000 | 200,537,955,000 | 199,022,289,116 | 1,515,665,884 |
| මුළු එකතුව | 192,767,975,000 | 7,855,000,000 | 0 | 200,622,975,000 | 199,105,429,108 | 1,517,545,892 |

# එක් එක් වැඩසටහනක ව්‍යාපෘති අනුව වියදම් මූල්‍යකරණය

**(වැඩසටහනක ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම් හා මූලධන වියදම්වල මූල්‍යකරණය)**

**වියදම් ශීර්ෂ අංකය : 253** **දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

| | මූල්‍යකරණය | ව්‍යාපෘති 1 | | ව්‍යාපෘති 2 | | වැඩසටහනේ එකතුව | |
|---|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 11 | දේශීය අරමුදල් | 103,520,000 | 99,320,491 | 154,704,455,000 | 153,183,606,197 | 154,807,975,000 | 153,282,926,688 |
| 12 | විදේශ ණය | | | | | | |
| 13 | විදේශ ප්‍රදාන | | | | | | |
| 14 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය | | | | | | |
| 15 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ප්‍රදාන | | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | |
| 17 | විදේශ මූල්‍යයන ආශ්‍රිත දේශීය පිරිවැය | | | | | | |
| 21 | විශේෂ නීති සේවා | | | 45,855,000,000 | 45,854,999,977 | 45,855,000,000 | 45,854,999,977 |
| | එකතුව | 103,520,000 | 99,320,491 | 200,559,455,000 | 199,038,606,174 | 200,662,975,000 | 199,137,926,665 |

## <u>ව්‍යාපෘති අනුව මූලධන වියදම්</u> ඩී.ජී.එස්.ඒ - 4

වියදම් ශීර්ෂ අංකය : 253 දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 1 මෙහෙයුම් වැඩසටහන

ව්‍යාපෘති අංකය හා නාමය: 1 සාමාන්‍ය පරිපාලනය හා ආයතන සේවා

| | | | | (1) | (2) | (3) | (4) | (5) |
|---|---|---|---|---|---|---|---|---|
| වැය විෂය අංකය | අයිතම අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම්, පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2) | මුළු වියදම | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (3-4) |
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | <u>පුනරුත්තාපන හා වැඩිදියුණු කිරීම්</u> | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 10,000,000 | 0 | 10,000,000 | 9,226,617 | 773,383 |
| 2002 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 500,000 | 0 | 500,000 | 284,500 | 215,500 |
| 2003 | | 11 | වාහන | 1,000,000 | 0 | 1,000,000 | 523,710 | 476,290 |
| | | | <u>අත්පත් කර ගැනීම්</u> | | | | | |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 1,000,000 | **0** | 1,000,000 | 999,990 | 10 |
| 2103 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 5,000,000 | 0 | 5,000,000 | 4,321,551 | 678,449 |
| | | | <u>මානව සම්පත් සංවර්ධනය</u> | | | | | |
| 2401 | | 11 | කාර්යය මණ්ඩල පුහුණු | 1,000,000 | 0 | 1,000,000 | 824,131 | 175,869 |
| | | | එකතුව | 18,500,000 | 0 | 18,500,000 | 16,180,499 | 2,319,501 |

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

ඩී.ජී.එස්.ඒ - 4

වියදම් ශීර්ෂ අංකය : 253 දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය: 1 මෙහෙයුම් වැඩසටහන

ව්‍යාපෘති අංකය හා නාමය: 2 විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම

| වැය විෂය අංකය | අයිතම අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම්, පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | **පුනරුත්තාපන හා වැඩිදියුණු කිරීම්** | | | | | |
| 2002 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 500,000 | 0 | 500,000 | 346,792 | 153,208 |
| | | | **අත්පත් කර ගැනීම්** | | | | | |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 1,000,000 | 0 | 1,000,000 | 907,868 | 92,132 |
| 2104 | | 11 | ගොඩනැඟිලි හා ඉදිකිරීම් | 4,000,000 | 0 | 4,000,000 | 3,064,233 | 935,767 |
| | | | **මානව සම්පත් සංවර්ධනය** | | | | | |
| 2401 | | 11 | කාර්යය මණ්ඩල පුහුණු | 2,000,000 | 0 | 2,000,000 | 1,744,215 | 255,785 |
| | | | **අනෙකුත් ප්‍රාග්ධන වියදම්** | | | | | |
| 2502 | | 11 | ආයෝජන | 14,000,000 | **0** | 14,000,000 | 10,253,950 | 3,746,050 |
| | | | එකතුව | 21,500,000 | 0 | 21,500,000 | 16,317,058 | 5,182,942 |
| | | | මුළු එකතුව | 40,000,000 | 0 | 40,000,000 | 32,497,557 | 7,502,443 |

# වැඩසටහන් අනුව වියදම් මූල්‍යකරණ සාරාංශය

ඩී.ජී.එස්.ඒ - 5

වියදම් ශීර්ෂ අංකය : 253

දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

| | මූල්‍යකරණය | වැඩසටහන 01 | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය<br>1 | සත්‍ය වියදම<br>2 | ශුද්ධ ප්‍රතිපාදනය<br>3 | සත්‍ය වියදම<br>4 | වියදමේ ප්‍රතිශතය<br>(4÷3)X100 |
| | | රු. | රු. | රු. | රු. | % |
| 11 | දේශීය අරමුදල් | 154,807,975,000 | 153,282,926,688 | 154,807,975,000 | 153,282,926,688 | 99 |
| 12 | විදේශ ණය | | | | | |
| 13 | විදේශ ප්‍රදාන | | | | | |
| 14 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය | | | | | |
| 15 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ප්‍රදාන | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | |
| 17 | විදේශ මූල්‍යයන ආශ්‍රිත දේශීය පිරිවැය | | | | | |
| 21 | විශේෂ නීති සේවා | 45,855,000,000 | 45,854,999,977 | 45,855,000,000 | 45,854,999,977 | 100 |
| | එකතුව | 200,662,975,000 | 199,137,926,665 | 200,662,975,000 | 199,137,926,665 | 99 |

## අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශය - 2016

සටහන (ii)

වියදම් ශීර්ෂ අංකය: 253 දෙපාර්තමේන්තුවේ නම: විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

| අත්තිකාරම් / තැන්පත් ගිණුමේ නම | ගිණුම් අංකය | දෙපාර්තමේන්තු පොත් අනුව | | | | භාණ්ඩාගාර පොත් අනුව 2016/12/31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | 2016/01/01 දිනට ආරම්භක ශේෂය | වර්ෂය තුළ හර කිරීම් | වර්ෂය තුළ බැර කිරීම් | 2016/12/31 දිනට අවසාන ශේෂය | |
| | | රු. | රු. | රු. | රු. | රු. |
| I. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් | 25301 | 104,629,864.97 | 45,774,983.39 | 34,922,309.12 | 115,482,539.24 | 115,487,335.24 |
| II. අනෙකුත් අත්තිකාරම් | | | | | | |
| III විවිධ අත්තිකාරම් | | | | | | |
| IV තැන්පත් | 6000-0000-00-0015-0133-000 | 71,885.16 | 97,547.04 | 25,661.88 | 0.00 | 0.00 |
| | 6000-0000-00-0016-0103-000 | 2,602,097.78 | 2,007,853.90 | 697,200.62 | 1,291,444.50 | 1,291,444.50 |
| | 6000-0000-00-0013-0113-000 | 3,880,596.34 | 7,563,702.64 | 15,738,092.72 | 12,054,986.42 | 12,054,986.42 |
| | 6000-0000-00-0001-0114-000 | 310,000.00 | 0.00 | 100,000.00 | 410,000.00 | 410,000.00 |
| | 6000-0000-00-0018-0113-000 | 0.00 | 295,425.00 | 295,550.00 | 125.00 | 125.00 |
| | 6000-0-0-2-0-160 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |

මු.රෙ.506(2) ප්‍රකාර ඉහත සඳහන් අත්තිකාරම් ගිණුම්වල හා තැන්පත් ගිණුම්වල අවසාන ශේෂය, පුද්ගල ගිණුම්වල අදාළ ලැයිස්තු සමඟ සසඳා, එම සැසඳුම් ප්‍රකාශය විගණකාධිපති වෙත වාර්තා කළ බවට තහවුරු කරමි.

## පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
## 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ආදායම් හා වියදම් ගිණුම

| විස්තරය | මුදල (රු.) | | විස්තරය | මුදල (රු.) | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | | 2015 | 2016 |
| විශ්‍රාම වැටුප් දායකත්වය | 64,428,346.62 | 3,958,703.02 | ආයෝජන පොලී - රුපියල් ණය | 929,000.00 | - |
| ආදායම් බදු | 88,500.00 | - | ආයෝජන පොලී - භාණ්ඩාගාර බැඳුම්කර | 1,385,302.13 | 64,854.88 |
| | | | ප්‍රාග්ධන ලාභාලාභ | 3,053,968.21 | 663,337.45 |
| | | | ඌනතාවය | 59,148,576.28 | 3,230,510.69 |
| | **64,516,846.62** | **3,958,703.02** | | **64,516,846.62** | **3,958,703.02** |

## පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
## 2016.12.31 දිනට ශේෂ පත්‍රය

| විස්තරය | මුදල (රු.) | | විස්තරය | මුදල (රු.) | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | | 2015 | 2016 |
| | | | ආයෝජන - | | |
| සමුච්චිත අරමුදල | 62,128,293.71 | 3,230,510.69 | භාණ්ඩාගාර බැඳුම්කර | 2,914,862.55 | |
| | (59,148,576.28) | (3,230,510.69) | රුපියල් ණය | 0.00 | - |
| | 2,979,717.43 | 0.00 | ලැබිය යුතු ආයෝජන පොලී - | | |
| | | | භාණ්ඩාගාර බැඳුම්කර | 64,854.88 | - |
| ගෙවිය යුතු ආදායම් බදු | 0.00 | 0.00 | රුපියල් ණය | 0.00 | - |
| | **2,979,717.43** | **0.00** | | **2,979,717.43** | **0.00** |

## පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
## 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම

| වියදම් | මුදල (රු:) | | ආදායම් | මුදල (රු:) | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | | 2015 | 2016 |
| ආදායම් බදු | 366,527.50 | | පොළී ලැබීම් : - | | |
| | | | රුපියල් ණය | 3,713,675.00 | |
| විශ්‍රාම වැටුප් දායකත්වය | 241,614,357.09 | 36,509,154.98 | භාණ්ඩාගාර බැඳුම්කර | 17,224,845.74 | 12,169,217.46 |
| | | | ප්‍රාග්ධන ලා/ලාභ ගිණුම | 11,117,805.39 | 3,004,372.28 |
| | | | ඌණතාවය (සමුච්චිත අරමුදලට මාරු කිරීම) | 209,924,558.46 | 21,335,565.24 |
| | **241,980,884.59** | **36,509,154.98** | | **241,980,884.59** | **36,509,154.98** |

## පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
## 2016.12.31 දිනට ශේෂ පත්‍රය

| බැරකම් | මුදල (රු:) | | වත්කම් | මුදල (රු:) | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | | 2015 | 2016 |
| සමුච්චිත අරමුදල | 355,804,630.47 | 145,919,044.06 | ආයෝජන ගිණුම - | | |
| <u>එකතු කලා</u> | | | භාණ්ඩාගාර බැදුම්කර | 142,437,758.04 | 121,777,430.32 |
| අතිරික්තය | (209,924,558.46) | (21,335,565.24) | | | |
| | 145,880,072.01 | 124,583,478.82 | | | |
| | | | ලැබිය යුතු ආයෝජන පොළී - | | |
| | | | භාණ්ඩාගාර බැදුම්කර | 3,442,313.97 | 2,806,048.50 |
| | **145,880,072.01** | **124,583,478.82** | | **145,880,072.01** | **124,583,478.82** |

## ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
## 2016.12.31 අවසන් වර්ෂය සඳහා
## ආදායම් හා වියදම් ගිණුම

| විස්තරය | 2015 ( රු. ) | 2016 ( රු. ) | විස්තරය | 2015 ( රු. ) | 2016 ( රු. ) |
|---|---|---|---|---|---|
| දායක මුදල් ආපසු ගෙවීම | 3,648,944.35 | 2,475,784.17 | වර්ෂයට අදාළ දායක මුදල් | 50,538,400.59 | 61,607,825.40 |
| බදු | 1,948,747.16 | 3,551,158.46 | පොළී ආදායම් | 44,703,789.00 | 47,375,314.46 |
| අතිරික්තය | 89,644,498.08 | 102,956,197.23 | | | |
| | **95,242,189.59** | **108,983,139.86** | | **95,242,189.59** | **108,983,139.86** |

# ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
## 2016.12.31 දිනට ශේෂ පත්‍රය

| | 2015 ( රු. ) | 2016 ( රු. ) | | 2015 ( රු. ) | | 2016 ( රු. ) | |
|---|---|---|---|---|---|---|---|
| සමුච්චිත අරමුදල | 1,163,975,525.52 | 1,248,804,325.14 | ආයෝජන වටිනාකම | | 563,258,907.50 | | 619,278,949.76 |
| | | | **ප්‍රවර්ධන වත්කම්** | | | | |
| | | | ලැබිය යුතු පොළී | 54,643,451.81 | | 38,381,214.34 | |
| **එකතු කලා** | | | ලැබිය යුතු මුදල් | 115,605.40 | | 276,483.99 | |
| අතිරික්තය | 89,644,498.08 | 102,956,197.23 | හා. නි. ලේ. මුදල් ශේෂය | 637,507,644.96 | 692,266,702.17 | 696,478,807.60 | 735,136,505.93 |
| | 1,253,620,023.60 | 1,351,760,522..37 | | | | | |
| **ජංගම බැරකම්** | | | | | | | |
| ගෙවිය යුතු බදු | 1,905,586.07 | 2,654,933.32 | | | | | |
| | **1,255,525,609.67** | **1,354,415,455.69** | | | **1,255,525,609.67** | | **1,354,415,455.69** |

# රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල
## ආදායම් හා වියදම් ගිණුම
## 2016.12.31 න් අවසන් වර්ෂය සඳහා

| | 2016 | | 2015 | |
|---|---|---|---|---|
| **ආදායම** | | | | |
| බදු පෙර පොලී ආදායම | | **5,372,972,437** | | 3,406,535,547 |
| අඩු කළා:- බදු | | **-** | | 38,891 |
| **බදු පසු පොලී ආදායම** | | **5,372,972,437** | | 3,406,496,656 |
| **අඩු කළා:- වියදම්** | | | | |
| විදුලිය | **459,494** | | 472,606 | |
| ජලය | **9,933** | | 31,917 | |
| වැටුප් හා වේතන | **9,451,671** | | 5,434,754 | |
| අතිකාල දීමනා | **313,403** | | | |
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාල වියදම් | **29,050** | | 25,555 | |
| නිදහස් දුම්රිය බලපත්‍ර | **88,071** | | 74,805 | |
| ක්ෂය වීම් | **28,912** | | 33,213 | |
| නිල ඇඳුම් | **-** | | 1,620 | |
| වෙනත් වියදම් | **7,350** | | - | |
| විගණන ගාස්තු | **172,500** | **10,560,384** | 172,500 | 6,246,970 |
| **අතිරික්තය** | | **5,362,412,053** | | 3,400,249,686 |
| එකතු කළා:-පොදු සංචිතයෙන් මාරු කිරීම් | | **38,695,396** | | 17,342,273 |
| **දායකයන්ට විසර්ජනය කලහැකිආදායම** | | **5,401,107,448** | | 3,417,591,959 |
| **පොලී විසර්ජනය** | | | | |
| අනිවාර්ය දායකත්වය | **2,136,134,565** | | 1,395,374,718 | |
| ස්වේච්ඡා දායකත්වය | **3,291,965** | | 2,135,157 | |
| රජයේ දායකත්වය | **3,258,911,625** | **5,398,338,155** | 1,981,386,689 | 3,378,896,564 |
| **විසර්ජනය කිරීමෙන් හා පොදු සංචිතයෙන් මාරු කිරීමෙන් පසු අතිරික්ත පොලී ආදායම** | | **2,769,293** | | 38,695,395 |

# රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

## 2016 දෙසැම්බර් 31 දිනට වන ශේෂ පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| **වත්කම්** | **2016** | | 2015 | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| ලී බඩු | **7,440** | | 8,267 | |
| කාර්යාලීය උපකරණ | **102,921** | | 114,355 | |
| පරිගණක උපාංග | **94,349** | **204,710** | 110,999 | 233,621 |
| ආයෝජන ගිණුම-පිරිවැයට | | **47,485,636,426** | | 41,085,679,146 |
| **ජංගම වත්කම්** | | | | |
| ලැබිය යුතු පොලී | **1,623,191,785** | | 1,293,297,368 | |
| ලැබිය යුතු රජයේ දායක මුදල් | **571,964,015** | | 1,328,057,178 | |
| ගැලපුම් ගිණුම | **27,668,536** | | 2,692,508 | |
| කලින් ගෙවීම් | **141,721** | | | |
| භාන්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමේ ශේෂය | **828,898,299** | **3,051,864,356** | 759,501,089 | 3,383,548,143 |
| **මුළු වත්කම්** | | **50,537,705,492** | | 44,469,460,910 |
| **මූලධන හා බැරකම්** | | | | |
| **සමුච්චිත අරමුදල්** | | | | |
| අනිවාර්යය දායක මුදල් | **19,492,427,748** | | 17,389,588,560 | |
| ස්වේච්ඡා දායක මුදල් | **30,144,795** | | 26,677,186 | |
| රජයේ දායක මුදල් | **30,307,548,483** | **49,830,121,027** | 27,002,612,937 | 44,418,878,683 |
| **සංචිත** | | | | |
| ප්‍රාග්ධන සංචිත | **3,790** | | 3,790 | |
| පොදු සංචිත | **2,769,293** | **2,773,083** | 38,695,396 | 38,699,186 |
| **ජංගම බැරකම්** | | | | |
| උපචිත විගණන ගාස්තු | **1,803,741** | | 1,631,241 | |
| නොගෙවන ලද රජයේ ප්‍රසාද මුදල් | **675,936,899** | | | |
| උපචිත වියදම් | **27,070,742** | **704,811,382** | 10,251,800 | 11,883,041 |
| **මුළු මූලධන සහ බැරකම්** | | **50,537,705,492** | | 44,469,460,910 |